**සැ.යු.**: 2026.09.04 දින පළ වූ 2505 *ගැසට්* පත්‍රයේ IV(අ) වැනි කොටස පළ නොවී ය.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,506 - 2026 සැප්තැම්බර් මස 11 සිකුරාදා - 2026.09.11**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස (II අ) වැනි කොටස - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු … … | - | විභාග, විභාග ප්‍රතිඵල ආදිය … … … … … | - |


**සැ.යු.**: ජලභීතිකා රෝගය තුරන් කිරීමේ සහ සුනඛයන් ලියාපදිංචි කිරීමේ පනත් කෙටුම්පත 2026.09.04 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 ඔක්තෝබර් මස 02 දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 සැප්තැම්බර් මස 18 දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාර දිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ප්‍රසන්න ජයරත්න,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2026 අප්‍රේල් මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


0000 - B 82829 - (2026/09)
E - 01

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. යුද්ධ සේවා අනුග්‍රහය

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත හටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

*සැ. යු. :*"මින්පෙර පළ වූ ගැසට් නිවේදන සියල්ලෙහි ම සඳහන් විභාග අපේක්ෂකයින් සඳහා නීති හා උපදෙස් යන මැයෙන් පළකරනු ලැබූ නීති හා උපදෙස් මාලාව මෙමගින් අවලංගු කරනු ලබන අතර මින් ඉදිරියේ දී බලපවත්වනු ලබන්නේ මෙම ගැසට් පත්‍රයේ පළකරනු ලබන නීති හා උපදෙස් මාලාවයි."

2026 ජූලි මස 22 වැනි දින,
ඒ. කේ. එස්. ඉන්දිකා කුමාරි ලියනගේ,
විභාග කොමසාරිස් ජනරාල්.

අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :

"1968 අංක 25 දරන විභාගපනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාගඅපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. ඵ"

(i)විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii)යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක වක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii)යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය

**වෙළඳ නාවික ලේකම් කාර්යාලය**

වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය යටතේ පවත්වාගෙන යනු ලබන වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් සපුරාලන ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|
| 01. වරාය රාජ්‍ය පාලන නිලධාරී (ඉංජිනේරු) | 01 |
| 02. විභාග පරීක්ෂක (ඉංජිනේරු) | 01 |
| 03. නීති නිලධාරී | 01 |

**වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ විභාග පරීක්ෂක (ඉංජිනේරු), වරාය රාජ්‍ය පාලන නිලධාරී (ඉංජිනේරු) තනතුරු සඳහා බඳවා ගැනීම - 2026**

වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය යටතේ පවත්වාගෙන යනු ලබන වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ විභාග පරීක්ෂක (ඉංජිනේරු) සහ වරාය රාජ්‍ය පාලන නිලධාරී (ඉංජිනේරු) යන තනතුරු සඳහා මෙහි දෙවන වගන්තියේ සඳහන් සුදුසුකම් සපුරාලන ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|
| 01. වරාය රාජ්‍ය පාලන නිලධාරී (ඉංජිනේරු) | 01 |
| 02. විභාග පරීක්ෂක (ඉංජිනේරු) | 01 |

අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය :- 2026.10.12

**01. බඳවාගැනීමේ ක්‍රමය:**

මෙම නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතරින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයා, පුරප්පාඩු තනතුරු සඳහා ස්ථිර පදනමින් බඳවා ගනු ලැබේ. එහිදී යොදා ගනු ලබන රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු දීමේ පටිපාටිය මෙම නිවේදනයේ අංක 05 යටතේ දක්වා ඇත.

**02. අවශ්‍ය සුදුසුකම් :**

**(i) අධ්‍යාපන සුදුසුකම්, පළපුරුද්ද හා වෙනත් සුදුසුකම් :**

| තනතුර | අධ්‍යාපන සුදුසුකම් | පළපුරුද්ද හා වෙනත් සුදුසුකම් |
|---|---|---|
| වරාය රාජ්‍ය පාලන නිලධාරී (ඉංජිනේරු) | ශ්‍රී ලංකාව හෝ එක්සත් රාජධානිය හෝ ඕස්ට්‍රේලියාව හෝ කැනඩාව හෝ චීනය හෝ ඉන්දියාව හෝ පකිස්ථානය හෝ නවසීලන්තය හෝ මලයාසියාව හෝ සිංගප්පූරුව හෝ දකුණු අප්‍රිකාව හෝ අයර්ලන්තය යන රටවල හෝ අදාළ | කිලෝවොට් 3000ට වැඩි ධාරිතාවක් ඇති ප්‍රධාන එන්ජිමක් සතු සාගර තරණයෙහි යෙදෙන වෙළඳ නෞකාවක ප්‍රධාන ඉංජිනේරුවකු වශයෙන් වසර 02 ක අවම පළපුරුද්ද ලබා තිබීම. |
| විභාග පරීක්ෂක (ඉංජිනේරු) | | |

| *තනතුර* | *අධ්‍යාපන සුදුසුකම්* | *පළපුරුද්ද හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|
| | සහතික පිළිගැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව සමග ද්විපාර්ශ්වික ගිවිසුම්වලට එළඹ ඇති රටක රාජ්‍ය නාවික පරිපාලන ආයතනයක් විසින් නිකුත් කරනු ලැබූ ප්‍රධාන ඉංජිනේරු ප්‍රවීණතා සහතිකය ලබා තිබීම. | |

**(ii) කායික සුදුසුකම් :**

සැම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

**(iii) වයස් සීමාව :**

අවුරුදු 30 ට නොඅඩු - අවුරුදු 45 ට නොවැඩි

**(iv) වෙනත් සුදුසුකම් :**

- ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
- අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

*සටහන:-* අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට අයදුම්කරුවන් විසින් ඉහත සියලු සුදුසුකම් සැම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

**03. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි:**

(i) මෙම පත්වීම රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝග හා වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ විභාග පරීක්ෂක (ඉංජිනේරු) සහ වරාය රාජ්‍ය පාලන නිලධාරී (ඉංජිනේරු) යන තනතුරුවලට අදාළ බඳවා ගැනීමේ පරිපාටියට දැනටමත් කර ඇත්තාවූ ද, මතුවට කරනු ලබන්නාවූ ද, සංශෝධනයන්ට හා විධිවිධානයන්ට යටත් වේ.

(ii) අයදුම්කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ ලබා නොදෙන අතර, අයදුම්පත්‍රයේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍යය පත්වීම් ලැබීමට සුදුසුකම් ලබන භාෂා මාධ්‍යය වේ.

**04. වැටුප් පරිමාණය:**
SL 1-2025
රු. 82,150-10 X 2,400-8 X 2,940-17 X 3,900-රු. 1,95,970 - 20 වන පියවර

**05. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරගනු ලැබේ.**

| *අනු. අංකය* | *විෂයය* | *ලකුණු* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| **01** | **අතිරේක අධ්‍යාපන සුදුසුකම් :** | | **30** |
| | I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින්/ ආයතනයකින් ලබා ගත් සමුද්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් සඳහා | 30 | |

| අනු. අංකය | විෂයය | ලකුණු | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | II. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින්/ ආයතනයකින් ලබා ගත් සමුද්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සඳහා | 20 | 30 |
| | III. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින්/ ආයතනයකින් ලබා ගත් සමුද්‍රික ඉංජිනේරු විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව, නාවුක විද්‍යාව හෝ සාමුද්‍රික විද්‍යාව පිළිබඳ උපාධියක් සඳහා | 15 | |
| | (උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබාදෙනු ලැබේ.) | | |
| 02 | **වෘත්තීය සුදුසුකම් :** | | 10 |
| | සමුද්‍රීය සෝදිසි කිරීම, සාමුද්‍රික නීතිය හා රෙගුලාසි, සාමුද්‍රීය පරීක්ෂණ හා විමර්ශන හෝ නාවික කටයුතු ආරක්ෂාව සහ සුරක්ෂිතතාවය පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිතීන් යන ක්ෂේත්‍රයන්ට අදාළව රජයේ පිළිගත් ආයතනයකින් ලබාගත් | | |
| | I. මාස 06ක හෝ ඊට වැඩි පූර්ණ කාලීන හෝ ඊට සමාන අධ්‍යයන කාලයක් සහිත පාඨමාලා | 10 | |
| | II. මාස 03ක් හෝ ඊට වැඩි හා මාස 06ට අඩු පූර්ණ කාලීන හෝ ඊට සමාන අධ්‍යයන කාලයක් සහිත පාඨමාලා | 07 | |
| | III. මාස 03ට අඩු පූර්ණ කාලීන හෝ ඊට සමාන අධ්‍යයන කාලයක් සහිත පාඨමාලා (උපරිම සහතික 02ක් සඳහා ලකුණු ලබා දිය හැක) | 03 | |
| 03 | **අතිරේක පළපුරුද්ද :** | | 30 |
| | I. බඳවා ගැනීමේ සුදුසුකම් යටතේ සඳහන් අවම පළපුරුද්ද ඉක්මවූ<br><br>පළපුරුදු කාලසීමාව වෙනුවෙන්<br>- එක් වසරකට ලකුණු 05 බැගින් උපරිමය ලකුණු 30ක්<br>- මාස 06ට වැඩි හා අවුරුද්දකට අඩු : ලකුණු 02 | | |
| 04 | **ක්ෂේත්‍රය සඳහා දායකත්වය :** | | 10 |
| | ක්ෂේත්‍රයට අදාළව ජාතික හෝ ජාත්‍යන්තරව පිළිගත් ශාස්ත්‍රීය සංග්‍රහයක පළ වූ පත්‍රිකාවක් හෝ පේටන්ට් අයිතිය සහිත නව සොයා ගැනීම් විධිමත්/පිළිගත් අනුමැතියන් හෝ සහතික ඉදිරිපත් කළ යුතු ය. | 10 | |
| 05 | **පරිගණක හැකියාව** | | 15 |
| | සමුද්‍රික ඉංජිනේරු විද්‍යාව, නෞකා යාන්ත්‍රණ, නාවික විද්‍යාව, සාමුද්‍රීය විද්‍යාව හෝ පරිගණක ආශ්‍රිත පුහුණු කිරීම් හා පරීක්ෂණ පැවැත්වීම යන ක්ෂේත්‍රයන්ට අදාළ තොරතුරු තාක්ෂණය / පරිගණක පද්ධති/ පරිගණක යෙදුම් පිළිබඳ රජය පිළිගත් ආයතනයකින් ලබාගත් | | |
| | I. මාස 06ක් හෝ ඊට වැඩි පූර්ණ කාලීන හෝ ඊට සමාන අධ්‍යයන කාලයක් සහිත පාඨමාලා | 15 | |
| | II. මාස 03ක් හෝ ඊට වැඩි හා මාස 06ට අඩු පූර්ණ කාලීන හෝ ඊට සමාන අධ්‍යයන කාලයක් සහිත පාඨමාලා | 10 | |
| | III. මාස 03ට අඩු පූර්ණ කාලීන හෝ ඊට සමාන අධ්‍යයන කාලයක් සහිත පාඨමාලා (උපරිම සහතික 02ක් සඳහා ලකුණු ලබා දිය හැක) | 03 | |
| 06 | **සම්මුඛ පරීක්ෂණයේ දී පෙන්වනු ලබන කුසලතාවය සඳහා** | | 05 |
| | එකතුව | | 100 |

**06. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :-**

I. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

II. සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සහතිකවල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද ඡායා පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

III. සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

a) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත

b) වලංගු විදේශ ගමන් බලපත්‍රය

**07. අයදුම්පත් ඉදිරිපත් කිරීම**

(i) අයදුම්පත් 2026.10.12 වැනි දිනට හෝ ඊට ප්‍රථම පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල්,<br>
වෙළඳ නාවික ලේකම් කාර්යාලය,<br>
අංක 79,<br>
ටෙක්නිකල් හන්දිය,<br>
මරදාන පාර,<br>
කොළඹ 10.

(ii) ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘති පත්‍රයක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට 09 දක්වාත් දෙවැනි පිටුව අංක 10 සිට 15 දක්වාත්, වන ආකාරයෙන් පිළියෙළ කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතු ය.

(iii) අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ "විභාග පරීක්ෂක (ඉංජිනේරු) / වරාය රාජ්‍ය පාලන නිලධාරි (ඉංජිනේරු) තනතුර සඳහා අයදුම් කිරීම" යනුවෙන් සඳහන් කළ යුතු ය.

(iv) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ පාසලක විදුහල්පතිවරයෙකු/ සාමදාන විනිශ්චයකාරවරයෙකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු/ නීතිඥවරයෙකු/ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධරයෙකු හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 ට අනුව, රු. 82,150 /= ක් හෝ ඊට වැඩි මාසික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කළ යුතු ය.

(v) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරින් තම අයදුම්පත්, තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

(vi) මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

**08.** ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති යම් තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව බඳවා ගැනීමට ප්‍රථම අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

**09.** පුරප්පාඩු පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

**ඩබ්ලිව්. ඩබ්ලිව්. එස්. මංගල,**<br>
ලේකම්,<br>
වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය.

2026 අගෝස්තු මස 13 වැනි දින,<br>
වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය .<br>
අංක 19,<br>
චෛත්‍ය පාර,<br>
කොළඹ 01.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ වරාය රාජ්‍ය පාලන නිලධාරි (ඉංජිනේරු)/ විභාග පරීක්ෂක (ඉංජිනේරු) තනතුර සඳහා අයදුම් පත්‍රය***

| | | | |
|---|---|---|---|
| *සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින භාෂා මාධ්‍යය* | | | |

(අදාළ අංකය කොටුව තුළ ලියන්න. සිංහල-1/දෙමළ-2/ඉංග්‍රීසි-3) (කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණයි)

***සටහන :-*** අයදුම් කරන භාෂා මාධ්‍යය වෙනස් කළ නොහැක.

01. අයදුම්කරුගේ නම:

i. මුලකුරු අගට යොදා මුලකුරු සමග නම : ......................................................................................
(උදා- GUNAWARDHANA, H.M.S.K. (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

ii. සම්පූර්ණ නම : ....................................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

iii. සම්පූර්ණ නම : ....................................................................................................................
(සිංහලෙන් / දෙමළෙන්)

02. ලිපිනය හා දුරකථන අංකය:

i. කාර්යාලයීය ලිපිනය : ....................................................................................................................

දුරකථන අංකය : ................................................................

ii. පෞද්ගලික ලිපිනය : ....................................................................................................................

දුරකථන අංකය : ................................................................

ජංගම දුරකථන අංකය : ......................................................

03. උපන් දිනය :

අවුරුද්ද : ................................ මාසය : .................................. දිනය : ...................................

04. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :

අවුරුදු : ................................ මාස : ................................... දින : ...................................

05. ජාතික හැඳුනුම්පත් අංකය : ..................................................................

06. ස්ත්‍රී / පුරුෂ භාවය : ........................................................

07. විවාහක/ අවිවාහක/ වැන්දඹු ද යන වග : ......................................................

08. අධ්‍යාපන සුදුසුකම් -

| සුදුසුකම | සුදුසුකම් ලබාගත් වර්ෂය | විෂය ධාරාව | සාමාර්ථය | ආයතනයේ නම | වෙනත් |
|---|---|---|---|---|---|
| | | | | | |

09. වෘත්තීය සුදුසුකම් -

| සුදුසුකම | සුදුසුකම් ලබාගත් වර්ෂය | විෂය ධාරාව | සාමාර්ථය | ආයතනයේ නම | වෙනත් |
|---|---|---|---|---|---|
| | | | | | |

10. පළපුරුද්ද පිළිබඳ විස්තර -

(a.) ආයතනික පළපුරුද්ද :

| සේවය කළ ආයතනය | තනතුර | එම තනතුරට අදාළ කාර්යයන් සැකෙවින් | සේවා කාලය | වෙනත් |
|---|---|---|---|---|
| | | | | |

(b.) නාවික වෘත්තීය පළපුරුද්ද :

| නෞකාවේ නම | නෞකාවේ ධාරිතාව | නෞකාවේ දරන ලද තනතුර | සේවා කාලය | | වෙනත් |
|---|---|---|---|---|---|
| | | | මාස | දිනය | |
| | | | | | |

11. ක්ෂේත්‍රය පිළිබඳ දායකත්වය -
(ප්‍රකාශන හා නව සොයාගැනීම්)

12. පරිගණක සාක්ෂරතාවය පිළිබඳ ලබා ඇති ප්‍රවීණතාවය
- i. උපාධිය ..................................................................................
- ii. ඩිප්ලෝමාව ..................................................................................
- iii. සහතික පත්‍ර පාඨමාලාව .....................................................................

13. ඔබ යම් චෝදනාවක් සම්බන්ධයෙන් උසාවියේ වරදකරු වී තිබේද? ..........................................

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා තිබෙන තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. එසේම මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් වැරදි හෝ අසත්‍ය ඒවා බවට, බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මාගේ අපේක්ෂකත්වය අවලංගු වන බවට හා බඳවා ගත් පසු අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත් වීමට සිදු වන බවත් මම දනිමි.

..........................................,
අත්සන.

දිනය .........................................

14. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත්කරන ................................. මහතා/ මහත්මිය/ මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවත් ඔහු/ ඇය ............................... වැනි දින මා ඉදිරිපිට දී ඔහුගේ/ ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

නම -
තනතුර -
ලිපිනය -
දිනය -

15. දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ සහතිකය :
(දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවත් සඳහා පමණක් අදාළ වේ.)

මෙම අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ සේවය කරන ..................................................... මහතා/ මහත්මිය/ මෙනවිය දැනට ............................ තනතුරේ සේවය කරන බවත් ඔහුගේ/ ඇයගේ වැඩ සහ හැසිරීම සතුටුදායක බවත්, විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බව හා එසේ කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත් සහතික කරමි. ඔහු/ ඇය මෙම තනතුර සඳහා තෝරාගතහොත් සේවයෙන් නිදහස් කළ හැකිය/ නොහැකිය.

...........................................,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා නිලමුද්‍රාව.

...........................................,
දිනය.

09 - 59/1

---

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ
නීති නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීම - 2026

වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය යටතේ පවතින වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ නීති නිලධාරි තනතුර සඳහා මෙහි දෙවන වගන්තියේ සඳහන් සුදුසුකම් සපුරාලන ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *තනතුර* | *පුරප්පාඩු සංඛ්‍යාව* |
|---|---|
| 01. නීති නිලධාරි | 01 |

අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය :- 2026 ඔක්තෝබර් මස 12 වැනි දින

01. **බඳවා ගැනීමේ ක්‍රමය:**

මෙම නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතරින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයා, පුරප්පාඩු තනතුර සඳහා ස්ථිර පදනමින් බඳවා ගනු ලැබේ. එහි දී යොදා ගනු ලබන රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු දීමේ පටිපාටිය මෙම නිවේදනයේ අංක 05 යටතේ දක්වා ඇත.

02. **අවශ්‍ය සුදුසුකම්:**

(I) **අධ්‍යාපන සුදුසුකම්, පළපුරුද්ද හා වෙනත් සුදුසුකම් :**

| *තනතුර* | *අධ්‍යාපන සුදුසුකම්* | *පළපුරුද්ද හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|
| නීති නිලධාරි | ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම. | ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු වසර තුනකට (03) නොඅඩු සක්‍රීය වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම. |

**කායික සුදුසුකම් :**
සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරෙහි රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

(III) **වයස් සීමාව :**
අවුරුදු 21 ට නොඅඩු - අවුරුදු 45 ට නොවැඩි

(IV) **වෙනත් සුදුසුකම්**
- ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
- අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

***සටහන:-*** අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට අයදුම්කරුවන් විසින් ඉහත සියලු සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

03. **සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි:**

(i) මෙම පත්වීම රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වලටද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝග හා වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ නීති නිලධාරි තනතුරට අදාළ බඳවා ගැනීමේ පරිපාටියට දැනටමත් කර ඇත්තාවූ ද, මතුවට කරනු ලබන්නාවූද, සංශෝධනයන්ට හා විධිවිධානයන්ට යටත් වේ.

(ii) අයදුම්කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ ලබා නොදෙන අතර, අයදුම්පත්‍රයේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍යය පත්වීම් ලැබීමට සුදුසුකම් ලබන භාෂා මාධ්‍යය වේ.

04. **වැටුප් පරිමාණය:**
SL 1-2025
රු. 82,150-10 X 2,400-8 X 2,940-17 X 3,900-රු.1,95,970

05. **ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරගනු ලැබේ**

| *අනු. අංකය* | *ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂ* | *ලකුණු* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| **01** | අතිරේක අධ්‍යාපන සුදුසුකම් | | **25** |
| | I. නීතිය පිළිබඳ පශ්චාත් උපාධිය | 10 | |
| | II. නීතිවේදී උපාධිය | 08 | |
| | III. වෙනත් පශ්චාත් උපාධි | 06 | |
| | IV. වෙනත් උපාධි | 04 | |
| | V. උසස් ඩිප්ලෝමා/ඩිප්ලෝමා/ පාඨමාලා | 02 | |

| අනු. අංකය | ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂ | ලකුණු | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| | *සටහන 01* – iii,iv,v උපරිම පාඨමාලා 02 ක් සඳහා සලකා බැලේ<br>*සටහන 02* – i සිට iv දක්වා සුදුසුකම් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයකින් නිකුත් කළ උපාධි සහතික සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.<br>*සටහන 03* – v සඳහා SLQF 4 හෝ 3 මට්ටමේ සහතිකවලට පමණක් ලකුණු ලබා දෙනු ලැබේ | | |
| **02** | **අතිරේක වෘත්තීය පළපුරුද්ද :**<br><br>මූලික සුදුසුකම් ලබන කාලය හැර අනෙකුත් කාලය සඳහා ලකුණු ලබා දෙනු ලැබේ.<br><br>I. නීතිඥයෙකු වශයෙන් වෘත්තීය පළපුරුද්ද ( මාස 06 කට ලකුණු 01 බැගින් හා වසරකට ලකුණු 02 බැගින් )<br>II. නොතාරිස්වරයෙකු වශයෙන් වෘත්තීය පළපුරුද්ද (මාස 06 කට ලකුණු 0.5 බැගින් හා වසරකට ලකුණු 01 බැගින්)<br>III. නීතිඥයෙකු වශයෙන් ශ්‍රේෂ්ඨාධිකරණ නඩුවලට පෙනී සිටීම<br>IV. නීතිඥයෙකු වශයෙන් අභියාචනාධිකරණ නඩුවලට පෙනී සිටීම<br>V. නීතිඥයෙකු වශයෙන් මහාධිකරණ නඩුවලට පෙනී සිටීම<br>VI. නීතිඥයෙකු වශයෙන් දිසා අධිකරණ නඩුවලට පෙනී සිටීම<br><br>(ඉහත සුදුසුකම් පිළිගත හැකි ලේඛන මගින් සනාථ කළ යුතු ය) | 20<br>10<br>08<br>06<br>04<br>02 | **35** |
| **03** | **භාෂා හැකියාව :**<br><br>1. මාධ්‍ය භාෂාවට අමතරව අනෙක් ජාතික භාෂාවට<br>i. ඩිප්ලෝමා<br>ii. උසස් සහතිකපත්<br>iii. සහතිකපත්<br>iv. උසස් පෙළ<br>v. සාමාන්‍ය පෙළ<br><br>2. ඉංග්‍රීසි භාෂාව<br>i. ඩිප්ලෝමා<br>ii. උසස් සහතිකපත්<br>iii. සහතිකපත්<br>iv. උසස් පෙළ<br>(එක් භාෂාවක උපරිම සුදුසුකමට පමණක් ලකුණු ලබා දෙනු ලැබේ) | <br><br><br>08<br>06<br>04<br>02<br>01<br><br><br>08<br>06<br>04<br>02 | **15** |
| **04** | **තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම :**<br><br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගන්නා විශ්වවිද්‍යාලයක උපාධියක් සඳහා තොරතුරු තාක්ෂණය ප්‍රධාන විෂයක් ලෙස හදාරා තිබීම සඳහා<br><br>රජයේ පිළිගත් ආයතනයක මාස 06 කට නොඅඩු තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා<br><br>රජයේ පිළිගත් ආයතනයක තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා<br>- මාස 03<br>- මාස 01 | 10<br><br>07<br><br><br><br>05<br>03 | **10** |
| **06** | **සම්මුඛ පරීක්ෂණයේ දී පෙන්වනු ලබන කුසලතාවය සඳහා** | | **15** |
| | **එකතුව** | | **100** |

06. **අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :-**

I. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින් ම සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

II. සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සහතිකවල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද ඡායා පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

III. සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

(a). පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත.

(b). වලංගු විදේශ ගමන් බලපත්‍රය.

07. **අයදුම්පත් ඉදිරිපත් කිරීම :**

(i) අයදුම්පත් 2026.10.12 වැනි දිනට හෝ ඊට ප්‍රථම පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල්,<br>
වෙළඳ නාවික ලේකම් කාර්යාලය,<br>
අංක 79,<br>
ටෙක්නිකල් හන්දිය,<br>
මරදාන පාර,<br>
කොළඹ 10.

(ii) ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘති පත්‍රයක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට 09 දක්වාත්, දෙවැනි පිටුව අංක 10 සිට 15 දක්වාත්, වන ආකාරයෙන් පිළියෙල කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතු ය.

(iii) අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ "නීති නිලධාරි තනතුර සඳහා අයදුම් කිරීම" යනුවෙන් සඳහන් කළ යුතු ය.

(iv) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ පාසලක විදුහල්පතිවරයෙකු/ සාමදාන විනිශ්චයකාරවරයෙකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු/ නීතිඥවරයෙකු/ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරීලත් නිලධරයෙකු හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 ට අනුව, රු. 82,150 /= ක් හෝ ඊට වැඩි මාසික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කළ යුතු ය.

(v) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරින් තම අයදුම්පත්, තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතු ය.

(vi) මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

08. ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති යම් තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව බඳවා ගැනීමට ප්‍රථම අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

09. පුරප්පාඩු පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

**ඩබ්ලිව්. ඩබ්ලිව්. එස්. මංගල,**<br>
ලේකම්,<br>
වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය.

2026 අගෝස්තු මස 13 වැනි දින,<br>
වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය .<br>
අංක 19,<br>
චෛත්‍ය පාර,<br>
කොළඹ 01.

ඇමුණුම - 01

**ආදර්ශ අයදුම්පත්‍රය**

වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ නීති නිලධාරි තනතුර සඳහා අයදුම් පත්‍රය

| සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින භාෂා මාධ්‍යය | | | |
|---|---|---|---|

(අදාළ අංකය කොටුව තුළ ලියන්න. සිංහල-1/දෙමළ-2/ඉංග්‍රීසි-3)

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණයි)

---

***සටහන :-*** අයදුම් කරන භාෂා මාධ්‍යය වෙනස් කළ නොහැක.

01. අයදුම්කරුගේ නම:

(i.) මුලකුරු අගට යොදා මුලකුරු සමග නම : ..........................................................................................
(උදා- GUNAWARDHANA, H.M.S.K. (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

(ii.) සම්පූර්ණ නම : ..........................................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

(iii.) සම්පූර්ණ නම : ..........................................................................................................................
(සිංහලෙන් / දෙමළෙන්)

02. ලිපිනය හා දුරකතන අංකය:

(i.) කාර්යාලීය ලිපිනය : ..........................................................................................................
දුරකතන අංකය : ................................................................

(ii.) පෞද්ගලික ලිපිනය : ..........................................................................................................
දුරකතන අංකය : ................................................................
ජංගම දුරකතන අංකය : ......................................................

03. උපන් දිනය :

අවුරුද්ද : ................................. මාසය : ................................... දිනය : ...................................

04. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :

අවුරුදු : ................................. මාස : ................................... දින : ...................................

05. ජාතික හැඳුනුම්පත් අංකය : ...................................................................

06. ස්ත්‍රී / පුරුෂභාවය : .......................................................

07. විවාහක/ අවිවාහක/ වැන්දඹු ද යන වග : ......................................................

*08. අධ්‍යාපන සුදුසුකම් :*

| *සුදුසුකම* | *සුදුසුකම් ලබාගත් වර්ෂය* | *විෂය ධාරාව* | *සාමාර්ථය* | *ආයතනයේ නම* | *වෙනත්* |
|---|---|---|---|---|---|
| | | | | | |

*09. වෘත්තීය සුදුසුකම් :*

| *සුදුසුකම* | *සුදුසුකම් ලබාගත් වර්ෂය* | *විෂය ධාරාව* | *සාමාර්ථය* | *ආයතනයේ නම* | *වෙනත්* |
|---|---|---|---|---|---|
| | | | | | |

***10. පළපුරුද්ද පිළිබඳ විස්තර :***

| *සේවය කළ ආයතනය* | *තනතුර* | *එම තනතුරට අදාළ කාර්යයන් සැකෙවින්* | *සේවා කාලය* | *වෙනත්* |
|---|---|---|---|---|
| | | | | |

11. පරිගණක සාක්ෂරතාවය පිළිබඳ ලබා ඇති ප්‍රවීණතාවය :
   (i.) උපාධිය ...............................................................................
   (ii.) ඩිප්ලෝමාව ...............................................................................
   (iii.) සහතික පත්‍ර පාඨමාලාව .......................................................................

12. ඔබ යම් චෝදනාවක් සම්බන්ධයෙන් උසාවියේ වරදකරු වී තිබේද? ..........................................

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා තිබෙන තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. එසේම මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් වැරදි හෝ අසත්‍ය ඒවා බවට, බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මාගේ අපේක්ෂකත්වය අවලංගු වන බවට හා බඳවා ගත් පසු අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත් වීමට සිදු වන බවත් මම දනිමි.

..........................................,
අත්සන.

දිනය ..........................................

***14. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :***

මෙම අයදුම්පත ඉදිරිපත්කරන .................................. මහතා/ මහත්මිය/ මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවත් ඔහු/ ඇය ................................ වැනි දින මා ඉදිරිපිට දී ඔහුගේ/ ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

නම -
තනතුර -
ලිපිනය -
දිනය -

***15. දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ සහතිකය :***

(දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන් සඳහා පමණක් අදාළ වේ.)

මෙම අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ සේවය කරන ...................................................... මහතා/ මහත්මිය/ මෙනවිය දැනට ............................ තනතුරේ සේවය කරන බවත් ඔහුගේ/ ඇයගේ වැඩ සහ හැසිරීම සතුටුදායක

බවත්, විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බව හා එසේ කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත් සහතික කරමි. ඔහු/ ඇය මෙම තනතුර සඳහා තෝරාගතහොත් සේවයෙන් නිදහස් කළ හැකිය/ නොහැකිය.

..........................................,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා නිලමුද්‍රාව.

..........................................,
දිනය.

09 - 59/2

---

**බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය**

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර (තාක්ෂණික) නිලධර ගණයේ තනතුරු සඳහා බඳවා ගැනීම - 2026

**ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර (තාක්ෂණික) නිලධර ගණයේ** (MN - 3 - 2025) පහත සඳහන් තනතුරු සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද බඳවාගැනීමේ පටිපාටියේ විධිවිධාන අනුව විවෘත පදනම මත බඳවා ගැනීමට කටයුතු කෙරේ. අයදුම්පත් කැඳවන අවසාන දිනට, එනම් 2026.09.30 දිනට පහත 3.0 ඡේදයේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1.1 බඳවාගැනීමට අපේක්ෂිත තනතුරු සහ පුරප්පාඩු සංඛ්‍යාව :

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* |
|---|---|---|
| 01. | භූ විද්‍යා සහකාර | 01 |
| 02. | කාර්මික නිලධාරි (විදුලි) | 01 |

1.2 තනතුරුවල රාජකාරි ස්වභාවය :

| *අනුමත තනතුරු නාමය* | *කාර්යයන්* |
|---|---|
| භූ විද්‍යා සහකාර | භූ විද්‍යා අංශයට අයත් භාණ්ඩ හා නිදර්ශක ලේඛනගතකර පවත්වාගෙන යාම හා එම භාණ්ඩවල ආරක්ෂාව සම්බන්ධයෙන් සහකාර අධ්‍යක්ෂ මානව වංශ විද්‍යා වෙත වගකීම. |
| කාර්මික නිලධාරි (විදුලි) | කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ සහ කෞතුකාගාරවල විදුලි නඩත්තු සඳහා කෞතුකාගාර ප්‍රධානීන්ට සහාය වීම, විදුලි කාර්මික වැඩ අධීක්ෂණය.<br>ශ්‍රවණාගාරයේ මයික්‍රො ෆිල්ම් (Micro film) හා CCTV පද්ධතියේ දෝෂයක් හට ගත් විට ඒවා අලුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම.<br>දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පවරනු ලබන වෙනත් රාජකාරි. |

**2.0 සේවයට බඳවාගැනීමේ ක්‍රමය :**

ලිඛිත පරීක්ෂණයක හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

2.1 3.0 වැනි ඡේදයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කරන ලද අපේක්ෂකයින් පමණක් ලිඛිත පරීක්ෂණය සඳහා කැඳවීමට කටයුතු කරනු ලැබේ.

2.2 කෞතුකාගාර අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරාගනු ලැබේ.

**3.0 සුදුසුකම් :**

3.1 අධ්‍යාපන සුදුසුකම් :

| *තනතුර* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|
| භූ විද්‍යා සහකාර | සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් අධ්‍යයන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.<br>අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ) විභාගය ජීව විද්‍යා විෂය ඇතුළත්ව ජීව විද්‍යා විෂය ධාරාවට අයත් විෂයයන් දෙකකින් එකවර සමත් වී තිබීම (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර). (පැරණි විෂය නිර්දේශයේ විෂයයන් තුනකින් සමත් වී තිබීම.) |
| කාර්මික නිලධාරි (විදුලි) | සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් අධ්‍යයන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය පෙළ ) විභාගය සමත්ව තිබීම.<br>අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ) විභාගය ව්‍යවහාරික ගණිතය, ශුද්ධ ගණිතය, සංයුක්ත ගණිතය, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් සහිතව විද්‍යා /ගණිත විෂය ධාරාවට අයත් විෂයයන් දෙකක් එකවර සමත් වී තිබීම.<br>(පැරණි විෂය නිර්දේශයේ ඉහත සඳහන් විෂයයන් ඇතුළත්ව විෂයයන් තුනකින් එකවර සමත් වී තිබීම.) |

3.2 වෘත්තිය සුදුසුකම් :

| *තනතුර* | *සුදුසුකම්* |
|---|---|
| භූ විද්‍යා සහකාර | මොරටුව විශ්වවිද්‍යාලය මගින් පිරිනමනු ලබන භූ ගර්භ විද්‍යාව හෝ රත්න විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාව. |
| කාර්මික නිලධාරි (විදුලි) | තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි (N.V.Q.) අවම වශයෙන් පස්වන මට්ටමට නොඅඩු විදුලි ඉංජිනේරු විෂය පිළිබඳ නිපුණතාවයක් ලබාගෙන තිබීම. |

3.3 කායික සුදුසුකම් :

සෑම අයදුම්කරුවකුම ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරී ඉටුකිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

3.5 වෙනත් සුදුසුකම් :

I. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.
II. අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.
III. සේවයට බඳවා ගැනීම සඳහා වන ලිඛිත විභාගයට සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු, අදාළ සියළු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

**4.0 වයස :**

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවම වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, උපරිම වයස අවුරුදු 30 ට නොවැඩි විය යුතු ය.

**5.0 සේවයේ අනුයුක්ත කිරීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :**

5.1 මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිත ය. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය. එතෙකුදු වුවත් රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට නිලධාරීන් යටත්විය යුතු ය.

5.2 පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වේ.

5.3 III ශ්‍රේණියට බඳවාගෙන වසර 03 ක් ගතවීමට පෙර පළමු කාර්යක්ෂමතා කඩයිම සමත් විය යුතු ය.

5.4 රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අදාළව හා 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 අනුව රාජ්‍ය භාෂා ප්‍රවීණත්වය නියමිත කාල අනුව සපුරා ගත යුතු ය.

5.5 රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

**6.0 වැටුප් ප්‍රමාණය :**

මෙම තනතුර සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 දරන වැටුප් චක්‍රලේඛයෙහි MN-3-2025 අනුව රු. 52,250 – 10 x 800 - 11 x 1, 190 – 10 x 1320 – 10 x 1350 – රු. 100,040 (මාසික) වැටුප් පරිමාණයක් හිමි වේ. එම චක්‍රලේඛයේ උපලේඛන II හි විධිවිධාන පරිදි පත්වීම ක්‍රියාත්මක වන දින සිට වැටුප් ගෙවනු ලැබේ.

**7.0 බඳවා ගැනීමේ ක්‍රමය :** ලිඛිත විභාගයක් සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් මගින්

විභාග පරිපාටිය: විභාගය විෂයන් දෙකකින් යුත් ලිඛිත පරීක්ෂණයකි. මෙම විභාගය සිංහල,දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වෙන අතර ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| | | *ලැබිය හැකි මුළු ලකුණු ප්‍රමාණය* | *සමත්වීම සඳහා ලැබියයුතු අවම ලකුණු ප්‍රමාණය* | *කාලය* |
|---|---|---|---|---|
| | බුද්ධි පරීක්ෂණය | 100 | 50% | පැය 01 |
| | විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | 100 | 50% | පැය 01 |

7.1 විෂය නිර්දේශය :

1. බුද්ධි පරීක්ෂණය : අපේක්ෂකයාගේ තර්කානුකූලභාවයත්, ඔහුගේ විශ්ලේෂණ හැකියාවත්, තීරණ ගැනීමේ හැකියාවත් පරීක්ෂා කිරීම සඳහා වූ ප්‍රශ්න 40කින් සමන්විත වේ.

11. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය : පොදු සාමාන්‍ය දැනීම ප්‍රශ්න 15ක් සහ එක් එක් තනතුරට අදාළ ක්ෂේත්‍රයන්ගෙන් ප්‍රශ්න 25ක් සහිත බහුවරණ ප්‍රශ්න පත්‍රයකි. විෂයයන්ට අදාළ ක්ෂේත්‍ර පහත පරිදි වේ :-

   1. භූ විද්‍යා සහකාර: භූගෝල විද්‍යාව සහ පාෂාණ විද්‍යාව පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම;

   2. කාර්මික නිලධාරි (විදුලි) : විදුලි ඉංජිනේරු ශිල්පය පිළිබඳ මූලික දැනුම හා උපකරණ සහ අදාළ තාක්ෂණික ක්‍රම පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම.

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර (තාක්ෂණික) නිලධර ගණයේ (MN-3-2025) තනතුරු සඳහා වන සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබාදෙනු නොලැබේ. අධ්‍යාපනික හා ශාරීරික යෝග්‍යතාව සනාථ කිරීම පරීක්ෂා කරනු ලැබේ.

*** සැලකිය යුතුයි :-* සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට සහභාගී වීම පත්වීම පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලැබේ.

**8.0 අයදුම් කිරීමේ ක්‍රමය :**

8.1 මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව සෙ.මී. 21 x 29 (A4) ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් තමන් විසින් ඉල්ලුම්පත්‍රය සකස් කරගත යුතු ය.

8.2 නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8.3 අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ. තැපැලේ දී අස්ථානගත වන අයදුම්පත් සම්බන්ධව කෙරෙන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

8.4 සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම, අයදුම්කරු මෙම තනතුරු සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

8.5 අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහල කෙළවරේ ඔබ ඉල්ලුම්කරන තනතුර අනුව "ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර (තාක්ෂණික) නිලධර ගණයේ ................. තනතුරට බඳවා ගැනීම - 2026" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතු ය.

8.6 අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියකු හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 ශ්‍රේණිගත කිරීම අනුව තෘතීය හෝ ජ්‍යෙෂ්ඨ මට්ටමේ රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

8.7 මෙම පුරප්පාඩු පිරවීම, නොපිරවීම හෝ පුරප්පාඩුවලින් කොටසක් පිරවීම හා අනෙකුත් සියලුම කරුණු පිළිබඳව අවසන් තීරණය ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂ ජනරාල් සතු වන්නේ ය.

**9.0 අයදුම්පත් යොමු කිරීම :**

සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2026.09.30 දින හෝ ඊට පෙර පහත දැක්වෙන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය :-

අධ්‍යක්ෂ ජනරාල්,
ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව,
අංක 53,
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත,
කොළඹ 07.

**10.0 සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම :**

ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවාගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවකට සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වන දිනට සතියකට පෙර ලැබෙන සේ කැඳවීමේ ලිපි නිකුත් කරනු ඇත.

කැඳවීමේ ලිපිය ඉදිරිපත් නොකරන කිසිදු අපේක්ෂකයකුට සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

**11.0 අපේක්ෂකයාගේ අනන්‍යතාවය :**

සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින අවස්ථාවේ දී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සෑහීමට පත්වන අයුරින් අයදුම්කරුවන් තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතු ය. මේ සඳහා පහත සඳහන් ලේඛන පිළිගනු ඇත:-

I. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත;
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය;
III. වලංගු රියදුරු බලපත්‍රය.

**12.0 සාවද්‍ය තොරතුරු සැපයීම සඳහා දඬුවම් :**

යම් අපේක්ෂකයකුට මෙම යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත්, සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමට කලින් හෝ සම්මුඛ පරීක්ෂණය පවත්වන අතරතුරේ දී හෝ සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත.

අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙලිවුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමකින් යටපත් කර ඇත්නම් ඔහු/ඇය සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

**13.0** රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, කලින් කලට රාජ්‍ය සේවය සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ හා ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර (තාක්ෂණික) නිලධර ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියෙහි හා ඊට සිදුකර ඇති සංශෝධනයන් හි කොන්දේසි මෙම තනතුර සඳහා අදාළ වේ.

**14.0** සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

**15.0** මෙම රෙගුලාසිවල සඳහන් කර නොමැති කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් තීරණය කරනු ඇත.

**සනූජා කස්තුරිආරච්චි,**
අධ්‍යක්ෂ ජනරාල්.

2026 අගෝස්තු මස 12 වැනි දින,
ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව.

**ආදර්ශ අයදුම්පත්‍රය**

**ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර (තාක්ෂණික) සේවා ගණයේ**
**............................................... තනතුර සඳහා බඳවා ගැනීම - 2026**

[ ]
**(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි)**

**විභාගයට පෙනී සිටින මාධ්‍යය :**
**සිංහල - 1**
**දෙමළ - 2** [ ]
**ඉංග්‍රීසි - 3**
**(අදාළ අංකය කොටුව තුළ යොදන්න)**

**1.0**

1.1 මුලකුරු සමඟ නම : (මුලකුරු අගට යොදා ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා: PERERA A.B.C
.............................................................................................................................
.............................................................................................................................

1.2 සම්පූර්ණ නම : (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
.............................................................................................................................
.............................................................................................................................

1.3 සම්පූර්ණ නම : (සිංහලෙන් / දෙමළෙන්) ..........................................................................
.............................................................................................................................

1.4 ජාතික හැඳුනුම්පත් අංකය : [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

1.5 උපන්දිනය :

වර්ෂය : [ ][ ][ ][ ] මාසය : [ ][ ] දිනය : [ ][ ]

1.6 ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස :

අවුරුදු : [ ][ ] මාස : [ ][ ] දින : [ ][ ]

1.7 ස්ත්‍රී/ පුරුෂ භාවය : (පුරුෂ - M, ස්ත්‍රී - F) [ ]

1.8 විවාහක / අවිවාහක බව : විවාහක : ☐ අවිවාහක : ☐

(√ ලකුණ යොදන්න)

2.0 ස්ථිර ලිපිනය :

2.1 ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් :..........................................................................................................................................
..........................................................................................................................................

2.2 සිංහලෙන්/ දෙමළෙන් : ..........................................................................................................................................
..........................................................................................................................................

2.3 කැඳවීමේ ලිපිය එවිය යුතු ලිපිනය : ..........................................................................................................................................
..........................................................................................................................................

3.0 ස්ථිර පදිංචියට අයත් :

3.1 පළාත් සභාව : ..........................................................................................................
3.2 දිස්ත්‍රික්කය : ..........................................................................................................

4.0 දුරකතන අංකය :

ස්ථාවර : ☐ ජංගම : ☐

5.0 අධ්‍යාපන සුදුසුකම් :

1. අධ්‍යයන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය පෙළ )

වර්ෂය: ................................................. විභාග අංකය : ...................................

| *සමත් වූ විෂය* | *ලබාගත් සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

2. අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ )

වර්ෂය: ................................................ විභාග අංකය : ...................................

| සමත් වූ විෂය | ලබාගත් සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |
| | |

(අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීමට අදාළ සහතිකපත් වල සහතික කරන ලද ඡායා පිටපත් අයදුම්පත සමඟ එවිය යුතු ය)

6.0 වෘත්තීය සුදුසුකම්:

| හදාරා ඇති පාඨමාලාව | ආයතනය | ලබා ඇති වෘත්තීය මට්ටම | පාඨමාලාව සම්පූර්ණ කළ දිනය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

7.0 ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද ?

(√ ලකුණ යොදන්න)

ඔව් ☐ නැත ☐

7.1 "ඔව්" නම් විස්තර සඳහන් කරන්න : ..............................................................................................................................
..............................................................................................................................................................

8.0 අයදුම්කරුගේ සහතිකය :

(අ) මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි.

(ආ) මා විසින් කරනු ලැබ ඇති මෙම ප්‍රකාශය අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සෙක් වන බව හා පත්වීම ලැබීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව දැන සිටිමි.

(ඇ) තව ද, යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම සම්බන්ධයෙන් ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීති රීති වලට මම යටත්වන බවද ප්‍රකාශ කරමි.

(ඈ) මෙහි සඳහන් කිසිම තොරතුරක් පසුව වෙනස් නොකරමි.

........................................................
අයදුම්කරුගේ අත්සන

දිනය : ............................................

9.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ...................................................... නමැති අය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු / ඇය .................................. දින මා ඉදිරිපිට දී ඉහත 8.0 ඡේදය යටතේ අත්සන් තබන ලද බවත් සහතික කරමි.

............................................................,
සහතික කරන්නාගේ අත්සන.

දිනය : ............................................
සහතික කරන්නාගේ නම : ........................................
තනතුර : .............................................................
ලිපිනය : .............................................................
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

09 - 75/1

---

**බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය**

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - බණ්ඩ 2 සේවා ගණයේ තනතුරු සඳහා බඳවා ගැනීම - 2026

**ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - බණ්ඩ 2 සේවා ගණයේ** (MN - 1 - 2025) පහත සඳහන් තනතුරු සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද බඳවාගැනීමේ පටිපාටියේ විධිවිධාන අනුව විවෘත පදනම මත බඳවා ගැනීමට කටයුතු කෙරේ. අයදුම්පත් කැඳවන අවසාන දිනට, එනම් 2026.09.30 දිනට පහත 3.0 ඡේදයේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1.1 බඳවාගැනීමට අපේක්ෂිත තනතුරු සහ පුරප්පාඩු සංඛ්‍යාව :

| *අනු අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* |
|---|---|---|
| 01. | චර්ම ශිල්පී | 01 |
| 02. | පිළිගැනීමේ නිලධාරී | 02 |
| 03. | ආරක්ෂක කැමරා නිරීක්ෂක | 01 |

1.2 තනතුරුවල රාජකාරී ස්වභාවය :

| *අනුමත තනතුරු නාමය* | *කාර්යයන්* |
|---|---|
| චර්ම ශිල්පී | චර්ම ශිල්පී ඒකකයේ රසායනාගාරය පිළිබඳ පූර්ණ වගකීම දැරීම, රසායනාගාරයේ ඇති පක්ෂි, ක්ෂීරපායී ආදර්ශ ආදියේ භාරකාරිත්වය දැරීම, ක්ෂේත්‍රයට ගොස් එකතු කරනු ලබන ආදර්ශක හා නියැදි ලේඛනගත කිරීම, ඒවා සංරක්ෂණය කිරීම හා සැකසීම, නඩත්තු කිරීම හා ගබඩා කිරීම, ආදර්ශක හා නියැදි ප්‍රදර්ශනය සඳහා කෞතුකාගාරවලට භාරදීම, තනතුරට අදාළ නීතිමය කටයුතු වලදී ඊට සහාය වීම, අධිකරණයෙන් නිරීක්ෂණ ලබා ගැනීම සඳහා යොමු කරන ගජමුතු සහ ඇත්දළ ආදිය පිළිබඳ නිරීක්ෂණ වාර්තා ලබාදීම. |

| *අනුමත තනතුරු නාමය* | *කාර්යයන්* |
|---|---|
| පිළිගැනීමේ නිලධාරි | නරඹන්නන් පිළිගෙන අදාළ ස්ථාන වෙත යොමු කිරීම,විශේෂ අමුත්තන් නිසිලෙස පිළිගැනීම, ඔවුන් අදාළ නිලධාරින් වෙත කැඳවාගෙන යාම හා විශේෂ සමරු අත්සන් ලබා ගැනීම, නරඹන්නන්ට අවශ්‍ය විස්තර පත්‍රිකා, පෝස්ටර් ආදිය සැපයීම, කෞතුකාගාරය පිළිබඳ තොරතුරු ලබා දීම, කෞතුකාගාරයට ලැබෙන දුරකථන ඇමතුම්වලට පිළිතුරු ලබා දීම, අදාළ නිලධාරින් වෙත ඒවා යොමුකිරීම හා පණිවුඩ ලබාගැනීම සහ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පවරනු ලබන අනෙකුත් රාජකාරි. |
| ආරක්ෂක කැමරා නිරීක්ෂක | කෞතුකාගාරයේ පිටත හා ඇතුළත ආරක්ෂක කැමරා පද්ධතිය සතියේ සෑම දිනකම දිවා රාත්‍රී අඛණ්ඩව නියාමනය කිරීම සහ නිරීක්ෂණය කිරීම, දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පවරනු ලබන අනෙකුත් රාජකාරි. |

2.0 සේවයට බඳවාගැනීමේ ක්‍රමය :
ලිඛිත පරීක්ෂණයක් හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගනු ලැබේ.

2.1 3.0 වැනි ඡේදයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කරන ලද අපේක්ෂකයින් පමණක් ලිඛිත පරීක්ෂණය සඳහා කැඳවීමට කටයුතු කරනු ලැබේ.

2.2 කෞතුකාගාර අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරා ගනු ලැබේ.

3.0 සුදුසුකම් :

3.1 අධ්‍යාපන සුදුසුකම් :

| *තනතුර* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|
| චර්ම ශිල්පී | සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් අධ්‍යයන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය පෙළ ) විභාගය සමත්ව තිබීම.<br><br>අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ ) විභාගය ජීව විද්‍යා විෂය ධාරාවෙන් අවම වශයෙන් විෂයයන් දෙකකින් සමත් වී තිබීම (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර). (පැරණි විෂය නිර්දේශයේ විෂයයන් තුනකින් සමත් වී තිබීම.) |
| පිළිගැනීමේ නිලධාරි | සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව , ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් අධ්‍යයන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය පෙළ ) විභාගය සමත්ව තිබීම.<br><br>අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ ) විභාගයේදී ඕනෑම විෂය ධාරාවකින් අවම වශයෙන් විෂයයන් දෙකක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත් වී තිබීම. (පැරණි විෂය නිර්දේශයේ විෂයයන් තුනකින් සමත් වී තිබීම.) |
| ආරක්ෂක කැමරා නිරීක්ෂක | සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් අධ්‍යයන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය පෙළ ) විභාගය සමත්ව තිබීම.<br><br>අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ ) විභාගයේදී ඕනෑම විෂය ධාරාවකින් අවම වශයෙන් විෂයයන් දෙකක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත් වී තිබීම. (පැරණි විෂය නිර්දේශයේ විෂයයන් තුනකින් සමත් වී තිබීම.) |

3.2 වෘත්තිය සුදුසුකම් :

| *තනතුර* | *සුදුසුකම්* |
|---|---|
| චර්ම ශිල්පී | තරුණ සත්ත්වවේදීන්ගේ සංගමය, පාරිසරිකයෝ වැනි සංගමයක සත්ත්ව විද්‍යාවට අදාළ වැඩමුළුවකට සහභාගී වී සහතිකපත්‍රයක් ලබා තිබීම. |
| පිළිගැනීමේ නිලධාරී | රජය පිළිගත් ආයතනයකින් ඉංග්‍රීසි භාෂාව පිළිබඳ මාස 06 කට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා සාර්ථකව නිම කර තිබීම. |
| ආරක්ෂක කැමරා නිරීක්ෂක | රජය පිළිගත් ආයතනයකින් පරිගණක සාක්ෂරතාව පිළිබඳ මාස 06 කට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා සාර්ථකව නිම කර තිබීම. |

3.3 පළපුරුද්ද :

අදාළ ක්ෂේත්‍රයේ වසර 01 ක පළපුරුද්ද.

3.4 කායික සුදුසුකම් :

සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරී ඉටුකිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

3.5 වෙනත් සුදුසුකම් :

I. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
II. අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.
III. සේවයට බඳවා ගැනීම සඳහා වන ලිඛිත විභාගයට සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු, අදාළ සියළු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

**4.0 වයස :**

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවම වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, උපරිම වයස අවුරුදු 30 ට නොවැඩි විය යුතු ය.

**5.0 සේවයේ අනුයුක්ත කිරීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :**

5.1 මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිත ය. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය. එසේකුදු වුවත් රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට නිලධාරීන් යටත්විය යුතු ය.

5.2 පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වේ.

5.3 III ශ්‍රේණියට බඳවාගෙන වසර 03 ක් ගතවීමට පෙර පළමු කාර්යක්ෂමතා කඩඉම සමත් වියයුතු ය.

5.4 රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අදාළව හා 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 අනුව රාජ්‍ය භාෂා ප්‍රවීණත්වය නියමිත කාල අනුව සපුරා ගත යුතු ය.

5.5 රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

*6.0 වැටුප් ප්‍රමාණය :*

මෙම තනතුර සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 දරන වැටුප් චක්‍රලේඛයෙහි MN-1-2025 අනුව රු. 45,230 – 10 x 540 - 11 x 630 – 10 x 890 – 10 x 1,190 – රු. 78,360 (මාසික) වැටුප් පරිමාණයක් හිමි වේ. එම චක්‍රලේඛයේ උපලේඛන II හි විධිවිධාන පරිදි පත්වීම ක්‍රියාත්මක වන දින සිට වැටුප් ගෙවනු ලැබේ.

*7.0 බඳවා ගැනීමේ ක්‍රමය :*

*බඳවා ගැනීමේ ක්‍රමය* : ලිඛිත විභාගයක් සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් මගින්

*විභාග පරිපාටිය:* විභාගය විෂයන් දෙකකින් යුත් ලිඛිත පරීක්ෂණයකි. මෙම විභාගය සිංහල,දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වෙන අතර ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| | | *ලැබිය හැකි මුළු ලකුණු ප්‍රමාණය* | *සමත්වීම සඳහා ලැබියයුතු අවම ලකුණු ප්‍රමාණය* | *කාලය* |
|---|---|---|---|---|
| i. | අභියෝග්‍යතාවය | 100 | 50% | පැය 01 |
| ii. | සාමාන්‍ය දැනීම | 100 | 50% | පැය 01 |

*7.1 විෂයය නිර්දේශය :*

1. අභියෝග්‍යතාවය: අපේක්ෂකයාගේ භාෂා හැකියාව, තර්කන ශක්තිය හා ගණිතමය කුසලතාව පරීක්ෂා කිරීම සඳහා සකස් වූවකි. බහුවරණ හෝ කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න 30කින් සමන්විතය.

11. සාමාන්‍ය දැනීම : රාජකාරී සඳහා අපේක්ෂකයා සතු කුසලතාවයන් හා යෝග්‍යතාවයන් පරීක්ෂා කෙරෙන සමාජ ආර්ථික පසුබිම, දේශීය තොරතුරු, අමාත්‍යාංශ දෙපාර්තමේන්තු වැඩසටහන් හා ක්‍රියාකාරකම් පිළිබඳ ප්‍රශ්න ඇතුළත් බහුවරණ ප්‍රශන පත්‍රයකි.

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 2 **සේවා ගණයේ** (MN-1-2025) තනතුරු සඳහා වන සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබාදෙනු නොලැබේ. එහිදී ලිඛිත විභාගයෙන් සමත් වූ නිලධාරීන් බඳවා ගැනීමට අවශ්‍ය සියළු සුදුසුකම් සපුරා ඇතිද යන්න පමණක් පරීක්ෂා කරනු ලැබේ.

***** සැලකිය යුතුයි :-***

සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට සහභාගී වීම පත්වීම පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලැබේ.

*8.0 අයදුම් කිරීමේ ක්‍රමය :*

8.1 මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව සෙ.මී. 21 x 29 (A4) ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් තමන් විසින් ඉල්ලුම්පත්‍රය සකස් කරගත යුතු ය.

8.2 නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8.3 අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ. තැපෑලේ දී අස්ථානගත වන අයදුම්පත් සම්බන්ධව කෙරෙන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

8.4 සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම, අයදුම්කරු මෙම තනතුරු සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

8.5 අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහල කෙළවරේ ඔබ ඉල්ලුම්කරන තනතුර අනුව "ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 2 සේවා ගණයේ ................. තනතුරට බඳවා ගැනීම - 2026" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතු ය.

8.6 අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු,දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 ශ්‍රේණිගත කිරීම අනුව තෘතීය හෝ ජ්‍යෙෂ්ඨ මට්ටමේ රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

8.7 මෙම පුරප්පාඩු පිරවීම, නොපිරවීම හෝ පුරප්පාඩුවලින් කොටසක් පිරවීම හා අනෙකුත්

සියළුම කරුණු පිළිබඳව අවසන් තීරණය ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂ ජනරාල් සතු වන්නේ ය.

*9.0 අයදුම්පත් යොමු කිරීම :*

සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2026.09.30 දින හෝ ඊට පෙර පහත දැක්වෙන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

අධ්‍යක්ෂ ජනරාල්,
ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව,
අංක 53,
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත,
කොළඹ 07.

**10.0 සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම :**

ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවාගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවකට සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වන දිනට සතියකට පෙර ලැබෙන සේ කැඳවීමේ ලිපි නිකුත් කරනු ඇත.

කැඳවීමේ ලිපිය ඉදිරිපත් නොකරන කිසිදු අපේක්ෂකයෙකුට සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

11.0 අපේක්ෂකයාගේ අනන්‍යතාවය :

සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින අවස්ථාවේ දී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සෑහීමට පත්වන අයුරින් අයදුම්කරුවන් තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතු ය. මේ සඳහා පහත සඳහන් ලේඛන පිළිගනු ඇත.

I. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත,
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය,
III. වලංගු රියදුරු බලපත්‍රය.

**12.0 සාවද්‍ය තොරතුරු සැපයීම සඳහා දඬුවම් :**

යම් අපේක්ෂකයෙකුට මෙම යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත්, සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමට කලින් හෝ සම්මුඛ පරීක්ෂණය පවත්වන අතරතුරේදී හෝ සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත.

අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමකින් යටපත් කර ඇත්නම් ඔහු/ඇය සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

13.0 රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, කලින් කලට රාජ්‍ය සේවය සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ හා ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර **තාක්ෂණික නොවන - බණ්ඩ 2 සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියෙහි හා ඊට සිදුකර ඇති සංශෝධනයන් හි කොන්දේසි මෙම තනතුර සඳහා අදාළ වේ.**

**14.0 සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.**

**15.0 මෙම රෙගුලාසිවල සඳහන් කර නොමැති කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් තීරණය කරනු ඇත.**

**සනූජා කස්තුරිආරච්චි,**
අධ්‍යක්ෂ ජනරාල්.

2026 අගෝස්තු මස 12 වැනි දින,
ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව.

**ආදර්ශ අයදුම්පත්‍රය**

**ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - බණ්ඩ 2 සේවා ගණයේ ........................ ........................ තනතුර සඳහා බඳවා ගැනීම - 2026**

**(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි)**

**1.0**

1.1 මුලකුරු සමඟ නම : (මුලකුරු අගට යොදා ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා: PERERA A.B.C

.....................................................................................................................................

.....................................................................................................................................

1.2 සම්පූර්ණ නම : (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
.......................................................................................................................................................
.......................................................................................................................................................

1.3 සම්පූර්ණ නම : (සිංහලෙන් / දෙමළෙන්) .......................................................................................................
.......................................................................................................................................................

1.4 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |

1.5 උපන් දිනය :

වර්ෂය : | | | | |    මාසය | | |    දිනය | | |

1.6 ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස :

අවුරුදු | | | | |    මාස | | |    දින | | |

1.7 ස්ත්‍රී/ පුරුෂ භාවය : (පුරුෂ - M, ස්ත්‍රී - F) | |

1.8 විවාහක / අවිවාහක බව : විවාහක : | |    අවිවාහක : | |

(√ ලකුණ යොදන්න)

2.0 ස්ථිර ලිපිනය :

2.1 ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් :.......................................................................................................................
.......................................................................................................................................................

2.2 සිංහලෙන්/ දෙමළෙන් : ...............................................................................................................................
.......................................................................................................................................................

2.3 කැඳවීමේ ලිපිය එවිය යුතු ලිපිනය : ............................................................................................................
.......................................................................................................................................................

3.0 ස්ථිර පදිංචියට අයත් :

3.1 පළාත් සභාව : .....................................................................................................................
3.2 දිස්ත්‍රික්කය : .......................................................................................................................

4.0 දුරකතන අංකය :

ස්ථාවර : | |    ජංගම : | |

5.0 *අධ්‍යාපන සුදුසුකම් :*

1. අධ්‍යයන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය පෙළ )

වර්ෂය: .................................................. විභාග අංකය : ....................................

| *සමත් වූ විෂයය* | *ලබාගත් සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

2. අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ )

වර්ෂය: .................................................. විභාග අංකය : ....................................

| *සමත් වූ විෂය* | *ලබාගත් සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |

(අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීමට අදාළ සහතිකපත්වල සහතික කරන ලද ඡායා පිටපත් අයදුම්පත සමඟ එවිය යුතු ය)

6.0 *වෘත්තීය සුදුසුකම්:*

| *හදාරා ඇති පාඨමාලාව* | *ආයතනය* | *ලබා ඇති වෘත්තීය මට්ටම* | *පාඨමාලාව සම්පූර්ණ කළ දිනය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

7.0 *පළපුරුද්ද :*

| *සේවා ස්ථානය* | *තනතුර* | *සේවා කාලය* | |
|---|---|---|---|
| | | *සිට* | *දක්වා* |
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |

8.0 ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද ?
(√ ලකුණ යොදන්න)

ඔව් ☐ නැත ☐

8.1 "ඔව්" නම් විස්තර සඳහන් කරන්න : ..............................................................................................................................
..............................................................................................................................

9.0 *අයදුම්කරුගේ සහතිකය :*

(අ) මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි.

(ආ) මා විසින් කරනු ලැබ ඇති මෙම ප්‍රකාශය අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සෙක් වන බව හා පත්වීම ලැබීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව දැන සිටිමි.

(ඇ) තව ද, යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම සම්බන්ධයෙන් ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට මම යටත්වන බව ද ප්‍රකාශ කරමි.

(ඈ) මෙහි සඳහන් කිසිම තොරතුරක් පසුව වෙනස් නොකරමි.

..........................................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය : ............................................

10.0 *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ..................................................... නමැති අය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු / ඇය .................................. දින මා ඉදිරිපිට දී ඉහත 9.0 ඡේදය යටතේ අත්සන් තබන ලද බවත් සහතික කරමි.

............................................................
සහතික කරන්නාගේ අත්සන

දිනය : ............................................
සහතික කරන්නාගේ නම : ........................................
තනතුර : .............................................................
ලිපිනය : .............................................................
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

09 - 75/2

## බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

### ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික (අර්ධ ශිල්පීය) නිලධර ගණයේ තනතුරු සඳහා බඳවා ගැනීම - 2026

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ **ප්‍රාථමික (අර්ධ ශිල්පීය)** නිලධර ගණයේ (PL - 2 - 2025) පහත සඳහන් තනතුරු සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද බඳවාගැනීමේ පටිපාටියේ විධිවිධාන අනුව විවෘත පදනම මත බඳවා ගැනීමට කටයුතු කෙරේ. අයදුම්පත් කැඳවන අවසාන දිනට, එනම් 2026.09.30 දිනට පහත 3.0 ඡේදයේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1.1 බඳවාගැනීමට අපේක්ෂිත තනතුරු සහ පුරප්පාඩු සංඛ්‍යාව :

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* |
|---|---|---|
| 01. | ලේඛන ප්‍රතිසංස්කාරක | 02 |
| 02. | විදුලි කාර්මික | 01 |
| 03. | වඩු කාර්මික | 01 |

1.2 තනතුරුවල රාජකාරි ස්වභාවය :

| *අනුමත තනතුරු නාමය* | *කාර්යයන්* |
|---|---|
| ලේඛන ප්‍රතිසංස්කාරක | ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ පුස්තකාලයට අයත් මුද්‍රිත පොත්පත් ලේඛන, අත්පිටපත් පුස්තකාල පොත් සහ සියළුම වර්ගයේ කෞතුක භාණ්ඩ සංරක්ෂණය කිරීම, තමන්ට පවරා දෙනු ලබන ඉහත සඳහන් ද්‍රව්‍යන්ගේ භාරකාරීත්වය හා ආරක්ෂාව ගැන වගකීම සහ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පවරනු ලබන වෙනත් රාජකාරි. |
| විදුලි කාර්මික | ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ හා ප්‍රාදේශීය කෞතුකාගාරවල විදුලි සැපයුම් මාර්ගයන් හි දෝෂ හටගත් අවස්ථාවල ඒවා අලුත්වැඩියා කිරීම, ජලනල පද්ධතියේ අලුත්වැඩියාවන් සිදුකිරීම හා නඩත්තු කිරීම, විදුලි ට්‍රාන්ස්පෝමරයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ නිසි පරීක්ෂාවෙන් සිටීම, දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පවරනු ලබන වෙනත් රාජකාරි. |
| වඩු කාර්මික | ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවට අයත් සියළුම ආයතනවල අවශ්‍ය අවස්ථාවන්හිදී දැව භාණ්ඩ සැකසීම, අළුත්වැඩියාව සහ නඩත්තු කටයුතු නිසි පරිදි ඉටු කිරීම, දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පවරනු ලබන වෙනත් රාජකාරි. |

2.0 සේවයට බඳවාගැනීමේ ක්‍රමය :

වෘත්තීය පරීක්ෂණයක හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

2.1 3.0 වැනි ඡේදයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කරන ලද අපේක්ෂකයින් පමණක් වෘත්තීය පරීක්ෂණය සඳහා කැඳවීමට කටයුතු කරනු ලැබේ.

2.2 කෞතුකාගාර අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන වෘත්තීය පරීක්ෂණයේ හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව තෝරාගනු ලැබේ.

3.0 සුදුසුකම් :

3.1 අධ්‍යාපන සුදුසුකම් :

| *තනතුර* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|
| ලේඛන ප්‍රතිසංස්කාරක | අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත් වී තිබීම. |
| විදුලි කාර්මික | |
| වඩු කාර්මික | |

3.2 වෘත්තීය සුදුසුකම් :

| *තනතුර* | *සුදුසුකම්* |
|---|---|
| ලේඛන ප්‍රතිසංස්කාරක | අදාළ තනතුරට නියමිත පරිදි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි (N.V.Q.) අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුණතාවයක් ලබාගෙන තිබීම. |
| විදුලි කාර්මික | |
| වඩු කාර්මික | |

3.3 කායික සුදුසුකම් :

සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරී ඉටුකිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

3.4 වෙනත් සුදුසුකම් :

I. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය
II. අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය
III. සේවයට බඳවා ගැනීම සඳහා වන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු, අදාළ සියළු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

**4.0 වයස :**

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවම වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, උපරිම වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතු ය.

**5.0 සේවයේ අනුයුක්ත කිරීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :**

5.1 මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය. එතෙකුදු වුවත් රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට නිලධාරින් යටත්විය යුතු ය.

5.2 පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වේ.

5.3 III ශ්‍රේණියට බඳවාගෙන වසර 03 ක් ගතවීමට පෙර පළමු කාර්යක්ෂමතා කඩයිම සමත් විය යුතු ය.

5.4 රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අදාළව හා 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 අනුව රාජ්‍ය භාෂා ප්‍රවීණත්වය නියමිත කාල අනුව සපුරා ගත යුතු ය.

5.5 රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

**6.0 වැටුප් ප්‍රමාණය :**

මෙම තනතුර සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 දරන වැටුප් චක්‍රලේඛයෙහි PL-2-2025 අනුව රු. 41,800 – 10 x 490 - 10 x 540 – 10 x 590 – 12 x 630 – රු. 65,560 (මාසික) වැටුප් පරිමාණයක් හිමි වේ. එම චක්‍රලේඛයේ උපලේඛන II හි විධිවිධාන පරිදි පත්වීම ක්‍රියාත්මක වන දින සිට වැටුප් ගෙවනු ලැබේ.

7.0 බඳවා ගැනීමේ ක්‍රමය :

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ **ප්‍රාථමික (අර්ධ ශිල්පීය) නිලධර** ගණයේ (PL-2-2025) තනතුරු සඳහා වන වෘත්තීය පරීක්ෂණයේදී සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී පහත පටිපාටි අනුව ලකුණු ලබාදීම සිදුකරනු ලැබේ.

7.1 වෘත්තීය පරීක්ෂණය :

| *විෂයය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| ක්ෂේත්‍රයට අදාළ දැනුම පරීක්ෂා කිරීම | 100 | 50% |

7.2 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

| *ලකුණු ලබාදෙන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 15 | අදාළ නොවේ |
| 2. අතිරේක පළපුරුද්ද | 60 | |
| 3. ක්ෂේත්‍රයට අදාළව රජය පිළිගත් ආයතනයකින් හදාරා ඇති අමතර පාඨමාලා හා ලබා ඇති පුහුණුවීම් | 20 | |
| 4. සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාවය හා පෞරුෂය සඳහා | 05 | |
| එකතුව | 100 | |

** සැළකිය යුතුයි :

වෘත්තීය පරීක්ෂණයට හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට සහභාගී වීම පත්වීම පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලැබේ.

**8.0 අයදුම් කිරීමේ ක්‍රමය :**

8.1 මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව සෙ.මී. 21 x 29 (A4) ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් තමන් විසින් ඉල්ලුම්පත්‍රය සකස් කරගත යුතු ය.

8.2 නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8.3 අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ. තැපැලේ දී අස්ථානගත වන අයදුම්පත් සම්බන්ධව කෙරෙන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

8.4 සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම, අයදුම්කරු මෙම තනතුරු සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

8.5 අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඔබ ඉල්ලුම්කරන තනතුර අනුව **"ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික (අර්ධ ශිල්පීය) නිලධර ගණයේ ................ තනතුරට බඳවා ගැනීම - 2026"** යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතු ය.

8.6 අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 ශ්‍රේණිගත කිරීම අනුව තෘතීය හෝ ජ්‍යෙෂ්ඨ මට්ටමේ රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

8.7 මෙම පුරප්පාඩු පිරවීම, නොපිරවීම හෝ පුරප්පාඩුවලින් කොටසක් පිරවීම හා අනෙකුත් සියලුම කරුණු පිළිබඳව අවසන් තීරණය ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂ ජනරාල් සතු වන්නේ ය.

**9.0 අයදුම්පත් යොමු කිරීම :**

සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2026.09.30 දින හෝ ඊට පෙර පහත දැක්වෙන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතු ය.

අධ්‍යක්ෂ ජනරාල්,
ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව,
අංක 53,
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත,
කොළඹ 07.

**10.0 වෘත්තීය පරීක්ෂණයට හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම :**

ලැබෙන අයදුම්පත් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් සහිත අපේක්ෂකයන් වෙත වෘත්තීය පරීක්ෂණය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වන දිනට සතියකට පෙර ලැබෙන සේ කැඳවීමේ ලිපි නිකුත් කරනු ඇත.

කැඳවීමේ ලිපිය ඉදිරිපත් නොකරන කිසිදු අපේක්ෂකයෙකුට වෘත්තීය පරීක්ෂණයට හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

**11.0 අපේක්ෂකයාගේ අනන්‍යතාවය :**

වෘත්තීය පරීක්ෂණයට හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින අවස්ථාවේ දී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සෑහීමට පත්වන අයුරින් අයදුම්කරුවන් තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතු ය. මේ සඳහා පහත සඳහන් ලේඛන පිළිගනු ඇත :

I. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත,
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය,
III. වලංගු රියදුරු බලපත්‍රය.

12.0 සාවද්‍ය තොරතුරු සැපයීම සඳහා දඬුවම් :

යම් අපේක්ෂකයෙකුට මෙම වෘත්තීය පරීක්ෂණය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත්, සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමට කලින් හෝ සම්මුඛ පරීක්ෂණය පවත්වන අතරතුරේදී හෝ සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත.

අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙලිවුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමකින් යටපත් කර ඇත්නම් ඔහු/ඇය සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

13.0 රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, කලින් කලට රාජ්‍ය සේවය සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ හා ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික (අර්ධ ශිල්පීය ) නිලධර ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියෙහි හා ඊට සිදුකර ඇති සංශෝධනයන් හි කොන්දේසි මෙම තනතුර සඳහා අදාළ වේ.

14.0 සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

15.0 මෙම රෙගුලාසිවල සඳහන් කර නොමැති කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් තීරණය කරනු ඇත.

**සනුජා කස්තුරිආරච්චි,**
අධ්‍යක්ෂ ජනරාල්,
ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව.

2026 අගෝස්තු මස 12 වැනි දින.

**ආදර්ශ අයදුම්පත්‍රය**

**ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික (අර්ධ ශිල්පීය) නිලධර ගණයේ ............................................ තනතුර සඳහා බඳවා ගැනීම - 2026**

**(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි)**

1.0

1.1 මුලකුරු සමග නම : (මුලකුරු අගට යොදා ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා: PERERA A.B.C

.............................................................................................................................................................

.............................................................................................................................................................

1.2 සම්පූර්ණ නම : (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
..........................................................................................................
..........................................................................................................

1.3 සම්පූර්ණ නම : (සිංහලෙන් / දෙමළෙන්) ..........................................................................................................
..........................................................................................................

1.4 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |

1.5 උපන් දිනය :

වර්ෂය : | | | | |   මාසය : | | |   දිනය : | | |

1.6 ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස :

අවුරුදු : | | |   මාස : | | |   දින : | | |

1.7 ස්ත්‍රී/ පුරුෂ භාවය : (පුරුෂ - M, ස්ත්‍රී - F) [ ]

1.8 විවාහක / අවිවාහක බව : විවාහක : [ ]   අවිවාහක : [ ]

(√ ලකුණ යොදන්න)

2.0 ස්ථිර ලිපිනය :

2.1 ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් :..........................................................................................................
..........................................................................................................

2.2 සිංහලෙන්/ දෙමළෙන් : ..........................................................................................................
..........................................................................................................

2.3 කැඳවීමේ ලිපිය එවිය යුතු ලිපිනය : ..........................................................................................................
..........................................................................................................

3.0 ස්ථිර පදිංචියට අයත් :

3.1 පළාත් සභාව : ..........................................................................................................

3.2 දිස්ත්‍රික්කය : ..........................................................................................................

4.0 දුරකතන අංකය :

ස්ථාවර : [ ]   ජංගම : [ ]

5.0 අධ්‍යාපන සුදුසුකම් :

1. අධ්‍යයන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය පෙළ )

වර්ෂය: .................................................. විභාග අංකය : ....................................

| සමත් වූ විෂය | ලබාගත් සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

වර්ෂය: .................................................. විභාග අංකය : ....................................

| සමත් වූ විෂය | ලබාගත් සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

(අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීමට අදාළ සහතිකපත් වල සහතික කරන ලද ඡායා පිටපත් අයදුම්පත සමග එවිය යුතු ය)

6.0 වෘත්තීය සුදුසුකම්:

| හදාරා ඇති පාඨමාලාව | ආයතනය | ලබා ඇති වෘත්තීය මට්ටම | පාඨමාලාව සම්පූර්ණ කළ දිනය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

7.0 පළපුරුද්ද :

| සේවා ස්ථානය | තනතුර | සේවා කාලය | |
|---|---|---|---|
| | | සිට | දක්වා |
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |

8.0 ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද ?
(√ ලකුණ යොදන්න)

ඔව් [ ] නැත [ ]

8.1 "ඔව්" නම් විස්තර සඳහන් කරන්න : ..........................................................................................................................
..........................................................................................................................................................

9.0 අයදුම්කරුගේ සහතිකය :

(අ) මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි.

(ආ) මා විසින් කරනු ලැබ ඇති මෙම ප්‍රකාශය අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සෙක් වන බව හා පත්වීම ලැබීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව දැන සිටිමි.

(ඇ) තව ද, යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම සම්බන්ධයෙන් ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීති රීති වලට මම යටත්වන බවද ප්‍රකාශ කරමි.

(ඈ) මෙහි සඳහන් කිසිම තොරතුරක් පසුව වෙනස් නොකරමි.

..........................................................
අයදුම්කරුගේ අත්සන

දිනය : .............................................

10.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ...................................................... නමැති අය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු / ඇය ................................... දින මා ඉදිරිපිට දී අත්සන් තබන ලද බවත් සහතික කරමි.

.............................................................
සහතික කරන්නාගේ අත්සන

දිනය : .............................................
සහතික කරන්නාගේ නම : .........................................
තනතුර : ................................................................
ලිපිනය : ...............................................................
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

## ශ්‍රී ලංකා නාවික හමුදාව

ශ්‍රී ලංකා නාවික හමුදාවේ කෙටි කාලීන අධිකාරිය සහ ඉඳුරාම බඳවා ගන්නා නිත්‍ය / ස්වේච්ඡා නිලධාරින්ගේ / නිලධාරිනියන්ගේ පුරප්පාඩු - 2026

ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදාවේ (කෙටි හා දීර්ඝ කාලීන) අධිකාරිය සහ ශ්‍රී ලංකා ස්වේච්ඡා නාවික හමුදාවේ ඉඳුරාම බඳවා ගැනීමේ නිලධාරී/ නිලධාරිනියන්ගේ පුරප්පාඩු පවතී.

2. පහත සඳහන් අංශයන් සඳහා දක්වා ඇති පරිදි අපේක්ෂකයින්/අපේක්ෂිකාවන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

**නිත්‍ය නාවික හමුදාවේ ඉඳුරාම බඳවා ගැනීමේ නිලධාරීන් (කෙටි කාලීන වසර 05 ක් සඳහා සහ දීර්ඝ කාලීන අධිකාරිය)**

(*අ*) විධායක අංශය
(*ආ*) සාගරික ඉංජිනේරු අංශය
(*ඇ*) නැව්බඳ ඉංජිනේරු
(*ඈ*) මෝටර් රථ ඉංජිනේරු අංශය
(*ඉ*) සැපයුම් අංශය
(*ඊ*) විදුලි හා විද්‍යුත් ඉංජිනේරු අංශය
(*උ*) සිවිල් ඉංජිනේරු අංශය
(*ඌ*) වෛද්‍ය අංශය
(*එ*) දන්ත වෛද්‍ය අංශය
(*ඒ*) තොරතුරු තාක්ෂණ අංශය
(*ඔ*) පරිපාලන නිලධාරි සෞඛ්‍ය

ස්වේච්ඡා නාවික හමුදාවේ ඉඳුරාම බඳවා ගැනීමේ නිලධාරින්

(*අ*) විධායක අංශය (පොදු රාජකාරි)
(*ආ*) විධායක අංශය (ඉංග්‍රීසි උපදේශක නිලධාරි)
(*ඇ*) විධායක අංශය (ගිණුම් නිලධාරි)
(*ඈ*) මනෝ උපදේශන නිලධාරි

**3. මූලික අධ්‍යාපන සුදුසුකම් :**

(*අ*) අ.පො.ස (උ.පෙළ) විභාගයේ දී එක්වර විෂයන් තුනක් සමත් වී තිබිය යුතු ය.

(*ආ*) අ.පො.ස (සා.පෙළ) විභාගයේ දී අවස්ථා දෙකකට නොවැඩි වාර ගණනක දී මව් භාෂාව සහ ඉංග්‍රීසි විෂයයන්වලට සම්මාන (C) සාමාර්ථයන් සමඟ ගණිතය විෂය ඇතුළත්ව විෂයයන් 06ක් සමත්ව තිබීම;

*හෝ*

අ.පො.ස (සා.පෙළ) විභාගයේ දී අවස්ථා දෙකකට නොවැඩි වාර ගණනක දී මව් භාෂාව සඳහා සම්මාන (C) සාමාර්ථයක් සමග ගණිතය සහ ඉංග්‍රීසි විෂයයන් ඇතුළත්ව විෂයයන් 06ක් සමත් වී තිබීම හා ඉංග්‍රීසි විෂය සම්බන්ධව ඩිප්ලෝමාවක් ලබා තිබීම.

**4. උසස් අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් :**

**(*අ*) විධායක අංශය (නිත්‍ය නාවික හමුදාව)**

| | | |
|---|---|---|
| **නිලය** | **-** | **උප ලුතිනන් (පිරිමි)** |
| අධ්‍යාපන සුදුසුකම් | - | භෞතීය විද්‍යා, ජෛවීය විද්‍යා හෝ ඉංජිනේරු තාක්ෂණවේදය විෂය ධාරාවක් යටතේ අ.පො.ස (උ.පෙළ) විභාගය සමත්ව තිබීම; |

*හෝ*

නිශ්චිත විෂයධාරාවකට අයත් නොමැතිව අ.පො.ස (උ.පෙළ) විභාගයෙන්භෞතික විද්‍යාව සහ තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණය (ICT) විෂයය ඇතුලුව) සමත්ව තිබිම;

*සහ*

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) මගින් පිළිගත් දේශීය හෝ විදේශීය ආයතනයකින් විද්‍යාවේදී හෝ ඉංජිනේරු තාක්‍ෂණවේදී උපාධියක් ලබා තිබිම.

වයසස - අවුරුදු 30ට අඩු විය යුතු ය.

**(ආ) සාගරික ඉංජිනේරු අංශය (නිත්‍ය නාවික හමුදාව)**

**නිලය - ලුතිනන් (පිරිමි/ කාන්තා)**

අධ්‍යාපන සුදුසුකම් - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) මගින් පිළිගත් දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාලයකින් ලබාගත් (සමුද්‍ර/යාන්ත්‍රික) ඉංජිනේරු විද්‍යාව පිළිබඳ පූර්ණ කාලීන වසර 04 ක BSc ඉංජිනේරු උපාධියක් ලබා තිබිය යුතු ය.

ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ (IESL) පූර්ණ සාමාජිකත්වය/ ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබිය යුතු ය.

ඉංජිනේරු ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 01 ක සේවා පළපුරුද්ද අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

වයසස - අවුරුදු 32ට අඩු විය යුතු ය.

**(ඇ) නැව්බඳ ඉංජිනේරු අංශය (නිත්‍ය නාවික හමුදාව)**

**නිලය - වැඩ බලන උප ලුතිනන් (පිරිමි/ කාන්තා)**

අධ්‍යාපන සුදුසුකම් - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) මගින් පිළිගත් දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාලයකින් ලබාගත් ඉංජිනේරු ක්ෂේත්‍රයට අදාළ සාමාන්‍ය උපාධියක් ලබා තිබිය යුතු ය.

වයසස - අවුරුදු 30ට අඩු විය යුතු ය.

**(ඈ) මෝටර් රථ ඉංජිනේරු අංශය (නිත්‍ය නාවික හමුදාව)**

**නිලය - ලුතිනන් (පිරිමි/ කාන්තා)**

අධ්‍යාපන සුදුසුකම් - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) මගින් පිළිගත් දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාලයකින් ලබාගත් යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ වසර 04 ක BSc ඉංජිනේරු උපාධියක් ලබා තිබිය යුතු ය.

ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ (IESL) පූර්ණ සාමාජිකත්වය/ ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබිය යුතු ය.

ඉංජිනේරු ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 01 ක සේවා පළපුරුද්ද අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

| | | |
|---|---|---|
| වයස | - | අවුරුදු 32 ට අඩු විය යුතු ය. |

**(ඉ) සැපයුම් අංශය (නිත්‍ය නාවික හමුදාව)**

| | | |
|---|---|---|
| **නිලය** | **-** | **උප ලුතිනන් (පිරිමි/ කාන්තා)** |
| අධ්‍යාපන සුදුසුකම් | - | ඉංග්‍රීසි සහ ගණිතය යන විෂයයන්ට සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස (සා.පෙළ) සමත්වීම සහ අ.පො.ස (උ.පෙළ) සමත්ව තිබීම.<br><br>ශ්‍රී ලංකාවේ පිළිගත් (විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමත) විශ්වවිද්‍යාලයකින් ලබාගත් ආර්ථික විද්‍යාව, ව්‍යාපාර පරිපාලනය, රාජ්‍ය පරිපාලනය, ගිණුම්කරණය සහ මූල්‍ය කළමනාකරණය, අලෙවි කළමනාකරණය හෝ වෙනත් වාණිජ/ සැපයුම් හා සේවා සම්බන්ධ උපාධියක් ලබා තිබීම. |
| වයස | - | අවුරුදු 30ට අඩු විය යුතු ය. |

**(ඊ) විදුලි හා විද්‍යුත් ඉංජිනේරු අංශය (නිත්‍ය නාවික හමුදාව)**

| | | |
|---|---|---|
| **නිලය** | **-** | **උප ලුතිනන් (පිරිමි/ කාන්තා)** |
| අධ්‍යාපන සුදුසුකම් | - | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පිළිගත් විශ්වවිද්‍යාලයකින් විදුලි ඉලෙක්ට්‍රොනික/ විදුලි සංදේශ යන විෂයයන් සම්බන්ධයෙන් පූර්ණ කාලීන වසර 04ක ඉංජිනේරු උපාධියක් / වසර 04ක B-Tech උපාධියක් ලබා තිබීම. |
| වයස | - | අවුරුදු 32ට අඩු විය යුතු ය. |
| **නිලය** | **-** | **ලුතිනන් (පිරිමි/ කාන්තා)** |
| අධ්‍යාපන සුදුසුකම් | - | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පිළිගත් විශ්වවිද්‍යාලයකින් විදුලි/ ඉලෙක්ට්‍රොනික/විදුලි සංදේශ යන විෂයයන් සම්බන්ධයෙන් පූර්ණ කාලීන වසර 04ක ඉංජිනේරු උපාධියක් / වසර 04ක B- Tech උපාධියක් ලබා තිබීම.<br><br>ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ සමාජිකත්වය ලබා තිබීම. AMIE (SL)<br><br>රජයේ හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් වසර 03 ක පළපුරුද්ද තිබීම. |
| වයස | - | අවුරුදු 32ට අඩු විය යුතු ය. |

**(උ) සිවිල් ඉංජිනේරු අංශය (නිත්‍ය නාවික හමුදාව)**

| | | |
|---|---|---|
| **නිලය** | **-** | **ලුතිනන් (පිරිමි/ කාන්තා)** |
| අධ්‍යාපන සුදුසුකම් | - | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාලයකින් ලබා ගත් සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයේ පූර්ණ කාලීන වසර හතරක BSc ඉංජිනේරු උපාධියක් ලබා තිබීම.<br><br>ශ්‍රී ලංකා ඉංජිනේරු කවුන්සිලයේ (ECSL) Associate Member හෝ ඊට ඉහළ සාමාජිකත්වයක් ලබා තිබීම.<br><br>ඉංජිනේරු ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 01 ක සේවා පළපුරුද්ද අමතර සුදුසුකමක් ලෙස සැලකේ. |
| වයස | - | අවුරුදු 32 හෝ ඊට අඩු විය යුතු ය. |

**(ඍ) වෛද්‍ය අංශය (නිත්‍ය නාවික හමුදාව)**

| | | |
|---|---|---|
| **නිලය** | **-** | **ශෛල්‍ය වෛද්‍ය ලුතිනන් කොමාණ්ඩර් (පිරිමි/ කාන්තා)** |
| අධ්‍යාපන සුදුසුකම් | - | MS හෝ ඊට සමාන පශ්චාත් උපාධියක් ලබා තිබීම.<br><br>රජයේ පිළිගත් විශ්වවිද්‍යාලයකින් නිර්වින්දන පශ්චාත් උපාධියක් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ. |
| වයස් සීමාව | - | අවුරුදු 45 ට අඩු විය යුතු ය. |
| **නිලය** | **-** | **වෛද්‍ය ලුතිනන් (පිරිමි/ කාන්තා)** |
| අධ්‍යාපන සුදුසුකම් | - | ශ්‍රී ලංකා වෛද්‍ය හෙද සභාවේ ස්ථිර සමාජිකත්වය සමග MBBS හෝ සමාන සුදුසුකමක් ලබා තිබීම. |
| වයස් සීමාව | - | අවුරුදු 35 ට අඩු විය යුතු ය. |

**(එ) දන්ත වෛද්‍ය අංශය (නිත්‍ය නාවික හමුදාව)**

| | | |
|---|---|---|
| **නිලය** | **-** | **මධ්‍ය නිලධාරී (පිරිමි සහ කාන්තා)** |
| අධ්‍යාපන සුදුසුකම් | - | දන්ත වෛද්‍ය පීඨයේ 03 වන සහ 04 වන වර්ෂාධ (Semester) සම්පූර්ණ කර තිබීම හෝ 01 වන දන්ත ශල්‍ය වෛද්‍ය (1’ BDS) විභාගය සමත්ව තිබීම සහ දන්ත ශල්‍ය වෛද්‍ය පාඨමාලාව 03 වන වසර අධ්‍යයන කටයුතු සිදු කරමින් සිටීම. |
| වයස් සීමාව | - | අවුරුදු 30 ට අඩු විය යුතු ය. |
| **නිලය** | **-** | **වැඩ බලන උප ලුතිනන් (පිරිමි/ කාන්තා)** |
| අධ්‍යාපන සුදුසුකම් | - | දන්ත වෛද්‍ය පීඨයේ 05 වන හා 06 වන වර්ෂාර්ධ (Semester) සම්පූර්ණ කර තිබීම හෝ 02 වන දන්ත ශල්‍ය වෛද්‍ය (2nd BDS) විභාගය සමත්ව තිබීම සහ දන්ත ශල්‍ය වෛද්‍ය පාඨමාලාව 04 වන වසර අධ්‍යයන කටයුතු සිදුකරමින් සිටීම. |
| වයස් සීමාව | - | අවුරුදු 30 ට අඩු විය යුතු ය. |
| **නිලය** | **-** | **උප ලුතිනන් (පිරිමි/ කාන්තා)** |
| අධ්‍යාපන සුදුසුකම් | - | දන්ත වෛද්‍ය පීඨයේ 07 වන හා 08 වන වර්ෂාර්ධ (Semester) සම්පූර්ණ කර තිබීම හෝ අවසාන දන්ත ශල්‍ය වෛද්‍ය (Final BDS) විභාගය පළමු කොටස සමත්වී තිබීම සහ දන්ත ශල්‍ය වෛද්‍ය පාඨමාලාව අවසන් වසර අධ්‍යයන කටයුතු සිදුකරමින් සිටීම. |
| වයස් සීමාව | - | අවුරුදු 32 ට අඩු විය යුතු ය. |
| **නිලය** | **-** | **වෛද්‍ය ලුතිනන් (පිරිමි/ කාන්තා)** |
| අධ්‍යාපන සුදුසුකම් | - | දන්ත ශල්‍ය වෛද්‍ය උපාධිය (BDS) හෝ ඊට සමාන සුදුසුකමක් සමග ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ (SLMC) නිත්‍ය ලියාපදිංචිය ලබා තිබීම. |
| වයස් සීමාව | - | අවුරුදු 35 ට අඩු විය යුතු ය. |

**(ඒ.) තොරතුරු තාක්‍ෂණ අංශය (නිත්‍ය නාවික හමුදාව)**

**නිලය - වැඩ බලන උප ලුතිනන් (පිරිමි/ කාන්තා)**

අධ්‍යාපන සුදුසුකම් - අ.පො.ස (සා.පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය යන විෂයන්ට සම්මාන සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත් වී තිබීම සහ අ.පො.ස (උ.පෙළ) විභාගය සමත් වී තිබීම;

*සහ*

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් අනුමත රජයේ විශ්වවිද්‍යාලයකින් හෝ ආයතනයකින් වසර 03ක උපාධියක් හදාරා තිබීම;

*සහ*

අන්තර්ජාතිකව පිළිගත් Red hat හෝ Sun Solaris හෝ Ethical Hacker වැනි සහතිකපත්ලාභියකු වීම.

වයස - අවුරුදු 32ට අඩු විය යුතු ය.

**නිලය - උප ලුතිනන් (පිරිමි/ කාන්තා)**

අධ්‍යාපන සුදුසුකම් - අ.පො.ස (සා.පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය යන විෂයන්ට සම්මාන සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත් වී තිබීම සහ අ.පො.ස (උ.පෙළ) විභාගය සමත් වී තිබීම;

*සහ*

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් අනුමත රජයේ විශ්වවිද්‍යාලයකින් හෝ ආයතනයකින් තොරතුරු තාක්‍ෂණය හෝ පරිගණක විද්‍යාව හෝ පරිගණක විෂයයන්ට අදාළ වසර 03 ක උපාධියක් හදාරා තිබීම;

*සහ*

පිළිගත් ආයතනයක තොරතුරු තාක්‍ෂණ විෂය ආශ්‍රිත අවම වසරක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

වයස - අවුරුදු 32ට අඩු විය යුතු ය.

**නිලය - ලුතිනන් (පිරිමි/ කාන්තා)**

අධ්‍යාපන සුදුසුකම් - අ.පො.ස (සා.පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය යන විෂයන්ට සම්මාන සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත් වී තිබීම සහ අ.පො.ස (උ.පෙළ) විභාගය සමත් වී තිබීම;

*සහ*

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් අනුමත රජයේ විශ්වවිද්‍යාලයකින් හෝ ආයතනයකින් තොරතුරු තාක්‍ෂණ, පරිගණක විද්‍යාව හෝ පරිගණක විෂය ආශ්‍රිත විශේෂ උපාධියක් (වසර 04ක) හෝ තොරතුරු තාක්‍ෂණ ඉංජිනේරු උපාධියක් (වසර 04ක) ලබා තිබීම;

*සහ*

පිළිගත් ආයතනයක තොරතුරු තාක්‍ෂණ විෂය ආශ්‍රිතව අවම වසරක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

| | | |
|---|---|---|
| වයස | - | අවුරුදු 32ට අඩු විය යුතු ය |

**(ඔ) පරිපාලන නිලධාරි සෞඛ්‍ය (නිත්‍ය නාවික හමුදාව)**

| | | |
|---|---|---|
| **නිලය** | **-** | **වැඩ බලන උප ලුතිනන් (පිරිමි/ කාන්තා)** |
| අධ්‍යාපන සුදුසුකම් | - | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් අනුමත විශ්වවිද්‍යාලයක් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් අනුමත වෙනත් ආයතනයක් මගින් හෙද හෝ පරිපූරක වෛද්‍ය විද්‍යාව පිළිබඳව උපාධියක් ලබා තිබීම. |
| පළපුරුද්ද | - | රෝහල් ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 02ක අධීක්‍ෂණ අත්දැකීම. |
| ලියාපදිංචිය වෘත්තීය තත්ත්වය | - | අදාළ වෘත්තිය සඳහා ශ්‍රී ලංකා හෙද සභාවේ හෝ ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබීම අනිවාර්යය වේ. |
| වයස | - | අවුරුදු 32ට අඩු විය යුතු ය. |

**(ඕ) විධායක අංශය (ස්වෙච්ඡා නාවික හමුදාව) පොදු රාජකාරි**

| | | |
|---|---|---|
| **නිලය** | **-** | **වැඩ බලන උප ලුතිනන් (පිරිමි/කාන්තා)** |
| අධ්‍යාපන සුදුසුකම් | - | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් සාමාන්‍ය උපාධියක් ලබා තිබීම. |
| වයස | - | අවුරුදු 30ට අඩු විය යුතු ය |

**(ක) විධායක අංශය (ස්වෙච්ඡා නාවික හමුදාව) ඉංග්‍රීසි භාෂා උපදේශක**

| | | |
|---|---|---|
| නිලය | - | උප ලුතිනන් (පිරිමි/ කාන්තා) |
| අධ්‍යාපන සුදුසුකම් | - | පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම සඳහා උපාධියක් (TESOL) ලබා තිබීම;<br>*හෝ*<br>ගුරු පුහුණු විද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳව ඩිප්ලෝමාවක් ලබා තිබීම සමග රජයේ හෝ පිළිගත් ආයතනයක මාස 06 ක ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ පළපුරුද්දක් ලබා තිබීම. |
| වයස | - | අවුරුදු 35ට අඩු විය යුතු ය. |

**(ඛ) විධායක අංශය (ස්වෙච්ඡා නාවික හමුදාව) ගිණුම් නිලධාරි**

| | | |
|---|---|---|
| **නිලය** | **-** | **වැඩ බලන උප ලුතිනන් (පිරිමි)** |
| අධ්‍යාපන සුදුසුකම් | - | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ (UGC) අනුමැතිය ලත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ව්‍යාපාර කළමනාකරණ, ගිණුම්කරණ හෝ වාණිජවේදී විශේෂ උපාධියක් ලබා තිබීම. |
| වයස | - | අවුරුදු 30ට අඩු විය යුතු ය. |

**(ග) (ස්වෙච්ඡා නාවික හමුදාව) මනෝ උපදේශන නිලධාරි**

| | | |
|---|---|---|
| **නිලය** | **-** | **උප ලුතිනන් (පිරිමි/කාන්තා)** |
| අධ්‍යාපන සුදුසුකම් | - | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් අනුමත විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් අනුමත වෙනත් ආයතනයක් මගින් මනෝ විද්‍යාව පිළිබඳව විශේෂවේදී උපාධියක් ලබා තිබීම. |
| පළපුරුද්ද | - | මනෝවිද්‍යා උපදේශනය සම්බන්ධයෙන් පිළිගත් ආයතනයක හෝ රෝහලක වසර 02 ක පළපුරුද්දක් ලබා තිබීම හෝ සායනික අධීක්ෂණය යටතේ පැය 600 ක මනෝවිද්‍යා උපදේශන පුහුණුව සම්පූර්ණ කර තිබීම (සායනික පුහුණුව සනාථ කිරීම සඳහා ලොග් වාර්තා හෝ සහතික, ලිපි ඉදිරිපත් කළ යුතු ය.) |
| වයස | - | අවුරුදු 35ට අඩු විය යුතු ය. |

**5. අනෙකුත් සුදුසුකම්:**

අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් විසින් ශ්‍රී ලංකා නිත්‍ය/ ස්වෙච්ඡා නාවික හමුදාවට බැඳීමට පහත සඳහන් පොදු කොන්දේසීන් අනිවාර්යෙන්ම සපුරාලිය යුතු ය.

| | | | |
|---|---|---|---|
| (අ.) | පුරවැසිභාවය | - | ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය. |
| (ආ.) | වයස | - | අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස ඒ ඒ අංශයන් යටතේ දක්වා ඇති පරිදි විය යුතු ය. |
| (ඇ.) | උස | - | පිරිමි - 5' 6" (සෙ.මී. 167.64) නොඅඩු විය යුතු ය.<br>කාන්තා - 5' 3" (සෙ.මී. 160.02) නොඅඩු විය යුතු ය. |
| (ඈ.) | බර<br>(ශරීර ස්කන්ධ දර්ශකය) | | පිරිමි - 17-27 අතර විය යුතු ය.<br>කාන්තා - 17-27 අතර විය යුතු ය. |
| (ඉ.) | පපුව (පිරිමි) | - | 32' (සෙ.මී. 81.28) නොඅඩු විය යුතු ය. |
| (ඊ.) | වර්ණ දෘෂ්ටිය | - | එස්ටීඩී II (නිසි පෙනුම). |
| (උ.) | දෘෂ්ටි තීක්ෂණත්වය | - | වම් ඇස 6/6 සහ දකුණු ඇස 6/6 (උපැස්/ අක්ෂි කාච රහිතව) (වෛද්‍ය සහ සැපයුම් අංශයන් සඳහා පමණක් 6/12 දෘෂ්ටි තීක්ෂණත්වය උපැස් මගින් 6/6 දක්වා නිවැරදි කර ඇති අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් සලකා බැලිය හැක.) |
| (ඌ.) | සිවිල් තත්ත්වය | - | විවාහක/ අවිවාහක |

6. ක්‍රීඩා ක්ෂේත්‍රයේ ලබාගත් විශිෂ්ඨ දක්‍ෂතා ගැන නිසිලෙස සලකා බලනු ලැබේ. තවද, දැනටමත් රජයේ සහ පෞද්ගලික අංශයේ රැකියාවක නියුතු අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් සඳහා විශේෂ ප්‍රමුඛතාවයක් ලබා දෙනු ලැබේ.

7. ඉහත සඳහන් 3, 4 සහ 5 ඡේදයන්හි දක්වා ඇති අවශ්‍යතාවයන් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට සපුරා නොමැති අයදුම්කරුවන්ගේ/ අයදුම්කාරිනියන්ගේ ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8. සේවා කොන්දේසි :

(අ.) අපේක්ෂකයින්/ අපේක්ෂිකාවන් නිත්‍ය/ ස්වෙච්ඡා නාවික හමුදාවේ නිලධාරි/ නිලධාරිනි තනතුරු සඳහා බඳවාගනු ලබන අතර, ඔවුන් මූලික පුහුණුවීමේ පාඨමාලාවන් හැදෑරිය යුතු වේ.

(ආ.) ශ්‍රී ලංකා නාවික හමුදාධිපති විසින් තීරණය කරනු ලබන පරිදි ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක හෝ විදේශයක පුහුණුව ලැබීම සඳහා බඳවාගනු ලබන නිලධාරින්/ නිලධාරිනියන් සූදානමින් සිටිය යුතු ය.

(ඇ.) සියලුම නිලධාරින්/ නිලධාරිනියන් රාජකාරි හෝ පුහුණුවීම සඳහා ඕනෑම අවස්ථාවක දී ලෝකයේ ඕනෑම රටකට අනුයුක්ත කරනු ලැබීමට යටත් විය යුතු ය.

(ඈ.) පුහුණුව ලබන කාලසීමාව තුළ දී හා ඉන්පසුව නිලධාරින්/ නිලධාරිනියන් ශ්‍රී ලංකා නාවික හමුදා පනත, නාවික හමුදා නියෝග සහ සංදේශ මගින් බලාත්මක කරනු ලබන නීති රීති හා උපදෙස්වලටත් මින් මතුවට පනවනු ලබන නීති රීති හා උපදෙස්වලටත් යටත් විය යුතු ය.

(ඉ.) පුහුණුවන කාලසීමාව තුළදී යම් නිලධාරියෙකු/ නිලධාරිනියෙකු හට තම අපේක්ෂකත්වය සිය කැමැත්තෙන් අත්හිටුවා ගැනීමට අවශ්‍ය වුවහොත් ශ්‍රී ලංකා ජනරජය මගින් එම නිලධාරියා/ නිලධාරිනිය වෙනුවෙන් එතෙක් දරා ඇති සියලුම වියදම් එම නිලධාරියා/ නිලධාරිනිය විසින් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවිය යුතු වේ.

(ඊ.) පුහුණුව ලබන කාලසීමාව තුළ ඕනෑම අවස්ථාවක දී යම්කිසි නිලධාරියෙකුගේ/ නිලධාරිනියකගේ නොමනා හැසිරීම මත හෝ ඔහු/ ඇය විසින් වගකිව යුතු කිසියම් හේතුවක් මත හෝ ඔහු/ ඇය අධිකාරියක් පිරිනැමීමට යෝග්‍ය නොවේ යැයි වගකිව යුත්තන් විසින් තීරණය කරන ලද්දේ නම් එම අවස්ථාවේ දී ම අදාළ නිලධාරියා/ නිලධාරිනිය විසින් එතෙක් ඔහු/ ඇය වෙනුවෙන් දරා ඇති සියලුම වියදම් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවීමට එකඟවන බවට ශ්‍රී ලංකා ජනරජයේ නියෝජිතයා වශයෙන් ශ්‍රී ලංකා නාවික හමුදාධිපති සමග ගිවිසුමකට හා බැඳුම්කරයකට ඇතුළත් විය යුතු ය.

(උ.) පුහුණුව ලබන කාලසීමාව තුළ නිලධාරින්/ නිලධාරිනියන් හට නේවාසික පහසුකම් සහ ආහාර සපයනු ලැබේ.

**9.** රාජ්‍ය භාෂා පිළිබඳ අවශ්‍යතා:

**තෝරාගනු ලබන අපේක්ෂකයින්/ අපේක්ෂිකාවන් 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස දැනට පනවා ඇති හා මින් ඉදිරියට පනවනු ලබන නියෝග හා ව්‍යවස්ථාවන් පිළිපැදිය යුතු වේ.**

**10.** වැටුප් හා දීමනා:

**ගෙවීම් කරනු ලබන්නේ කළමනාකරණ සේවා චක්‍රලේඛ 10/2025 අනුව වේ.**

**වෛද්‍ය අංශය සඳහා වැටුප :**

| *දීමනාවන්* | *වෛද්‍ය ශ්‍රේණීන්* | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | *ප්‍රාථමික ශ්‍රේණිය (වෛද්‍ය)* | *2 වන ශ්‍රේණිය (වෛද්‍ය)* | *2 වන ශ්‍රේණිය (දන්ත)* | *1 වන ශ්‍රේණිය (වෛද්‍ය, දන්ත වෛද්‍ය)* | *නියෝජ්‍ය පරිපාලන ශ්‍රේණිය* | *පරිපාලන ශ්‍රේණිය* | *විශේෂඥ ශ්‍රේණිය* |
| මූලික වැටුප | 84,574.00 | 90,673.00 | 82,547.00 | 111,193.00 | 97,192.00 | 117,857.00 | 136,575.00 |
| රාජකාරි බාධා පැමිණ සිටීමේ හා ප්‍රවාහන දීමනාව | 70,000.00 | 70,000.00 | 70,000.00 | 70,000.00 | 70,000.00 | 70,000.00 | 70,000.00 |
| විශ්‍රාම වැටුප් සහිත දීමනාව | 1,700.00 | 1,700.00 | 1,700.00 | 3,400.00 | 3,400.00 | 3,400.00 | 3,400.00 |
| විශ්‍රාම වැටුප් රහිත දීමනාව | 2,125.00 | 1,700.00 | 1,700.00 | - | - | - | - |
| අමතර විශේෂ දීමනාව | 1,500.00 | 1,500.00 | 1,500.00 | 1,500.00 | 1,500.00 | 1,500.00 | 1,500.00 |

| දීමනාවන් | වෛද්‍ය ශ්‍රේණීන් | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | ප්‍රාථමික ශ්‍රේණිය (වෛද්‍ය) | 2 වන ශ්‍රේණිය (වෛද්‍ය) | 2 වන ශ්‍රේණිය (දන්ත) | 1 වන ශ්‍රේණිය (වෛද්‍ය, දන්ත වෛද්‍ය) | නියෝජ්‍ය පරිපාලන ශ්‍රේණිය | පරිපාලන ශ්‍රේණිය | විශේෂඥ ශ්‍රේණිය |
| භාෂා දීමනාව | 2,178.00 | 2,193.00 | 2,177.00 | 3,444.00 | 2,632.00 | 3,445.00 | 4,248.00 |
| සංනිවේදන දීමනාව | 3,000.00 | 3,000.00 | 3,000.00 | 3,000.00 | 3,000.00 | 3,000.00 | 6,000.00 |
| අමතර දීමනාව (පැයකට) (මසකට පැය 120) | 795.00 | 967.00 | 967.00 | 1,291.00 | 995.00 | 1,373.00 | 1,542.00 |
| 1/20 දීමනාව (දිනකට) (මසකට දින 03) | 3,195.00 | 3,435.67 | 3,115.00 | 4,302.33 | 3,749.67 | 4,565.67 | 5,313.33 |
| පරිපාලන දීමනාව | - | - | - | - | 6,000.00 | 6,000.00 | - |
| ආහාර දීමනාව | 34,846.80 | 34,846.80 | 34,846.80 | 34,846.80 | 34,846.80 | 34,846.80 | 34,846.80 |
| **එකතුව** | **203,913.80** | **210,015.47** | **201,552.80** | **232,977.13** | **223,315.47** | **245,987.47** | **263,425.13** |

**අනෙකුත් සියලු අංශයන් සඳහා වැටුප් :**

| විස්තරය | වැඩ බලන උප ලුතිනන් (රු.) | උප ලුතිනන් (රු.) | ලුතිනන් (රු.) |
|---|---|---|---|
| මූලික වැටුප | 65,731.00 | 74,438.00 | 86,601.00 |
| ජීවන වියදම් දීමනාව | 17,800.00 | 17,800.00 | 17,800.00 |
| නිල ඇඳුම් දීමනාව | 525.00 | 525.00 | 525.00 |
| විශේෂ අමතර දීමනාව | 3,000.00 | 3,000.00 | 3,000.00 |
| අමතර දීමනාව | 1,000.00 | 1,000.00 | 1,000.00 |
| ආහාර දීමනාව | 34,846.80 | 34,846.80 | 34,846.80 |
| **එකතුව** | **122,902,80** | **131,609.80** | **143,772.80** |

**11. පුහුණුව ලබන කාල සීමාවේ දී හා ඉන් පසුව හිමිවන පහසුකම්, දීමනා හා වරප්‍රසාද :**

(අ) ආහාර දීමනාව ආහාරයෙන් බැහැර නිලධාරීන්/ නිලධාරිනියන් සඳහා හිමිවේ;

(ආ) සුදුසුකම් වැටුප අදාළ පරිදි මසකට උපරිම රු. 637.50 ක් ගෙවනු ලැබේ;

(ඇ) නොමිලේ දුම්රියේ ගමන් කළ හැකි නිවාඩු දුම්රිය බලපත්‍ර යුගල් තුනක් වසරකට (අදාළ පරිදි නිලධාරියාට/ නිලධාරිනියට, කාලත්‍රයාට, දරුවන්ට සහ යැපෙන්නන්ට) හිමිවනු ලැබේ;

(ඈ) කඳවුර තුළ වාසය කරන නිලධාරින්ට/ නිලධාරිනියන්ට මසකට වරක් කඳවුරේ සිට තම නිවසට යාමට සහ ඒමට රාජකාරී නිවාඩු දුම්රිය ගමන් බලපත්‍ර කට්ටලයක් හෝ බස් ගාස්තු ගෙවනු ලැබේ;

(ඉ) නිල ඇඳුම් සහ ඊට අදාළ අනෙකුත් භාණ්ඩ නොමිලයේ සපයනු ලැබේ;

(ඊ) නොමිලයේ වෛද්‍ය පහසුකම් සපයනු ලැබේ (අදාළ පරිදි නිලධාරියාට/ නිලධාරිනියට, කාලත්‍රයාට, දරුවන්ට සහ යැපෙන්නන්ට);

(ඊ) රජයේ නිවාසයක වාසය නොකරන විවාහක නිලධාරීන්ට/ නිලධාරිනියන්ට රු.3,200.00 සිට රු.8,500.00 දක්වා ගෙවල් කුලී දීමනාවක් හිමි වේ;

(ඌ) නිවාඩු නිකේතන පහසුකම් ලබා ගැනීමේ හැකියාව;

(එ) රාජ්‍ය සහ පෞද්ගලික බැංකු මගින් ණය පහසුකම් ලබා ගැනීමේ හැකියාව;

(ඒ) දේශීය සහ විදේශීය පුහුණු පාඨමාලා වැටුප් දීමනා සහිතව හැදෑරීමේ හැකියාව;

(ඔ) කොමාණ්ඩර් නිලයෙන් ඉහළට උසස්වීම් ලැබීමේදී රියදුරෙකු සමග නිල රථයක් හිමිවීම.

12. අයදුම්කරුවන්ට/ අයදුම්කාරිනියන්ට උපදෙස්;

(අ) පහතින් දක්වා ඇති ආකෘතියට අනුව ඉල්ලුම්පතෙහි සියලුම ඡේදයන් හැකි පමණ විස්තර සහිතව පැහැදිලි අත්අකුරින් සම්පූර්ණ කළ යුතුයි. ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනය වන 2026 ඔක්තෝබර් මස 02 වන දින දහවල් 1200ට ප්‍රථම ලැබෙන සේ **'ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරි (බඳවාගැනීම්), ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,තැපෙ 593,බත්තරමුල්ල.'** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ලියාපදිංචි තැපෑලෙන් නොලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ. ඉල්ලුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **'ඉදුරාම බඳවා ගැනීම - 2026/01 නිත්‍ය/ ස්වේච්ඡා නිලධාරින්/ නිලධාරිනියන්'** යනුවෙන් සටහන් කළ යුතු යි. මීට අමතරව සියලු අයදුම්කරුවන් මාර්ගගත ක්‍රමය ඔස්සේද අයදුම්පත් යොමු කළ යුතු අතර ඒ සඳහා www..navy.lk / joinus වෙබ් අඩවියට පිවිසිය යුතු වේ. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබෙන අතර වැඩි විස්තර දුරකතන අංක 0760275685/ 011-7195154 / 011-7195120 මගින් ද ලබාගත හැක.

(ආ) රාජ්‍ය සේවයේ (දෙපාර්තමේන්තු/ සංස්ථා/ මණ්ඩල/ සිවිල් ආයතනයන්) නියුතු අයදුම්කරුවන්ගේ/ අයදුම්කාරිනියන්ගේ ඉල්ලුම්පත්, අපේක්ෂකයා තෝරා ගතහොත් නිදහස් කළ හැකි බවට සහතිකයක් ද සහිතව ආයතන ප්‍රධානියා (දෙපාර්තමේන්තුවේ/ සංස්ථාවේ/ මණ්ඩලයේ/ සිවිල් ආයතනයේ) මගින් ඉදිරිපත් කළ යුතුය.

(ඇ) සම්මුඛ පරීක්ෂණයන්ට හෝ වෙනයම් අවස්ථාවක කැඳවනු ලැබූ විට අපේක්ෂකයින්/ අපේක්ෂිකාවන් පහත සඳහන් ලියකියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු අතර, **ඉල්ලුම්පත් යොමු කිරීමේ දී මෙම ලියකියවිලිවල සහතික කරන ලද ඡායා පිටපත් අමුණා එවිය යුතු ය.**

(1) උප්පැන්න සහතිකය;
(2) ජාතික හැඳුනුම්පත හෝ රියදුරු බලපත්‍රයේ ඡායා පිටපත;
(3) අයදුම්කර ඇති අංශයන්වලට අදාළ අධ්‍යාපන සුදුසුකම් ඇති බව සනාථ කිරීමට අධ්‍යාපන/ උසස් අධ්‍යාපන/ වෘත්තීය අධ්‍යාපන/ උපාධි සහතික;
(4) පාසල් හැරයාමේ සහතිකය සහ පාසලෙන් ලබාගත් චරිත සහතිකය;
(5) මාස 06ක් ඇතුළත ලබාගත් ග්‍රාම නිලධාරි සහතිකය;
(6) පිළිගත් ආයතනයකින් ලබාගත් වෘත්තීය/ කාර්මික පළපුරුද්දක් ඇත්නම් ඒ පිළිබඳ සහතික;
(7) මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක් (අවුරුදු දෙකකට වැඩි කාලයක් අයදුම්කරු ගැන දැන සිටින වගකිව යුතු පුද්ගලයෙකුගෙන් හෝ දැනට සේවා යෝජකයාගෙන් විය යුතු ය);
(8) ක්‍රීඩා හා වෙනත් සුදුසුකම් පිළිබඳ සහතික.

(ඈ) අයදුම්පත් යොමු කිරීමේදී සහ නියම කරන ලද අවස්ථාවන් හී දී මෙම ලියකියවිලි හා ඡායා පිටපත් ඉදිරිපත් කිරීමට නොහැකි අපේක්ෂකයින්ගේ/ අපේක්ෂිකාවන්ගේ ඉල්ලුම්පත් ගැන සලකා බලනු නොලැබේ.

(ඉ) වෙනත් ලියකියවිලි හෝ ලේඛනවල මුල් පිටපත් කිසිවක් අයදුම්පත් සමග නොඑවිය යුතු ය.

(ඊ) අයදුම්පත සමග සහතිකවල මුල් පිටපත් එවා එම සහතික නැතිවුවහොත් නාවික හමුදාව ඊට වගකියනු නොලැබේ.

13. ඉල්ලුම්පතෙහි අසත්‍ය ප්‍රකාශයන් කර තිබී, එම අසත්‍යතාවය අපේක්ෂකයා/ අපේක්ෂිකාව තෝරා ගැනීමට ප්‍රථම හෙළිදරව් වුවහොත් ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අහිමි කිරීමට ද, තෝරා ගැනීමෙන් පසු හෙළිදරව් වුවහොත් ඔහු/ ඇය දඬුවම් සහිතව සේවයෙන් පහ කිරීමට ද යටත් වේ.

14. තෝරා ගැනීමේ සම්මුඛ පරීක්ෂණ;

(අ) ඉහත අවශ්‍යතාවයන් සපුරාලන අපේක්ෂකයින්/ අපේක්ෂිකාවන් පළමු සම්මුඛ පරීක්ෂණයට පැමිණි විට උස, වයස, ඇස් පෙනීම හා බර පරීක්ෂා කිරීම සඳහා මූලික වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත් කරනු ලැබේ.

එයින් සමත් වනු ලබන අපේක්ෂකයින්/ අපේක්ෂිකාවන් පසුව ශාරීරික යෝග්‍යතා පරීක්ෂණයට පෙර වෛද්‍ය

පරීක්ෂණයක් සඳහා ඉදිරිපත් කරනු ලබන අතර, එයින් සමත් වන සියලුම අපේක්ෂකයින්/ අපේක්ෂිකාවන් සුදුසුකම් ලැබීමේ පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරනු ලැබේ. *ගැසට් පත්‍රයේ* දක්වා ඇති පරිදි උස, වයස, ඇස් පෙනීම හා බර නොමැති අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් සුදුසුකම් ලැබීමේ පරීක්ෂණයට ඉදිරිපත් කරනු නොලැබේ. යම් අයදුම්කරුවෙකුගේ/ අයදුම්කාරිනියකගේ උස සහ වයස නියමිත පරිදි නොමැති වුවද, නාවික හමුදා සේවයට ප්‍රයෝජනවත් වන විශේෂ නිපුණතාවයක් ඔහුට/ ඇයට ඇත්නම් සේවා අවශ්‍යතාවය මත නාවික හමුදාධිපතිගේ අනුමැතිය පරිදි ඔහු/ ඇය ගැන සලකා බලනු ලැබේ. මූලික වෛද්‍ය පරීක්ෂණයකින් සමත්වන අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් පමණක් පහත සඳහන් ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරනු ලබයි (සංශෝධනවලට යටත්ව).

(*ආ*) ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය සමත් වීම සඳහා අවශ්‍යතා; (සංශෝධනවලට යටත්ව)

| *අ.අ* | *ඉසව්වන්* | *වාර ගණන* | | *කාලය* | |
|---|---|---|---|---|---|
| | | *පිරිමි* | *කාන්තා* | *පිරිමි* | *කාන්තා* |
| 01 | මීටර් 1600 දිවීම | - | - | මිනිත්තු 09 | මිනිත්තු 11 |
| 02 | Push ups | 12 හෝ ඊට වැඩි | 08 හෝ ඊට වැඩි | මිනිත්තු 01 | මිනිත්තු 01 |
| 03 | Sit ups/Curl ups | 10 හෝ ඊට වැඩි | 07 හෝ ඊට වැඩි | මිනිත්තු 01 | මිනිත්තු 01 |

(*ඇ*) ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය සහ සුදුසුකම් ලැබීමේ පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් ශ්‍රී ලංකා නාවික හමුදා වෛද්‍ය මණ්ඩලයක් ඉදිරියේ පෙනී සිටිය යුතුය. මෙම වෛද්‍ය පරීක්ෂණය සමත් අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් ඉදිරි සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීම් කරනු ලබයි, එම පරීක්ෂණයේ දී ලබා ගන්නා ලද ලකුණු සහ පවත්නා ඇබෑර්තු සංඛ්‍යාව මත ඒ ඒ අංශයෙන් වැඩිම ලකුණු ලබාගත් අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් පමණක් බඳවාගනු ලැබේ.

(*ඈ*) බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අයදුම්කරුවන්ට/ අයදුම්කාරිනියන්ට ඒ බව දන්වා සිටිනු නොලැබේ.

(*ඉ*) සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් හට සම්මුඛ පරීක්ෂණ පවත්වන දිනය, වේලාව සහ ස්ථානය WhatsApp පණිවිඩයක් මගින් පමණක් දැනුම් දෙන අතර, කිසිදු පණිවිඩයක් ලිඛිතව තැපැල් මගින් දැනුම් දෙනු නොලැබේ. සම්මුඛ පරීක්ෂණවලට සහභාගී වීම සම්බන්ධයෙන් ගමන් වියදම් හෝ වෙනත් කිසිදු වියදමක් ගෙවනු නොලැබේ.

(*ඊ*) මෙම තනතුර සම්බන්ධයෙන් අයදුම්කරුවෙකු/ අයදුම්කාරිනියක කැඳවනු ලබන සෑම අවස්ථාවක දී ම පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත ඔහු/ ඇය විසින් ඉදිරිපත් කළ යුතු ය.

(*උ*) අයදුම්කරුවකු/ අයදුම්කාරිනියක නිර්දේශ කිරීමට අදහස් කරන කවරෙකු විසින් වුවද, එසේ කළ යුත්තේ ඔහුට/ ඇයට සහතිකයක් දීමෙනි. අයදුම්කරුවකු/ අයදුම්කාරිනියක තෝරා ගැනීම සඳහා කවරාකාරයෙන් හෝ පෙළඹවීම් *නැතහොත්* බලපෑම් කිරීමට උත්සාහ කිරීම, එම අයදුම්කරු/ අයදුම්කාරිනිය නුසුදුසු අයෙක් වීමට හේතුවන්නේ ය.

(*ඌ*) අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් විසින් ඉදිරිපත් කරනු ලබන අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික විභාග දෙපාර්තමේන්තුව සහ අදාළ ආයතන සමග සම්බන්ධීකරණය වී ඒවායේ සත්‍යතාවය සහතික කරගනු ලබයි.

(*එ*) සියලුම අයදුම්කරුවන්ගේ/ අයදුම්කාරිනියන්ගේ ආරක්ෂක නිශ්කාෂණ වාර්තා ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය මගින් නැවත පරීක්ෂාවට යොමු කරනු ලැබේ.

15. ශ්‍රී ලංකා නාවික හමුදාවට ඉදුරාම නිලධාරීන්/ නිලධාරිනියන් බඳවා ගැනීමේ ක්‍රියාවලිය පිළිබඳ අවසන් තීරණ ගැනීමේ බලතල ශ්‍රී ලංකා නාවික හමුදාධිපති සතුවන අතර, ජාතික ආරක්ෂාව සහ ශ්‍රී ලංකා නාවික හමුදාවේ සේවා අවශ්‍යතාවයන් අනුව ඉහත ශාරීරික සුදුසුකම්, අවශ්‍යතාවයන් සහ කොන්දේසිවල වෙනස්කම් සිදු කිරීමේ අවසාන තීරණය නාවික හමුදාධිපති සතු වේ.

*සටහන -* මෙම *ගැසට්* නිවේදනය සිංහල, ඉංග්‍රීසි සහ දෙමළ යන භාෂා ත්‍රිත්වයෙන්ම පළවේ. දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

කේඩීඩීසී ප්‍රනාන්දු, ආර්එස්පී, යූඑස්පී, ආර්සීඩීඑස්
වයිස් අද්මිරාල්,
නාවික හමුදාධිපති.

ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය,
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,
තැපෙ 593,
බත්තරමුල්ල.

**ශ්‍රී ලංකා නිත්‍ය සහ ස්වේච්ඡා නාවික හමුදාවේ ඉදුරාම නිලධාරීන්/ නිලධාරිනියන් බඳවා ගැනීම සඳහා ඉල්ලුම්පත**

පුරවැසිභාවය: ……………………………………………………………………………………………………………
(ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ පෙළපතින් ද ලියාපදිංචි වීමෙන් ද යන්න සඳහන් කරන්න. ලියාපදිංචි කිරීමෙන් නම් එම සහතික පත්‍රයේ දිනය සහ අංකය සඳහන් කරන්න)

ඉල්ලුම් කරන තනතුර: …………………………………………………………………………………………

සම්පූර්ණ නම (ජාතික හැඳුනුම්පතට අනුව): …………………………………………………………………

ජාතික හැඳුනුම්පත් අංකය: ……………………………………………………………………………………

ස්ථිර ලිපිනය: ………………………………………………………………………………………………………

තැපැල් ලිපිනය: ……………………………………………………………………………………………………

විද්‍යුත් ලිපිනය: ……………………………………………………………………………………………………

උපන් දිනය: …………………………………………………………………………………………………………

වයස : අවුරුදු ................ මාස .................. දින ................... (2026 ඔක්තෝබර් මස 02 වන දිනට)

උස ........................(සෙ.මී/අඟල්) : පපුව (පිරිමි) ...................... (සෙ.මී/අඟල්) : බර ……………………… (කි.ග්‍රෑ.)

ස්ථිර ලිපිනයට අයත් පොලිස් ස්ථානය: ……………………………………………………………………

දිස්ත්‍රික්කය: …………………………………………………………………………………………………………

ඡන්ද කොට්ඨාසය: ……………………………………………………………………………………………………

ග්‍රාම නිළධාරී කොට්ඨාසය: ………………………………………………………………………………………

දුරකථන අංකය: ……………………… WhatsApp අංකය ……………………………………………

විවාහක/ අවිවාහක බව: ………………………………………………………………………………………

ස්ත්‍රී/ පුරුෂ භාවය: ……………………………………………………………………………………………...………………

අධ්‍යාපනය ලැබූ පාසල්: …………………………………………………………………………………...........…………………

………………………………………………………………………………………………………............…………………

උපාධිය/ උසස් අධ්‍යාපනය පිළිබඳ විස්තර :

| උපාධිය/ උසස් අධ්‍යාපන ආයතනයේ නම | ලබාගත් ආයතනය | ලබාගත් වර්ෂය | පන්ති සාමාර්ථයන් පිළිබඳ විස්තර |
|---|---|---|---|
| | | | |

අධ්‍යාපනය ලැබූ පාසල් පිළිබඳ විස්තර :

| පාසලේ නම | සමත් විභාගය | විභාගයට පෙනී සිටි වර්ෂය | සමත් වූ විෂයයන් (ශ්‍රේණි ඇතුලුව) |
|---|---|---|---|
| | අ.පො.ස (සා.පෙළ)<br>අ.පො.ස (උ.පෙළ)<br>වෙනත් | | |

**පාසලෙන් / විශ්වවිද්‍යාලයෙන් ඉවත් වූ පසු කළ රැකියා පිළිබඳ විස්තර :**

| සේවා යෝජකයාගේ නම සහ ලිපිනය | රැකියාවේ ස්වභාවය | සේවා කාලය | |
|---|---|---|---|
| | | සිට | දක්වා |
| | | | |

මව්පියන් පිළිබඳ විස්තර :

| සම්පූර්ණ නම | උපන් ස්ථානය | රැකියාව | වර්තමාන ලිපිනය |
|---|---|---|---|
| පියා | | | |
| මව | | | |

ඉල්ලුම් කරන අංශය සඳහා ඇති විශේෂ සුදුසුකම්: ……………………………………………………………….....................
......................................................................................................................................………………
......................................................................................................................................………………

ක්‍රීඩා අතින් දැනට පවත්නා විශිෂ්ඨතා පිළිබඳ විස්තර (ඔබ සහභාගි වූ තරග සහ ක්‍රීඩා කණ්ඩායම්, දිනයන් හා ලැබූ විශිෂ්ඨතා දක්වන්න): ……………………………...……………………..........................................................……….
......................................................................................................................................…………………

පාසලේ හෝ බාහිර සංවිධානවල දී දක්වා ඇති වෙනත් විශිෂ්ඨතා (දිනයන් සමග විස්තර දක්වන්න): ………………………...
......................................................................................................................................………………....
......................................................................................................................................………………
......................................................................................................................................……………...

සන්නද්ධ සේවා/ ස්වේච්ඡා බළ සේනාවේ/ ශිෂ්‍යභට බලකායේ හෝ බාලදක්ෂ ව්‍යාපාරයේ ඇති සේවය: ……………………
……………………………………………………………………………………………………………
……………………………………………………………………………………………………………

ඔබ ශ්‍රී ලංකා නාවික හමුදාවට අයදුම් කිරීම සඳහා දැනුවත් වූ මාර්ගය හෝ මාධ්‍යය සඳහන් කරන්න:
……………………………………………………………………………………………………

ශ්‍රී ලංකා නාවික හමුදාවට හෝ සන්නද්ධ හමුදා කිසිවකට හෝ පොලීසියට හෝ බැඳීම සඳහා ඔබ විසින් මීට පෙර ඉල්ලීම් කර තිබේද? එසේනම් ඒ පිළිබඳ විස්තර සහ ඒ ඉල්ලීම්වලට සිදුවූයේ කුමක්දැයි සඳහන් කරන්න: ………………………………
……………………………………………………………………………………………………………
……………………………………………………………………………………………………………
……………………………………………………………………………………………………………

සිවිල් හෝ යුධ අධිකරණයක දී ඔබ වැරදිකරු කර හෝ අත්හිටවූ සිර දඬුවමක් ලබා තිබේ ද? එසේනම් විස්තර සඳහන් කරන්න:
……………………………………………………………………………………………………………

චරිත සහතික පිළිබඳ විස්තර :

| *නම* | *පදවිය* | *තැපැල් ලිපිනය* |
|---|---|---|
| | | |

අයදුම්කරු/ අයදුම්කාරිනිය විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය :

පූර්වෝක්ත ප්‍රකාශවලට මා විසින් ලබාදී ඇති පිළිතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අවංකව ප්‍රකාශ කරමි. ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ වූ ශ්‍රී ලංකා නාවික හමුදාවේ අධිකාරිය සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයන්/ අපේක්ෂිකාවන් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියාපිළිවෙල හා අදාළ වන රෙගුලාසි ද මම කියවා අවබෝධ කර ගතිමි.

…………………. ………………………………………………,
දිනය අයදුම්කරුගේ/ අයදුම්කාරිනියගේ අත්සන.

ඔබ විසින් සම්පූර්ණ කරන ලද අයදුම්පත ලියාපදිංචි තැපැලෙන් (සුදුසුකම්වලට අදාළ ලිපි ලේඛනවල සහතික කරන ලද පිටපත් ද සමඟ) ලිපිනයට යොමු කරන්න.

ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරි (බඳවා ගැනීම්)
නාවික හමුදා මූලස්ථානය,
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,
තැ.පෙ 593,
බත්තරමුල්ල.

*සම්බන්ධතා විස්තර* - විද්‍යුත් තැපැල: nhqssorec@gmail.com දුරකථන අංක : 0117195154, 0117195120
ජංගම දුරකථන: 0760275685

09 - 142

**ජාතික සමාජ සංවර්ධන ආයතනය**

(ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය)

තනතුර : **අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (අධ්‍යයන) - 01**

1. වයස් සීමාව : වයස අවුරුදු 25 ට නොඅඩු හා වයස අවුරුදු 55 ට නොවැඩි අය විය යුතු ය. (දැනට රජයේ පළාත් රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු වුවන්ට මෙම උපරිම වයස් සීමාව බල නොපායි.)

2. අධ්‍යාපන සුදුසුකම් :

**බාහිර අයදුම්කරුවන් බඳවාගැනීම්**

**අධ්‍යාපන සුදුසුකම්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක සාමාජීය විද්‍යාවන්ගෙන් ප්‍රථම උපාධියක් සමග සමාජ වැඩ (Social Work) පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

**පළපුරුද්ද**

රජයේ හෝ රාජ්‍ය ආයතනයක ජ්‍යෙෂ්ඨ කළමනාකාර මට්ටමේ අවම වශයෙන් වසර 15 ක පළපුරුද්දක් සමඟ ඉතා යහපත් සේවා වාර්තාවක් තිබීම. (මෙම සේවා කාලයෙන් අවම වශයෙන් වසර 3 ක් සමාජ වැඩ (Social Work) පිළිබඳ පශ්චාත් උපාධිය ලබාගැනීමෙන් පසුව විය යුතු ය.)

**අතිරේක වෘත්තීය සුදුසුකම්**

සමාජ සේවා / සමාජ සුභසාධන / සමාජ සංවර්ධන ක්ෂේත්‍රයේ වැඩසටහන් කළමනාකරණය කිරීම හා සමාජ වැඩ වෘත්තීය ආයතනයක (Professional Body) සාමාජිකත්වය දැරීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවාගැනීම**

**සුදුසුකම්**

ජාතික සමාජ සංවර්ධන ආයතනයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර 3 ක පළපුරුද්දක් සමඟ ඉතා යහපත් සේවා වාර්තාවක් තිබීම.

**අතිරේක වෘත්තීය සුදුසුකම්**

සමාජ සේවා / සමාජ සුභසාධන / සමාජ සංවර්ධන ක්ෂේත්‍රයේ වැඩසටහන් කළමනාකරණය කිරීම හා සමාජ වැඩ වෘත්තීය ආයතනයක (Professional Body) සාමාජිකත්වය දැරීම.

3. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ක්‍රමය :

| | |
|---|---|
| අදාළ පරිපාලන පළපුරුද්ද | ලකුණු 30 |
| අදාළ අතිරේක වෘත්තීය පළපුරුද්ද | ලකුණු 30 |
| වෙනත් කුසලතා | ලකුණු 15 |
| සම්මුඛ පරීක්ෂණයේ කාර්යසාධනය | ලකුණු 25 |
| | **ලකුණු 100** |

4. වැටුප් පරිමාණය : HM 2-1 2025 රු.161,140 – 12 x 4,850 – රු.219,340/-
2027.01.01 දින සිට මෙම වැටුප් පරිමාව අදාළ වේ. 2026 දෙසැම්බර් 31 දක්වා මූලික වැටුප රු. 140,317 කි.)
මීට අමතරව වෘත්තීය දීමනාව, පර්යේෂණ දීමනාව හිමි වන අතර, රජය විසින් චක්‍රලේඛ මඟින් වරින්වර නිකුත් කරන වෙනත් දීමනා සඳහා හිමිකම් ඇත.

තනතුර : **ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - 03 (සිංහල මාධ්‍යය - 02, දෙමළ මාධ්‍යය - 01)**

1. වයස් සීමාව : වයස අවුරුදු 30 ට නොඅඩු හා වයස අවුරුදු 55 ට නොවැඩි අය විය යුතු ය. (අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

2. අධ්‍යාපන සුදුසුකම් :

**බාහිර අයදුම්කරුවන් සඳහා (පහත සඳහන් 1 හෝ 2)**

(1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සමාජ වැඩ/සමාජ විද්‍යාවන්ගෙන් ලබාගත් විශේෂවේදී උපාධිය

*සමග*

සමාජ වැඩ / සමාජ විද්‍යා පිළිබඳ පශ්චාත් උපාධියක් (පර්යේෂණයක් මගින් ලබා තිබීම)

*සහ*

ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් වසර අටක (08) කට නොඅඩු ඉගැන්වීම් පිළිබඳ පළපුරුද්දක් ලබා තිබීම.

(2) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සමාජ වැඩ/සමාජීය විද්‍යාවන්ගෙන් ලබාගත් විශේෂවේදී උපාධිය

*සමග*

සමාජ වැඩ / සමාජීය විද්‍යාවන්ගෙන් ලබාගත් ආචාර්ය උපාධියක් (PhD) ලබා තිබීම.

*සහ*

ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් වසර පහක (05) ක ඉගැන්වීම් පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා (පහත සඳහන් 1 හෝ 2 හෝ 3)**

(1) ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

(2) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සමාජ වැඩ/සමාජීය විද්‍යාවන්ගෙන් විශේෂවේදී / සාමාන්‍ය උපාධියක් ලබා තිබීම.

*සමග*

සමාජ වැඩ / සමාජීය විද්‍යා විෂය ක්ෂේත්‍රයෙන් (පර්යේෂණ මඟින්) පශ්චාත් උපාධියක් (Master) ලබා තිබීම;

*සහ*

"අධ්‍යයන / පර්යේෂණ" සේවා ගණයෙහි (AR-1) කථිකාචාර්ය තනතුරක අවම වශයෙන් වසර අට (08) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(3) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සමාජ වැඩ/සමාජීය විද්‍යාවන්ගෙන් විශේෂවේදී / සාමාන්‍ය උපාධියක් ලබා තිබීම;

*සමග*

සමාජ වැඩ / සමාජීය විද්‍යාවන්ගෙන් ලබාගත් ආචාර්ය උපාධියක් (PhD) ලබා තිබීම;

*සහ*

"අධ්‍යයන / පර්යේෂණ" සේවා (AR-1) ගණයෙහි කථිකාචාර්ය තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

3. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ක්‍රමය :

| | නිර්ණායකය | ලකුණු |
|---|---|---|
| 1. | අධ්‍යාපන සුදුසුකම් (මූලික සුදුසුකම්වලට අතිරේකව) | 30 |
| | i. පන්ති සාමාර්ථ | |
| | ii. පශ්වාත් උපාධි (පර්යේෂණ) | |
| | iii. පශ්වාත් උපාධි (පර්යේෂණ නොවන) | |
| 2. | ඉගැන්වීම් පළපුරුද්ද (විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක/උසස් අධ්‍යාපන ආයතනයක ඉගැන්වීම් පළපුරුද්ද) | 10 |
| 3. | පර්යේෂණ හා ප්‍රකාශන | 20 |
| | i. පර්යේෂණාත්මක නිබන්ධන, ස්වාධීන (non refereed) | |
| | ii. සම්මන්ත්‍රණ වාර්තා, පර්යේෂණ වාර්තා | |
| | iii. ස්වාධීන ප්‍රකාශන | |
| | iv. ප්‍රකාශිත ශාස්ත්‍රීය ලිපි ලේඛන (ජාතික / ජාත්‍යන්තර) | |
| 4. | විෂය බාහිර ක්‍රියාකාරකම් | 10 |
| | i. ක්‍රීඩා | |
| | Ii. සමාජ සේවා / සමිති, සමාගම් / ප්‍රජා වැඩසටහන් | |
| 5. | පෞරුෂය | 15 |
| 6. | අදාළ ක්ෂේත්‍ර පිළිබඳ සාමාන්‍ය දැනුම | 15 |
| | **එකතුව** | **100** |
| | * සම කෘතීන් සඳහා මින් 50% හිමි වේ. | |

4. වැටුප් පරිමාණය : AR – 2 2025 රු.1,33,220 – 10 x 3,600 = රු. 1,69,220/-
2027.01.01 දින සිට මෙම වැටුප් පරිමාව අදාළ වේ. 2026 දෙසැම්බර් 31 දක්වා මූලික වැටුප 116,763 කි.)
මීට අමතරව වෘත්තීය දීමනාව, පර්යේෂණ දීමනාව හිමි වන අතර, රජය විසින් චක්‍රලේඛ මඟින් වරින්වර නිකුත් කරන වෙනත් දීමනා සඳහා හිමිකම් ඇත.

**තනතුර : කථිකාචාර්ය II - 06 (සිංහල මාධ්‍ය -04, දෙමළ මාධ්‍ය - 02)**

1. වයස් සීමාව : වයස අවුරුදු 22 ට නොඅඩු හා වයස අවුරුදු 45 ට නොවැඩි අය විය යුතු ය.
(අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

2. අධ්‍යාපන සුදුසුකම් : **බාහිර අයදුම්කරුවන් සඳහා (පහත සඳහන් 1 හෝ 2)**

(1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් වසර හතරක (04) සමාජ වැඩ උපාධිය /සමාජීය විද්‍යාවන්ගෙන් ලබාගත් විශේෂ ශාස්ත්‍රවේදී උපාධියක් ලබා තිබීම.

(2) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සමාජ වැඩ/සමාජීය විද්‍යාවන් සහිත ශාස්ත්‍රවේදී උපාධියක් සමඟ අදාළ විෂය ක්ෂේත්‍රයකින් පශ්වාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා**

(1) ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

3. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබාදෙන ආකාරය :

| | නිර්ණායකය | ලකුණු |
|---|---|---|
| 1. | අධ්‍යාපන සුදුසුකම් (මූලික සුදුසුකම්වලට අතිරේකව) | 30 |
| | i. පන්ති සාමාර්ථ | |
| | ii. පශ්වාත් උපාධි (පර්යේෂණ සහිත) | |

ආකාරය

| | නිර්ණායකය | ලකුණු |
|---|---|---|
| | iii. පශ්චාත් උපාධි (පර්යේෂණ නොවන) | |
| 2. | ඉගැන්වීම් පළපුරුද්ද (විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක/උසස් අධ්‍යාපන ආයතනයක අවම වශයෙන් ඉගැන්වීම් පළපුරුද්ද) | 10 |
| 3. | පර්යේෂණ හා ප්‍රකාශන | 20 |
| | i. පර්යේෂණාත්මක නිබන්ධන, ස්වාධීන (non refereed) | |
| | ii. සම්මන්ත්‍රණ වාර්තා, පර්යේෂණ වාර්තා | |
| | iii. ස්වාධීන ප්‍රකාශන | |
| | iv. ප්‍රකාශිත ශාස්ත්‍රීය ලිපි ලේඛන | |
| 4. | විෂය බාහිර ක්‍රියාකාරකම් | 10 |
| | i. ක්‍රීඩා | |
| | Ii. සමාජ සේවා / සමිති, සමාගම් | |
| 5. | පෞරුෂය | 15 |
| 6. | අදාල ක්ෂේත්‍ර පිළිබඳ සාමාන්‍ය දැනුම | 15 |
| | **එකතුව** | **100** |
| | * සම කෘතීන් සඳහා මින් 50% හිමි වේ. | |

4. වැටුප් පරිමාණය : AR – 1 2025 රු.91,650 – 10 x 2480 – 15x3450 - රු.168,200/-
2027.01.01 දින සිට මෙම වැටුප් පරිමාව අදාළ වේ. 2026 දෙසැම්බර් 31 දක්වා මූලික වැටුප 81,675 කි.)
මීට අමතරව වෘත්තීය දීමනාව, පර්යේෂණ දීමනාව හිමි වන අතර, රජය විසින් චක්‍රලේඛ මඟින් වරින්වර නිකුත් කරන වෙනත් දීමනා සඳහා හිමිකම් ඇත.

**තනතුර : ව්‍යාපෘති වැඩසටහන් සම්පාදක III - 01**

1. වයස් සීමාව : වයස අවුරුදු 22 ට නොඅඩු හා වයස අවුරුදු 45 ට නොවැඩි අය විය යුතු ය.
(අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

2. අධ්‍යාපන සුදුසුකම් : **බාහිර අයදුම්කරුවන්**
1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සමාජ වැඩ / මානව සම්පත් කළමනාකරණය/ රාජ්‍ය පරිපාලනය / රාජ්‍ය කළමනාකරණය / සමාජීය විද්‍යාව යන ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**
1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

3. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබාදෙන ආකාරය :

| | |
|---|---|
| අදාළ පළපුරුද්ද | ලකුණු 30 |
| අදාළ අතිරේක සුදුසුකම් | ලකුණු 30 |
| වෙනත් කාර්යසාධනයන් / කුසලතා | ලකුණු 15 |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාව | ලකුණු 25 |
| | **ලකුණු 100** |

4. වැටුප් පරිමාණය : MA 3 2025 – 53,940 – 10x800 – 11x1,190 – 10x1,320 – 5x 1,350 =රු. 94,980/-
2027.01.01 දින සිට මෙම වැටුප් පරිමාව අදාළ වේ. 2026 දෙසැම්බර් 31 දක්වා මූලික වැටුප රු. 49,831 කි.)

**තනතුර : ශ්‍රව්‍ය දෘශ්‍ය කාර්මික III - 01**

1. වයස : වයස අවුරුදු 18 ට නොඅඩු හා වයස අවුරුදු 45 ට නොවැඩි අය විය යුතු ය.
(අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

2. අධ්‍යාපන සුදුසුකම් :

**බාහිර අයදුම්කරුවන්**

1. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05) වැනි මට්ටමට නොඅඩු ශ්‍රව්‍ය දෘශ්‍ය කාර්මික තාක්ෂණික ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් අදාළ වේ.

3. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙන ආකාරය :

| | |
|---|---|
| අදාළ අමතර පළපුරුද්ද | ලකුණු 30 |
| අදාළ අමතර අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් | ලකුණු 30 |
| වෙනත් කුසලතා හා කාර්යසාධනයන් | ලකුණු 15 |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාවය | ලකුණු 25 |
| | **ලකුණු 100** |

4. වැටුප් පරිමාණය : MA 2-2 2025 – 50, 540 – 10 x 540 – 7x630 – 4x1,080 – 20x1,280 – 90,270/- (2027.01.01 දින සිට මෙම වැටුප් පරිමාව අදාළ වේ. 2026 දෙසැම්බර් 31 දක්වා මූලික වැටුප 46,960 කි.)

5. තනතුර සඳහා සේවා නියුක්ත කරවීමේ කොන්දේසි

**සෑම අයදුම්කරුවෙකුම,**

1. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.
2. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍යවන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.
3. රජයේ අනුමත ප්‍රතිශතයන්ට අනුව සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් (EPF) ගෙවිය යුතු ය.
4. තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ.

**සේවා කොන්දේසි :**

1992 අංක 41 දරන ජාතික සමාජ සංවර්ධන ආයතන පනතේ විධිවිධානවලට හා රජය විසින් වරින්වර පනවනු ලබන නීතිරීති හා රෙගුලාසිවලට යටත් විය යුතු ය.

**බඳවාගැනීමේ ක්‍රමවේදය :**

පත්වීම් බලධාරියා විසින් නියම කරනු ලබන පරිදි සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ. ඉහළම ලකුණු ලැබුවන් අතරින් කුසලතා අනුපිළිවෙළ අනුව තෝරාගැනීම සිදු කෙරේ.

අයදුම්කරුවන් සම්පූර්ණ ජීව දත්ත තොරතුරු ඇතුළත් අයදුම්පත් පහත ලිපිනයට 2026.09.25 දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ඉල්ලුම් කරන තනතුර ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතු ය. අසම්පූර්ණ, අපැහැදිළි හෝ ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරන අතර, එම ඉල්ලුම්පත් ලකුණු ලබාදීමේ නිර්ණායකයන් පදනම් කරගනිමින් කෙටි ලැයිස්තුගත (shortlist) කරනු ලැබේ. (රාජ්‍ය අංශයේ සේවයේ නියුතු නිලධාරින් තම අයදුම්පත් දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.)

අධ්‍යක්ෂ ජනරාල්,

ජාතික සමාජ සංවර්ධන ආයතනය,
ලියනගේමුල්ල,
සීදුව.
2026.09.11 දින.

09 - 144

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය**

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයෙහි කළමනාකරණ සහකාර තාක්ෂණික බණ්ඩ - 03 සේවා ගණය
විදුලි වෛද්‍ය යාන්ත්‍රික තනතුරේ III වන ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026

**සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති රෝහල් සහ ආයතනවල කළමනාකරණ සහකාර තාක්ෂණික බණ්ඩ** – 03 සේවා ගණය විදුලි වෛද්‍ය යාන්ත්‍රික තනතුරෙහි පවතින පුරප්පාඩු 64ක් සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**02.** **අවශ්‍ය සුදුසුකම් :**

2.1. අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් :

| *අධ්‍යාපන සුදුසුකම්* | *වෘත්තීය සුදුසුකම්* |
|---|---|
| සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරක දී විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා/පෙළ) විභාගය සමත්ව තිබීම;<br><br>*හෝ*<br><br>ජාතික වෘත්තීය සුදුසුකම (NVQ) 03 ලබා තිබීම | 01. කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව යටතට ගැනෙන හෝ එම දෙපාර්තමේන්තුව විසින් නිර්දේශිත ආයතනයක් මගින් පිරිනමනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම (NVQ) 05 මට්ටම ඇතුළත් පහත පාඨමාලාවලින් එකක් සම්පූර්ණ කර තිබීම.<br><br>(i.) වසර 03ක අර්ධකාලීන ජාතික තාක්ෂණික සහතිකය (විදුලි හා විද්‍යුත් ඉංජිනේරු) National Certificate in Technology (Electrical & Electronic Engineering);<br><br>(ii.) වසර 02ක පූර්ණකාලීන කර්මාන්ත තාක්ෂණය පිළිබඳ ජාතික සහතිකය (විදුලි හා විද්‍යුත් ඉංජිනේරු) National Certificate in Industrial Technology (Electrical & Electronic Engineering);<br><br>(iii.) වසර 02ක පූර්ණකාලීන ජාතික ඩිප්ලෝමා (විදුලි තාක්ෂණය) සහතිකය National Diploma in Electrical Technology;<br><br>(iv.) වසර 02ක පූර්ණකාලීන ජාතික ඩිප්ලෝමා (විද්‍යුත් තාක්ෂණය) සහතිකය National Certificate in Electrical Technology;<br><br>*හෝ*<br><br>02. මොරටුව පිහිටි කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනය (Industrial Engineering Training Institute) මගින් පිරිනමනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 05 මට්ටම ඇතුළත් පහත පාඨමාලාවලින් එකක් සම්පූර්ණ කර තිබීම'<br><br>(i.) ඉලෙක්ට්‍රොනික් කාර්මික ශිල්පී පාඨමාලාව (Electronics Craftsman);<br><br>(ii.) විදුලි කාර්මික ශිල්පී පාඨමාලාව (Electrician);<br><br>*හෝ* |

| *අධ්‍යාපන සුදුසුකම්* | *වෘත්තීය සුදුසුකම්* |
|---|---|
| | 03. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව යටතට ගැනෙන ආයතනයක් මගින් හෝ ආයතනය විසින් නිර්දේශිත ආයතනයක් මගින් පිරිනමනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 05 මට්ටම ඇතුළත් පහත පාඨමාලාවලින් එකක් සම්පූර්ණ කර තිබීම.<br><br>i. විද්‍යුත් තාක්ෂණය ජාතික ඩිප්ලෝමාව<br>National Diploma in Electrical Technology (Full Time);<br><br>ii. විද්‍යුත් තාක්ෂණ ඩිප්ලෝමාව<br>Diploma in Electrical Technology;<br><br>iii. වසර 03ක විද්‍යුත් තාක්ෂණ ඩිප්ලෝමාව<br>Diploma in Electrical Technology (03 Years Part Time);<br><br>iv. විද්‍යුත් තාක්ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව<br>Higher National Diploma in Electrical Technology;<br><br>v. විද්‍යුත් තාක්ෂණය පිළිබඳ ජාතික සහතිකය<br>National Certificate in Electrical Technology (NCIT – Electrical);<br><br>vi. අර්ධකාලීන වසර 03ක විද්‍යුත් තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව<br>National Diploma in Electrical Technology (03 Years Part Time);<br><br>*හෝ*<br><br>04. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් සහතික කරන ලද හෝ ඒ යටතේ පවතින ආයතනයක් විසින් ප්‍රදානය කරනු ලබන ජෛව වෛද්‍ය උපකරණ තාක්ෂණය (Bio Medical Equipment Technology) මට්ටම් 06 සුදුසුකම් ලබා තිබීම;<br><br>*හෝ*<br><br>05. රජය විසින් පිරිනමනු ලබන විදුලි / විද්‍යුතය සම්බන්ධ ජාතික තාක්ෂණික සහතික පාඨමාලාවක් හදාරා 2015.11.17 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 22/2015 අනුව 1990.10.30 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 46/90 VI සුදුසුකම් සම්පූර්ණ කර තිබීම. |

2.2. *පළපුරුද්ද :* විදුලි වෛද්‍ය යාන්ත්‍රික තනතුරට අදාළව රාජ්‍ය හෝ පිළිගත හැකි ඕනෑම පෞද්ගලික අංශයේ ආයතනයක් මගින් ක්ෂේත්‍රය පිළිබඳව ලබා ඇති පළපුරුද්ද අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

2.3. *කායික සුදුසුකම්: -* සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

2.4. *වෙනත්:*

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය
II. අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් ද යුක්ත විය යුතු ය.
III. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය 2.1 සිට 2.5 දක්වා වූ සියලුම සුදුසුකම් 2026.10.12 දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

2.5. වයස:

I. අවම වයස් සීමාව : අවුරුදු 18ට නොඅඩු
II. උපරිම වයස් සීමාව : අවුරුදු 35ට නොවැඩි

03. **බඳවා ගැනීමේ ක්‍රමය:**

| ප්‍රශ්න පත්‍රය | විෂය නිර්දේශය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| 1. ලිඛිත විභාගය<br>I. බුද්ධි පරීක්ෂණය<br>II. විෂයානු බද්ධ සාමාන්‍ය දැනුම | විෂය නිර්දේශය පහත දැක්වේ. | පැය 01<br>පැය 01 | 100<br>100 | 50%<br>50% |
| 2. ප්‍රායෝගික වෘත්තීය පරීක්ෂණය | | පැය 02 | 100 | 50% |

| ප්‍රශ්න පත්‍රය | විෂය නිර්දේශය |
|---|---|
| බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලභාවයෙන්, ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්ත්වයන් තීරණය කිරීමේ ශක්තියත්, විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්තය. |
| විෂයානු බද්ධ සාමාන්‍ය දැනුම | ධාරා විද්‍යුතය - සරල ධාරා විද්‍යුතය, ඕම්ගේ නියමය, කර්චෝෆ් නියමය, විභව අන්තරය, ධාරාව මැනීමේ ක්‍රම<br>චුම්භකත්වය - විද්‍යුත් චුම්බකත්වය<br>ස්ථිතික විද්‍යුතය - කූලෝම් නියමය<br>තරංග - විද්‍යුත් චුම්භක තරංග<br>ඉලෙක්ට්‍රෝනික භෞතික විද්‍යාව - අර්ධ සන්නායක ඩයෝඩ සහ ට්‍රාන්සිස්ටර්<br>තාපය - ප්‍රසාරණය, රේඛීය ප්‍රසාරණතා සංගුණකය<br>ගණිතය - ත්‍රිකෝණමිතික ශ්‍රිත, නිව්ටන් භෞතික විද්‍යාව<br>විදුලි යන්ත්‍ර - ( D.C මෝටර්, A.C මෝටර්, විදුලි පරිණාමක) |

| | |
|---|---|
| ප්‍රායෝගික වෘත්තීය පරීක්ෂණය | ක්ෂේත්‍රයට අදාළ මූලික දැනුම, උපකරණ සවි කිරීම, අලුත්වැඩියා කිරීම පිළිබඳ දැනුම, අදාළ ක්ෂේත්‍රයේ උපකරණවල දෝෂ හඳුනා ගැනීම, ක්ෂේත්‍රයට අදාළ උපකරණ භාවිතය පිළිබඳ දැනුම, එකලා මෝටර්, තෙකලා මෝටර්, සරල ධාරා මෝටර්, තෙකලා තාපන දඟර, ඔසිලස් කෝප් භාවිතය ස්ටාර් ඩෙල්ටා පරිපථ, ජව සැපයුම් පරිපථ පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම |

**04. වැටුප් ව්‍යුහය හා වැටුප් පරිමාණය මාසික:**

රුපියල් 50,090-10x540-10x630-11x1,010-10x1,190 -රු. 84,420

MT 1 (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 උපලේඛන (II) අනුව)

**05. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :**

(i) බඳවා ගනු ලබන නිලධාරීන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කැමති විය යුතු ය.

(ii) පත් කරනු ලබන තනතුර ස්ථිර ය. තෝරාගත් අයදුම්කරුවන්ට හිමි විශ්‍රාම වැටුප් පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ. තව ද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට / වැන්දඹු පුරුෂ

හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. රජය විසින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

(iii) මෙම පත්වීම තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වන අතර බඳවා ගෙන වසර තුනක් (03) ඇතුළත පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

(iv) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020ට අනුව හා ඊට ආනුෂාංගික චක්‍රලේඛ අනුව තනතුරට බැඳී වසර 05ක් ඇතුළත නියමිත රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාව ලබාගත යුතු ය.

(v) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, රජය විසින් නිකුත් කරන චක්‍රලේඛ විධිවිධානවලට ද, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ කළමනාකරණ සහකාර තාක්ෂණික බණ්ඩ - 03 සේවා ගණය විදුලි වෛද්‍ය යාන්ත්‍රික තනතුර සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියට ද, සෞඛ්‍ය හා ජනමාධ්‍ය ලේකම් විසින් නිකුත් කරන චක්‍රලේඛ හා පොදු විධිවිධානවලට ද මෙම පත්වීම යටත් වේ.

(vi) ඔබ පත්වීම් ලැබීමට සුදුසුකම්ලත් භාෂා මාධ්‍යය වනුයේ, ඔබ විසින් අයදුම්පතේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍යය වේ.

**06. අයදුම් කළයුතු ක්‍රමය :**

(අ) අයදුම්කරුවන් මේ සමග ඇති ආදර්ශ අයදුම්පත අනුව පිළියෙළ කර අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ “සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයෙහි කළමනාකරණ සහකාර තාක්ෂණික බණ්ඩ - 03 සේවා ගණය විදුලි වෛද්‍ය යාන්ත්‍රික තනතුර සඳහා බඳවා ගැනීම (විවෘත) - 2026” යනුවෙන් සඳහන් කර 2026.10.12 දිනට පෙර “ලේකම්, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය, පාලන 07 ශාඛාව, අංක 106, ඩඩ්ලි සේනානායක මාවත, කොළඹ 08” යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

(ආ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය: 2026.10.12

(ඇ) විභාග ගාස්තුව රු. 1000.00 කි. ලංකා බැංකුවේ තැප්‍රොබේන් ශාඛාවේ සෞඛ්‍ය ලේකම් නමින් ඇති ගිණුම් අංක 7041318 ගිණුමට බැරවන පරිදි මෙම මුදල ඕනෑම ලංකා බැංකු ශාඛාවකට ගෙවා ලබාගත් රිසිට්පත ආදර්ශ අයදුම්පතෙහි දක්වා ඇති කොටුව තුළ නොගැළවෙන සේ ඇලවිය යුතු ය. විභාග ගාස්තු කුමන හේතුවක් නිසා හෝ ආපසු ගෙවීමක් හා වෙනත් විභාගයක් හෝ කරුණක් සඳහා වලංගු සේ සලකා කටයුතු කරනු නොලැබේ. තව ද, අයදුම්පත්‍රයේ සහ මුදල් ගෙවන ලද රිසිට්පතෙහි පිටපතක් ළඟ තබා ගැනීම සුදුසු ය. (මුදල් ඇනවුම් හා මුද්දර භාර ගනු නොලැබේ.)

(ඈ) අයදුම්පත පිළියෙළ කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්වල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්වල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද, සඳහන් කළ යුතු ය.

(ඉ) අයදුම්පත් එවීමෙන් පසුව ඒ සම්බන්ධව සිදුවන වෙනස් වීම් කිසිවක් පිළිබඳව සලකා බලනු නොලැබේ.

**07. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :**

විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත;
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය;
III. වලංගු ශ්‍රී ලාංකීය රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග ශාලාවට ඇතුළුවීමේ දී අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාව වෙත ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාවය සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාව වෙත ඇතුළත් කර නොගැනේ. තවද, විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය. ඊට අමතරව විභාගය සම්බන්ධයෙන් අවශ්‍ය විය හැකි වෙනත් උපදෙසක් වෙතොත් ඒ බව විභාග ප්‍රවේශ පත්‍රය මගින් ඔබට දන්වනු ලැබේ. විභාගය සම්බන්ධව වූ මෙම නියමයන්ට පටහැනිව කටයුතු කරන අයදුම්කරුවන් විභාග ශාලාව තුළට ඇතුළුකර නොගැනීම/විභාග ශාලාවෙන් ඉවත් කිරීමේ බලය විභාග ශාලාධිපති සතු වේ.

08. අත්සන සහතික කිරීම:

රජයේ පාසලක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ /අධ්‍යාපන පරිපාලන සේවයේ

/රජයේ ගණකාධිකාරි සේවයේ/ රු. 854,880/-කට වැඩි මූලික වාර්ෂික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ විසින් අයදුම්කරුගේ /අයදුම්කාරියගේ අත්සන සහතික කර තිබිය යුතු ය.

**09. සාවද්‍ය තොරතුරු සැපයීම :**

අයදුම්පත්‍රය පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයකු සපයා ඇති යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව ඕනෑම අවස්ථාවක දී අනාවරණය වුවහොත් ඊට අදාළ නෛතික ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

**10. විභාග කොන්දේසි :**

(i) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් 2026.10.12 දිනට සම්පූර්ණ කර තිබිය යුතුය. නියමිත සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන් විභාගයෙන් ප්‍රමාණවත් ලකුණු මට්ටමක් ලැබුව ද, පත්වීම් ලැබීමට නුසුදුස්සෝ වෙති.

(ii) මේ සමග ඇති ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(iii) අයදුම්පත් ලැබුණු බව දන්වා එවනු නොලබන අතර ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

(iv) *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් තරග විභාගයට කැඳවනු ලබන අතර ඒ බව අයදුම්පතෙහි සඳහන් ලිපිනයට දැනුම් දෙනු ලැබේ.

(v) බඳවා ගැනීමේ තරග විභාගය, ලිඛිත විභාගය සහ ප්‍රායෝගික වෘත්තීය පරීක්ෂණය වශයෙන් කොටස් දෙකකින් සමන්විත වේ.

(vi) පළමුව ලිඛිත පරීක්ෂණය පවත්වන අතර ඉන් සමත් වන අයදුම් කරුවන් අතරින් ඔවුන් ලබා ගන්නා ලද ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව මෙන් දෙගුණයක් ප්‍රායෝගික වෘත්තීය පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. ප්‍රායෝගික වෘත්තීය පරීක්ෂණයෙන් සමත් අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයේ දී ලබා ගත් ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙලට සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. ඒ අතරින් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් තෝරාගනු ලබන අතර එසේ තෝරා ගන්නා ලද අයදුම්කරුවන් සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය සහ ඒ යටතේ පවතින රෝහල් හා ආයතනවල පුරප්පාඩු සඳහා පත් කිරීමට නියමිතය.

(vii) විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයන් කැමති එක් භාෂා මාධ්‍යයකින් විභාගයට පෙනී සිටිය හැකි අතර ඉල්ලුම් කරනු ලබන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. අපේක්ෂකයන් මෙම විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පමණක් පිළිතුරු දිය යුතු ය.

*සැලකිය යුතුය:-*

(*අ*) අයදුම්පතේ සෑම වගන්තියක්ම සම්පූර්ණ කර ඇති බව හා එම තොරතුරුවල නිවැරදි බව පිළිබඳ සහතික විය යුතු ය.

(*ආ*) අයදුම්පතට කිසියම් ලියවිලි ඉදිරිපත් කරන ලෙස දන්වන අවස්ථාවල දී අදාළ ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂයකයාගේ අයදුම්පත් ගැන සලකා බලනු නොලැබේ. එසේ නොමැතිව අයදුම්පත්‍රයට කිසිසේත් සම්බන්ධ නොවන ලියවිල්ලක් හෝ එහි පිටපතක් නොඇමිණිය යුතු ය.

(*ඇ*) අයදුම්පතක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා අයදුම්පත් ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ - හානි අයදුම්කරුවන් විසින්ම දරාගත යුතු ය.

(ඈ) සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන සංඛ්‍යාව, තනතුරු සඳහා පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම් ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධරයා විසින් තීරණය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

(ඉ) මෙම තනතුර සඳහා බඳවා ගැනීම් සම්බන්ධයෙන් මෙම *ගැසට්* නිවේදනයෙන් ආවරණය වන හෝ නොවන යම් කරුණක් සම්බන්ධයෙන් ගැටලු සහගත තත්ත්වයක් ඇති වුවහොත් ඒ පිළිබඳව සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වනු ඇත. එසේම සිංහල,

දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් හෝ පරස්පරතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනය අනුව කටයුතු කරනු ලැබේ.

**විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ,**
ලේකම්,
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය.

2026 අගෝස්තු මස 28 වැනි දින,
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය,
"සුවසිරිපාය",
අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

**සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය**

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයෙහි කළමනාකරණ සහකාර තාක්ෂණික බණ්ඩ - 03 සේවා ගණය විදුලි වෛද්‍ය යාන්ත්‍රික තනතුරේ III වන ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය: ☐ ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය : ☐
(සිංහල - S, දෙමළ - T, ඉංග්‍රීසි - E)
(අදාළ ඉංග්‍රීසි අක්ෂරය කොටුව තුළ ලියන්න)

**01.**

(i) මුලකුරු සමග නම :-
……………………………………………………………………………………………......……………………….........
(සිංහලෙන් / දෙමළෙන්)

(ii) සම්පූර්ණ නම:-.......................................................................................................................................
.......................................................................................................................................
(සිංහලෙන්/දෙමළෙන්)

(iii) මුලකුරු සමග නම :- Mr./Mrs./Miss
.......................................................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා :- Mr./~~Mrs./Miss.~~ SILVA A.B.

(iv) සම්පූර්ණ නම :- .......................................................................................................................................
.......................................................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

**02.** **පදිංචි ලිපිනය :**

I. ස්ථිර පදිංචි ලිපිනය:-.......................................................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

II. ස්ථිර පදිංචි ලිපිනය:-.......................................................................................................................................
(සිංහලෙන්/දෙමළෙන්)

03. උපන් දිනය :-

| වර්ෂය : | | | | | මාසය : | | | දිනය : | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|

3.1 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :-

| අවු. : | | | මාස : | | | දින : | | |
|---|---|---|---|---|---|---|---|---|

04. ජාතික හැඳුනුම්පත් අංකය :-..............................................................................

05 දුරකතන අංකය : පෞද්ගලික (ජංගම):-.................................... වට්ස්ඇප් :- ................................

06 විද්‍යුත් ලිපිනය :- ........................................................................................................................

07 ස්ත්‍රී / පුරුෂ භාවය :- ස්ත්‍රී ☐ පුරුෂ ☐

08 ශ්‍රී ලංකා පුරවැසියෙකුද යන්න බව :- ඔව් ☐ නැත ☐

09 විවාහක / අවිවාහක බව:-.....................................................................................

10. *අධ්‍යාපන සුදුසුකම් :-*

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය:

වර්ෂය :-........... විභාග අංකය :-........................

| *අ/අ* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |
| 05 | | |
| 06 | | |
| 07 | | |
| 08 | | |
| 09 | | |
| 10 | | |

*(ඈ) වෘත්තීය හා කාර්මික සුදුසුකම් පිළිබඳ විස්තර :*

| *සහතිකය* | *නිකුත් කළ ආයතනය* | *වර්ෂය* | *විෂයයන්* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

(වෘත්තීය හා කාර්මික සුදුසුකම්වලට අදාළ සහතිකවල සහතික කරන ලද පිටපත් අමුණන්න.)

*(ඇ) වෙනත් විශේෂ සුදුසුකම් හා පළපුරුද්ද:*

..........................................................................................................................................................
..........................................................................................................................................................

*11. සේවා ඉතිහාසය :*

I. මෙයට පෙර රාජ්‍ය සේවයේ තනතුරක් දරා තිබේද:-.......................................................

II. ඔව් නම් එම තනතුර :- .....................................................

III. සේවා ස්ථානය :- .....................................................
IV. පත්වීම් දිනය :- .....................................................
V. ඉවත් වූ දිනය :- .....................................................
VI. ඉවත් වීමට හේතුව :- .....................................................

12. ඔබ යම්කිසි සාපරාධී වරදකට කෙදිනක හෝ උසාවියකදී වරදකරු වී තිබේද?

(ඔව් නම් විස්තර සපයන්න):-..........................................................................................................................................
..........................................................................................................................................

*13. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තරය :-*

I. විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :-.........................................................................................
II. ගෙවූ මුදල :-..........................................................................................................................

| |
|---|
| *ලංකා බැංකු ශාඛාවකට රු. 1000.00 මුදල ගෙවා ලබා ගත් රිසිට්පත නොගැළවෙන සේ මෙහි අලවන්න (අයදුම්පතෙහි සහ ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම මතු ප්‍රයෝජනවත් වනු ඇත.)* |

***14. අයදුම්කරුගේ සහතිකය:***

මෙම අයදුම්පතෙහි මා විසින් සඳහන් කරන ලද තොරතුරු සත්‍ය වූත් හා නිවැරදි වූත් තොරතුරු බටවට ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි ඇතුළත් යම් කිසි විස්තරයක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව සොයා ගනු ලැබුවහොත් එසේ සොයා ගන්නා ලද්දේ තෝරා ගැනීමට පෙර නම් එම අයදුම්පත අවලංගු වන බව ද, තෝරා ගැනීමෙන් පසුව නම්, යම් කිසිම වන්දියක් නොමැතිව හා ඊට අදාළ නෛතික ක්‍රියාමාර්ගයන්ට යටත්ව මම සේවයෙන් පහකරනු ලබන බව ද පිළිගනිමි.

දිනය :-..........................................

............................................................,
අයදුම්කරුගේ අත්සන.

***15. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :***

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ............................................................ මයා/මිය/මෙනෙවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවද, ඔහු / ඇය මා ඉදිරිපිටදී........................... දින ඔහුගේ / ඇයගේ අත්සන තැබූ බවද සහතික කරමි.

...............................................................................,
සහතික කරන නිලධාරියාගේ අත්සන.

සහතික කරන ලද නිලධාරියාගේ,
සම්පූර්ණ නම :-........................................................
තනතුර :-........................................................
ලිපිනය :-........................................................
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

16. දැනට රාජ්‍ය සේවයේ, පළාත් රාජ්‍ය සේවයේ කටයුතු කරන *ගැසට්* නිවේදනයේ දක්වා ඇති මූලික සුදුසුකම් සපුරා ඇති නිලධාරින්ට පමණක් පහත කරුණු අදාළ වේ.

16.1 දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියා විසින් සම්පූර්ණ කළ යුතු විස්තරය :

i. නිලධාරියාගේ නම :- ..........................................................................................

ii. ස්ථිර සේවා ස්ථානය හා ලිපිනය :-.........................................................................

iii. ස්ථිර සේවා ස්ථානයේ දුරකතන අංකය :- ...............................................................

iv. නිලධාරියාගේ ජාතික හැඳුනුම්පත් අංකය :- ..........................................................

v. විභාගයට අයදුම්කරන අවස්ථාවේ දී දරන තනතුර :- ...............................................

vi. එම තනතුරට පත්වීම් ලැබූ දිනය :- .......................................................................

vii. එම තනතුරේ ස්ථිර කර තිබේද? ("ඔව්" නම් ස්ථිර කරන ලද දිනය සඳහන් කරන්න) ......................................... .................................................................................................

viii. සේවා කාලය තුළදී විනයානුකූල දඬුවම් ලබා තිබේද? ("ඔව්" නම් ඒ පිළිබඳ විස්තර ඇතුළත් කරන්න) .......................................................................................................................

ix. මේ වන විට විනයානුකූලව දඬුවමකට යටත් කොට තිබේද? ("ඔව්" ඒ පිළිබඳ විස්තර ඇතුළත් කරන්න) .......................................................................................................................

x. දැනට විනයානුකූල පරීක්ෂණ පැවැත්වෙන්නේද? ("ඔව්" ඒ පිළිබඳ විස්තර ඇතුළත් කරන්න) .......................................................................................................................

මෙම අයදුම්කරු වන .......................................... මයා / මිය / මෙනවිය ආයතනයේ ......................... වැනි දින සිට ............................. (තනතුර සඳහන් කරන්න) සේවය කරයි. ඔහු/ඇය ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරයි. ඉහත 16 කරුණ යටතේ සඳහන් කර ඇති සියල්ල මෙම කාර්යාලයේ ඇති වාර්තා අනුව පරීක්ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත් ඔහු / ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් දැනට දරන තනතුරින් මුදා හරින / නොහරින බවත් මෙයින් සහතික කරමි.

.........................................................................................,

දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :- ..........................................................................
පදවි නාමය :- .................................................................
දිනය :- .........................................................................
දෙපාර්තමේන්තුව / ආයතනය :- .......................................
(රබර් මුද්‍රාවෙන් සනාථ කරන්න)

09 - 87

---

## අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

### පරිවෙණාචාර්යවරුන්, රජයේ අනුමත පෞද්ගලික පාසල්වල අනුමත පත්වීම්ධාරී ගුරුවරුන් සහ උපකෘත විශේෂ පාසල්වල අනුමත පත්වීම්ලාභී ගුරුවරුන් සඳහා III වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2026

1.0 ඉහත සඳහන් සේවාවන්ට අයත් නිලධාරීන් සඳහා අංක 2444/21 හා 2025.07.08 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් පළ කර ඇති ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාවේ තෙවන සංශෝධනය සහ අංක 2493/61 හා 2026.06.19 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් පළ කර ඇති ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාවේ සිව්වන සංශෝධනයේ විධිවිධානයන්ට අනුකූලව III වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් 2026 දෙසැම්බර් මස පවත්වනු ලබන බවත් ඉහත විභාගය සඳහා පිරිවෙන්වල සේවය කරනු ලබන පරිවෙණාචාර්යවරුන්, රජයේ අනුමත පෞද්ගලික

පාසල්වල අනුමත පත්වීම්ධාරී ගුරුවරුන් සහ උපකෘත විශේෂ පාසල්වල අනුමත පත්වීම්ලාභී ගුරුවරුන්හට පෙනී සිටීමට අවස්ථාව සලසා දෙන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. මෙම විභාගය උපලේඛනය I හි සඳහන් නගරවල පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානවල දී පමණක් පැවැත්වෙන අතර ඉල්ලුම් කරන ලද නගරය / නගර පසුව වෙනස් කිරීමට ඉඩ ලබා දෙනු නොලැබේ. කිසියම් නගරයක විභාග මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම් කර නොමැති නම් එම අයදුම්කරුවන් ඔවුන්ගේ දෙවන මනාපය ලෙස දක්වන ලද නගරයේ හෝ ආසන්න වෙනත් නගරයක හෝ පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කරනු ලැබේ. තව ද යෝජිත නගර සියල්ලෙහිම හෝ වැඩි ගණනක හෝ විභාග මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම් කර නොමැති නම් විභාගය කොළඹ දී පමණක් පැවැත්වීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් කටයුතු කරනු ඇත.

අයදුම්පත් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ " Our Services" යටතේ ඇති " Online Applications– Recruitment/E.B. Exams" ඔස්සේ පළකර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම 2026 සැප්තැම්බර් මස 14 වැනි දින පෙ.ව. 09.00ට විවෘත වන අතර 2026 සැප්තැම්බර් මස 30 වැනි දින ප.ව. 09.00ට අවසන් වේ. අයදුම්පත මාර්ගගතව යොමු කළ පසු එය බාගත කර මුද්‍රිත පිටපත් දෙකක් (02) ලබාගෙන එම පිටපත් දෙකෙහි අදාළ කොටස් අත් අකුරින් පුරවා අයදුම්කරුගේ අත්සන සහතික කර, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ සහතිකය සමග ඉන් එක් පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කළ යුතු ය. අනෙක් පිටපත අවශ්‍ය විටක ඉදිරිපත් කිරීම සඳහා තමන් භාරයේ තබා ගත යුතු ය.

අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරාගත යුතු ය.

2.0

I. මෙම විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ.

II. විභාග අපේක්ෂකත්වය ලැබීම සඳහා පනවා ඇති නීති *ගැසට් පත්‍රයේ* වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුන්ට සිදුවනු ඇත.

III. මෙම විභාගය සඳහා අයදුම් කළ හැක්කේ ඉහත සඳහන් සේවාවන්වල පහත 12.0 මගින් දක්වන ලද නිලධාරින්ට පමණි.

IV. මෙම විභාගය සඳහා විශේෂ අවශ්‍යතා සහිත අයදුම්කරුවන් ඉදිරිපත් වන්නේ නම් ඒ බව අයදුම්පතේ අනිවාර්යයෙන් සඳහන් කළ යුතු අතර අදාළ වෛද්‍ය සහතිකවල පිටපත් අයදුම්පතේ මුද්‍රිත පිටපතක් සමඟ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය.

3.0 විභාග ගාස්තු:-

මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගය පළමු වරට පවත්වනු ලබන බැවින් ගාස්තු අයකරනු නොලැබේ.

***4.0 අයදුම්පත් යොමු කිරීම:-***

මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව/භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකතන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (E -mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාග සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේ දී එම උපදෙස් නිවැරදිව පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5.0 විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලේඛන පමණක් වලංගු වේ.

I. ජාතික හැඳුනුම්පත;
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය;
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ ආවරණය කිරීමෙන් තොරව හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව සනාථ කර ගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. ඊට එකඟ නොවන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

6.0 *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත.

විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව වෙබ් නිවේදනයක් මඟින්/ අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මගින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් වෙබ් නිවේදනයේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් වෙබ් නිවේදනයේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපත ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතු ය. විභාග ශාලාවේදී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

7.0 අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ අදාළ කාර්යක්ෂමතා කඩඉම් අවශ්‍යතාව සම්පූර්ණ කර ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

8.0 විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කරවා ගත යුතු ය. එවැනි ප්‍රවේශ පත්‍රයක් නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

9.0 විභාග අයදුම්කරුවන් තමන්ට නියම කරන විභාග මධ්‍යස්ථානයේ දී විභාගයට පෙනී සිටිය යුතු ය.

10.0 විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශ පත්‍ර ඇති නිලධාරීන්ට විභාගයට පෙනී සිටීමට හැකි වන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් අවශ්‍ය පරිදි රාජකාරි නිවාඩු ලබා දිය යුතු ය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

11.0 විභාගය පැවැත්වෙන්නේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් පමණි. ඒ අතුරින් තම පත්වීම් විෂයයට අදාළ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැකි අතර, පෙනී සිටින සෑම ප්‍රශ්න පත්‍රයකටම පිළිතුරු සැපයිය යුත්තේ එකම මාධ්‍යයෙනි. අයදුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

12.0 ඉහත සේවාවන්වල 2 පන්තියේ I ශ්‍රේණියට උසස් වී වසර හතරක් (04) ගතවීමට පෙර III වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සම්පූර්ණ කළ යුතු ය. එම නිලධාරීන්ට අමතරව, 2-I ශ්‍රේණියට උසස්වීම් ලබා වසර 4 ක් ඉක්මවා ගිය ද 2025.06.30 දිනෙන් පසු I වන ශ්‍රේණි උසස්වීම් යෙදෙන ගුරුවරුන් ද I ශ්‍රේණියට උසස්වීම් ලැබීම සඳහා III වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ අවශ්‍යතාව සම්පූර්ණ කළ යුතු වේ.

13.0 විභාග පරිපාටිය -

13.1 ප්‍රශ්න සැකැස්ම :

අධ්‍යාපන විෂයභාර අමාත්‍යාංශය විසින් e-thaksalawa නිල වෙබ් අඩවියේ පළ කරන ලද පහත 13.2හි දක්වා ඇති ස්වයං අධ්‍යයන මොඩියුල සම්බන්ධ විෂය නිර්දේශය ආශ්‍රයෙන් සකස් වේ. මෙම කාර්යක්ෂමතා කඩඉම සඳහා වන ලිඛිත පරීක්ෂණය එම අදාළ මොඩියුල සියල්ලම ආවරණය වන සේ පහත පරිදි පැවැත්වේ.

| *ව්‍යුහය* | *ප්‍රශ්න සැකැස්ම* | *කාලය* | *ලකුණු* |
|---|---|---|---|
| I පත්‍රය | බහුවරණ | පැය 01 | 40 |
| II පත්‍රය | ව්‍යුහගත ප්‍රශ්න හෝ අර්ධ ව්‍යුහගත ප්‍රශ්න | පැය 02 | 60 |

*සටහන 1* - I පත්‍රය ලෙස විෂයානුබද්ධ දැනුම I පත්‍රය නිකුත් කරන අතර එය බහුවරණ ප්‍රශ්න 40 කින් යුක්ත වේ. II පත්‍රය ලෙස විෂයානුබද්ධ දැනුම II පත්‍රය නිකුත් කරන අතර එය අර්ධ ව්‍යුහගත ප්‍රශ්න 04 කින් සමන්විතය. එම ප්‍රශ්න පත්‍ර දෙකෙහිම අන්තර්ගත ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.

13.2 විභාගය සඳහා විෂය නිර්දේශය

| *කාර්යක්ෂමතා කඩඉම* | *අදාළ වන මොඩියුල* | |
|---|---|---|
| III වන කාර්යක්ෂමතා කඩඉම | 1. | කායික හා මානසික යහපැවැත්ම |
| | 2. | විසි එක්වන සියවසේ පාසල |
| | 3. | ක්‍රියාමූලික පර්යේෂණ |

***සටහන 2*** - සාමාර්ථය සඳහා ඉහත 13.1 වගුව මගින් දක්වන ලද I පත්‍රයේ සහ II පත්‍රයේ ලකුණුවල

මුළු එකතුව 40% ක් හෝ ඊට වැඩිවන සේ ලබාගත යුතු ය.

14.0 විභාග ප්‍රතිඵල නිකුත් කිරීම :- විභාග ප්‍රතිඵල නිකුත් කිරීමේ ක්‍රමවේදය පහත පරිදි වේ.

I. විභාගයට පෙනී සිටින සියලුම අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල පළාත් අනුව වෙන් වෙන් වශයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පිටපත් දෙකක් අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කරනු ලබයි.

II. අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කරනු ලබන එකී විභාග ප්‍රතිඵල ලේඛන පිටපත් දෙකෙන් එක් පිටපතක්; අදාළ ගුරුවරුන්ගේ විභාග ප්‍රතිඵල සත්‍යාපනය කිරීමට හැකිවන පරිදි පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් කටයුතු කරනු ලැබේ.

III. එසේම, ඉහත සඳහන් සේවාවන්වල නිලධරයන්ගේ පත්වීම ස්ථිර කිරීමට හා ශ්‍රේණි උසස්වීම්වලට අදාළ වන කාර්යක්ෂමතා කඩඉම් විභාග ප්‍රතිඵල, විභාග දෙපාර්තමේන්තුව විසින් අයදුම්කරුට ද බාගත කිරීමට අවස්ථාව සලසා දෙනු ලැබේ. එසේ බාගත කර ගන්නා ප්‍රතිඵල ලේඛනය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත අයදුම්කරු විසින් ඉදිරිපත් කළ යුතු අතර, එම ප්‍රතිඵල ලේඛන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය/පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙතින් සත්‍යාපනය කරගෙන අදාළ නිලධරයාගේ පුද්ගලික ලිපි ගොනුවට ඇතුළත් කළ යුතු ය.

IV. එකී සත්‍යාපනය කරන ලද ප්‍රතිඵල පදනම් කරගෙන පළාත්/කලාප අධ්‍යාපන බලධරයන් විසින් අදාළ ගුරුවරුන්ගේ පත්වීම ස්ථිර කිරීම හා ශ්‍රේණි උසස් කිරීම සඳහා අදාළ කටයුතු කළ යුතු වේ.

V. විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ.

15.0 මෙම විභාග නිවේදනය මගින් විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුව ද අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

16.0 සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේනම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

**නාලක කලුවැව,**
ලේකම්,
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ
වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය.

2026 සැප්තැම්බර් මස 02 වැනි දින,
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය,
"ඉසුරුපාය"
බත්තරමුල්ල.

**උපලේඛනය I**

| *දිස්ත්‍රික්කය / නගරය* | *දිස්ත්‍රික් / නගර අංකය* |
|---|---|
| කොළඹ | 01 |
| ගම්පහ | 02 |
| කළුතර | 03 |
| මහනුවර | 04 |
| මාතලේ | 05 |
| නුවරඑළිය | 06 |
| ගාල්ල | 07 |
| මාතර | 08 |
| හම්බන්තොට | 09 |
| යාපනය | 10 |
| මන්නාරම | 11 |
| වවුනියාව | 12 |
| මුලතිව් | 13 |
| කිලිනොච්චිය | 14 |
| මඩකලපුව | 15 |
| අම්පාර | 16 |
| ත්‍රිකුණාමලය | 17 |
| කුරුණෑගල | 18 |
| පුත්තලම | 19 |
| අනුරාධපුරය | 20 |
| පොළොන්නරුව | 21 |
| බදුල්ල | 22 |
| මොනරාගල | 23 |
| රත්නපුර | 24 |
| කෑගල්ල | 25 |

09 - 89

## විගණන සේවා කොමිෂන් සභාව

### ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ ක්ෂේත්‍රගත / කාර්යාලගත සේවා ගණයේ III පන්තියේ II ශ්‍රේණියේ විගණන නිලධාරි තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2366/31 හා 2024 ජනවාරි 12 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයෙන්* ප්‍රසිද්ධ කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 7.2 වගන්තියේ විධිවිධාන අනුව ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ ක්ෂේත්‍රගත / කාර්යාලගත සේවා ගණයේ III පන්තියේ II ශ්‍රේණියේ විගණන නිලධාරි තනතුරු **පුරප්පාඩු 244ක්** සඳහා සුදුස්සන් තෝරා ගැනීමට විවෘත තරග විභාගයක් පවත්වනු ලබන අතර, මෙම නිවේදනයේ දක්වා ඇති පරිදි අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

*විභාග දිනය.-* විභාග කොමසාරිස් ජනරාල් විසින් **2026 දෙසැම්බර් මස** කොළඹ දී විභාගය පවත්වනවා ඇත. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට හෝ විගණන සේවා කොමිෂන් සභාවට බලය ඇත.

අංක අමප/25/1174/802/004-VII හා 2025 ජූලි 15 දිනැති "රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සහ කාර්යමණ්ඩල කළමනාකරණය" මැයෙන් වූ අමාත්‍ය මණ්ඩල තීරණ දැනුම්දීම පරිදි මෙම විවෘත පදනම මත බඳවා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇති අතර, බඳවා ගන්නා අවස්ථාවේදී පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගනු ලබන සංඛ්‍යාව සහ පත්වීම ක්‍රියාත්මක වන දිනය විගණන සේවා කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ඇත. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට විගණන සේවා කොමිෂන් සභාවට බලය ඇත.

අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ "Our Services " යටතේ ඇති "Online Application – Recruitment Exams/ E.B Exams" ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2026 සැප්තැම්බර් මස 14** වැනි දින **පෙ.ව. 9.00** ට විවෘත වන අතර **2026 ඔක්තෝබර් මස 12** වැනි දින ප.ව. 9.00ට අවසන් වේ.

**1. සේවා කොන්දේසි**

(i) සාමාන්‍ය *ගැසට් පත්‍රයේ* I වන කොටස II (ආ) වන ඡේදයේ ආරම්භයේ පළ කර ඇති රජයේ සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද අංක 2366/31 හා 2024 ජනවාරි මස 12 වන දින දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති කොන්දේසිවලට ද එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතු කෙරෙන සංශෝධනවලට ද අංක අමප/25/1174/802/004-VII හා 2025 ජූලි 15 දිනැති "රාජ්‍ය සේවයේ බඳවා ගැනීමේ ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සහ කාර්ය මණ්ඩල කළමනාකරණය" සම්බන්ධයෙන් වූ අමාත්‍ය මණ්ඩල තීරණ දැනුම් දීමට ඇතුළත් කොන්දේසිවලට ද යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයන් ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ III පන්තියේ II ශ්‍රේණියේ විගණන නිලධාරි තනතුරට පත්කරනු ලැබේ.

(ii) මෙම තනතුර ස්ථිර සහ විශ්‍රාම වැටුප් සහිත ය. තව ද ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

(iii) තනතුරට බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලබන අපේක්ෂකයන් පත් කරනු ලබන දින සිට තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්ව මෙම සේවයට පත් කරනු ඇත.

(iv) තනතුරට පත්කරනු ලබන අපේක්ෂකයන් ඔවුන්ගේ පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කිරීම, පහත සඳහන් කරුණු මතද රඳා පවතී:-

(අ) වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක වීම.

(ආ) පරිවාස කාලය අවසන් වීමට මත්තෙන් කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත් වීම.

(v) පරිවාස කාලපරිච්ඡේදය අවසානයේ දී තනතුරුවල ස්ථිර කරනු ලැබීමට අපොහොසත් වුවහොත් ඔහුගේ/ඇයගේ සේවය අවසන් කිරීමට සිදුවනු ඇත.

(vi) 2020 ඔක්තෝබර් 16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා ඊට ආනුෂංගික චක්‍රලේඛවල සඳහන් විධිවිධාන පරිදි රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතු ය.

(vii) තෝරා ගනු ලබන නිලධාරින් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමේ කොන්දේසියට යටත් වේ.

(viii) විගණන සේවා කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවය සම්බන්ධයෙන් පනවනු ලබන සියලු රීති, රෙගුලාසි, නියෝග හා කාර්ය පටිපාටිවලට අනුගතව ඔබ රාජකාරී වගකීම්

හා යුතුකම් ඉටුකළ යුතු වේ. එසේ ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද රජයේ මුදල් රෙගුලාසිවලට ද රජයේ වෙනත් රෙගුලාසි , චක්‍රලේඛ හා උපදෙස්වලට ද ඒවාට අදාළව වරින්වර නිකුත් කරනු ලබන සංශෝධනවලට ද ඔබ යටත්විය යුතුවේ. කෙසේ නමුත් විගණන සේවා කොමිෂන් සභාව විසින් කාර්ය පටිපාටික රීති පනවන තෙක් අංක 2310/29 දරන 2022 දෙසැම්බර් 14 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකර ඇති රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති මෙම කොමිෂන් සභාවේ කාර්යය සඳහා කාර්ය පටිපාටික රීති ලෙස බලාත්මක වනු ඇත. විගණන සේවා කොමිෂන් සභාව හා ජාතික විගණන කාර්යාලය විසින් වරින් වර නිකුත් කරනු ලබන චක්‍රලේඛ, උපදෙස් හා නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

2. **වැටුප් පරිමාණය.-** 2025.03.25 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන II අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු. 64,610- 10 x 1,190 - 11 x 1,360 - 15 x 1,670 - රු.116,520/- වේ. ඒ අනුව මෙම තනතුරට හිමි වැටුප් කේතය AS 01 - 2025 වන අතර ආරම්භක වැටුප් පියවර රු.64,610/- වේ. (2027.01.01 දින තෙක් ඔබට වැටුප් ගෙවනුයේ එම චක්‍රලේඛයේ උපලේඛන III අනුව ය.) මෙයට අමතරව තනතුරට අදාළ වන පරිදි රජය විසින් අනුමතකර ඇති අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ.

3. **ශාරීරික යෝග්‍යතාව.-** ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටුකිරීමට ප්‍රමාණවත් කායික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත වීම.

4. **සුදුසුකම්**

**(i). අධ්‍යාපන සුදුසුකම් -**

ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 7.2.1.1.1 වගන්තියේ සඳහන් පහත සුදුසුකම්වලින් එකක් ලබා තිබිය යුතු ය:-

***(අ) සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 7.2.1.1.1 (අ) අනුව,***

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධිය ප්‍රදානය කෙරෙන ආයතනයක් වශයෙන් පිළිගෙන ඇති ආයතනයකින් හෝ පිරිනමනු ලබන ගණකාධිකරණය හෝ විගණනය ප්‍රධාන විෂයයක් ලෙස ඇතුළත්ව තිබෙන මතු දැක්වෙන උපාධියක් ලබා තැබීම. ගණකාධිකරණය, වාණිජ්‍යය, ව්‍යාපාර / රාජ්‍ය කළමනාකරණයට අදාළ උපාධියක්;

*හෝ*

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ ආවසරික II හෝ අන්තර්මාධ්‍ය පරීක්ෂණය හෝ ගිණුම්කරණය හා ව්‍යාපාර සහතිකය II හෝ ව්‍යාපාර අදියර විභාගය හෝ ව්‍යාපාර අදියර II විභාගය හෝ ඊට වඩා ඉහළ පරීක්ෂණයකින් හෝ සමත් වී සිටීම;

*හෝ*

ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරි ආයතනයේ කළමනාකරණ මට්ටම හෝ ඊට වඩා ඉහළ මට්ටමක පරීක්ෂණයකින් සමත් වී සිටීම;

*හෝ*

ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ / ශ්‍රී ලංකා උසස් කාර්මික අධ්‍යාපන ආයතනයේ / ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ ගණකාධිකරණය හෝ වාණිජ්‍යය පිළිබඳ උසස් ඩිප්ලෝමාලාභියකු හෝ උසස් ජාතික කළමනාකරණ ඩිප්ලෝමාලාභියකු වීම;

*හෝ*

**(*ආ*) සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 7.2.1.1.1 (ආ) අනුව,**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධිය ප්‍රදානය කෙරෙන ආයතනයක් වශයෙන් පිළිගෙන ඇති ආයතනයකින් හෝ පිරිනමනු ලබන, තක්සේරුකරණය / තොරතුරු තාක්ෂණය / පරිගණක විද්‍යාව / පරිගණක ඉංජිනේරු විද්‍යාව / පරිගණක තාක්ෂණය යන උපාධියක් ලබා තිබීම.

***සටහන 1 .-*** ඉහත සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 7.2.1.1.1 (ආ) අනුව තෝරාගනු ලබන්නේ බඳවාගනු ලබන විගණන නිලධාරි සංඛ්‍යාවෙන් 10% ක උපරිමයකට යටත්වය. මෙම විභාගයේදී තරග කරන අපේක්ෂකයන් තම තමන්ගේ අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික සහ සෙසු ලියවිලි විගණන

සේවා කොමිෂන් සභාව විසින් ඉල්ලූ වහාම ඉදිරිපත් කිරීම සඳහා සූදානම්ව තබා ගත යුතු ය. විභාගයක ප්‍රතිඵල අපේක්ෂාවෙන් ඉල්ලුම් කළ නොහැකි ය.

*සටහන 2 .-* අපේක්ෂකයෙකු සුදුසුකම් ලබා ඇති සේ සලකනු ලබනුයේ ඔහු/ ඇය විසින් -

(*අ*) විභාගය ඉල්ලුම් කිරීම සඳහා, සුදුසුකම් ලෙස දක්වා ඇති විභාගය හෝ විභාග අයදුම්පත් භාර ගන්නා අවසාන දින වන විට සෑම ආකාරයකින්ම සාර්ථක ලෙස සම්පූර්ණ කර ඇත්නම්; සහ

(*ආ*) සුදුසුකම් පිළිබඳ නිල සහතිකයක් හෝ එම සහතිකය වෙනුවෙන් විගණන සේවා කොමිෂන් සභාව විසින් පිළිගන්නාවූ නිල ලේඛනයක් හෝ සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කර ඇත්නම් පමණි.

**(ii).** වයස - අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය වන **2026 ඔක්තෝබර් 12** දිනට, වයස අවුරුදු 22 ට නොඅඩු හා වයස අවුරුදු 28 ට නොවැඩි විය යුතු අතර, (ඒ අනුව 2004.10.12 දිනට හෝ ඊට පෙර හා 1998.10.12 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් අයදුම් කිරීමට සුදුසුකම් ඇත.) රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**(iii).** වෙනත් -

සෑම අපේක්ෂකයකුම -

(i). ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම;

(ii). විශිෂ්ට චරිතයකින් යුක්ත වීම;

(iii). යම් ආගමික පැවිදිවරයක් දරන තැනැත්තකු නොවීම;

(iv). අයදුම්පත් කැඳවනු ලබන නිවේදනයේ සඳහන් අයදුම්පත් භාරගනු ලබන අවසාන දිනට සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

**5.** **විභාග ගාස්තු .-** විභාග ගාස්තුව රු. 1200/- කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම් සිදු කළ යුතු ය:-

(i.) ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank credit Card);

(ii.) අන්තර්ජාල ගෙවීම් පහසුකම් සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Card with the Facility of Internet Transactions);

(iii.) ලංකා බැංකු මාර්ගගත බැංකු ක්‍රමය/ Flex යෙදවුම මගින් (Online Banking Method/ flex App of Bank of Ceylon);

(iv.) ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Any Branch of Bank of Ceylon).

*සටහන 3 -*

(*අ*) ඉහත ක්‍රම මගින් ගෙවීම සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත;

(*ආ*) ගෙවීම ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තු සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු අතර, විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂයන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ;

(ඇ) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු කරනු නොලැබේ.

**6.** **අයදුම්කිරීමේ ක්‍රමය**

(i). මාර්ගගත (Online) විභාග අයදුම්පත් ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතු ය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද අයදුම්පත දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව/ භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (E-mail) ලිපිනයට දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේදී එම උපදෙස් නිවැරදිව පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ii). විභාග අයදුම්පතේ සඳහන් සියලුම තොරතුරුවල නිරවද්‍යතාව පිළිබඳ වගකීම අයදුම්කරු සතු වේ. සෑම ආකාරයකින්ම සම්පූර්ණ වී නැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත.

(iii). දැනට රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපි ගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානියා වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේ දී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.

(iv). අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරාගත යුතු ය.

**7. විභාගයට ඇතුළු වීම**

(i) *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් මාර්ගගතව පමණක් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් වෙබ් නිවේදනයක් මගින්/ කෙටි පණිවුඩයක් මගින් අයදුම්කරුවන් වෙත දන්වනු ලැබේ. ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් ඒ බව විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාව වෙතින්, ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම නිවැරදිව සඳහන් කරමින් විමසිය යුතු ය. ඔබගේ ඉල්ලීම වෙබ් නිවේදනයේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපත හා විභාග ගාස්තු ගෙවීමට අදාළ ලදුපතෙහි ඡායා පිටපත සූදානමින් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතු ය. විභාග ශාලාවේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

(ii) විභාගයට පෙනී සිටින අපේක්ෂකයකු තමාට නියමිත විභාග මධ්‍යස්ථානයේ දී විභාගයට පෙනී සිටිය යුතු අතර, එසේ පෙනී සිටින පළමු දිනයේ දී ම තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(iii) සෑම අපේක්ෂකයකුම අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම *ගැසට් පත්‍රයේ* පළකර ඇත.

(iv) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් නියම කරන ලද නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔවුනට සිදුවනු ඇත.

(v) විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ.

***සටහන 4 .-*** විභාග අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, එම අපේක්ෂකයා විභාගයට ඉදිරිපත් වීම සඳහා හෝ තනතුරක් දැරීම සඳහා හෝ මෙම නිවේදනය මගින් ඉල්ලා ඇති සියලුම සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

**8. අපේක්ෂකයාගේ අනන්‍යතාව**

විභාග අපේක්ෂක/ අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහා ම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන ලේඛන පමණක් වලංගු වේ:-

i. ජාතික හැඳුනුම්පත;
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය;
iii. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය,

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ ආවරණය කිරීමෙන් තොරව හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව තහවුරු කර ගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. ඊට එකඟ නොවන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

**9. සාවද්‍ය තොරතුරු සැපයීම**

අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත්, විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී, ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට කටයුතු කෙරේ. අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් ඔහු/ඇය එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළි වුවහොත් එසේ නැතිනම්, යම් වැදගත් කරුණක් ඕනෑකමින් යටපත් කර ඇති නම්, ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

**10.** අවශ්‍ය අවස්ථාවක දී මෙම නිවේදනයේ සඳහන් කර නොමැති කරුණු පිළිබඳව විගණන සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

**11. විභාග ක්‍රමය -**

(i). විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන මාධ්‍යවලින් පැවැත්වේ.

(ii). අපේක්ෂකයකු විභාගයට පෙනී සිටිය යුතු වන්නේ මෙම විභාගයට ඉල්ලුම් කිරීම සඳහා සුදුසුකම් ලත් විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ පමණි.

(iii). අපේක්ෂකයකු සුදුසුකම්ලත් විභාගයේ විෂයයන් භාෂා දෙකකින් හෝ වැඩි ගණනකින් හෝ සමත්ව ඇත්නම්, එම විභාගයේ දී ඔහු සමත් වූ විෂයයන්ගෙන් වැඩි ගණනකට යොදා ගත් භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ විභාගයට පෙනී සිටිය යුතු ය.

(iv). ප්‍රධාන විෂයයන් එක් භාෂාවකිනුත්, අතිරේක විෂයයන් තවත් භාෂාවකිනුත් සමත්වී ඇති විශේෂ උපාධියක් ඇති අපේක්ෂකයකු ප්‍රධාන විෂයයන්ට සාමාර්ථය ලත් භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවෙන් හෝ විභාගයට පෙනී සිටිය යුතු ය. විභාගයට පෙනී සිටීමට ඉල්ලුම්කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට අපේක්ෂකයින්ට ඉඩ දෙනු නොලැබේ.

*සටහන 5:*

(*අ*) ඉහත 11 හි (ii) සහ (iii) හි සඳහන් ‘සුදුසුකම් ලත් විභාග’ යන පදයෙන් අදහස් කෙරෙන්නේ 04 වැනි ඡේදයෙහි දක්වා ඇති විභාගවලින් එකක් ය.

(*ආ*) අපේක්ෂකයකු විභාගයේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු ලිවිය යුතු ය.

**12. පරීක්ෂා කිරීමේ ක්‍රමය -**

(i) ලිඛිත පරීක්ෂණයක් මගින් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි :-

| *විෂයය* | *කාලය (පැය)* | *මුළු ලකුණු* |
|---|---|---|
| 1. සාමාන්‍ය බුද්ධිය - | 1 ½ | 100 |
| 2. නිර්මාණාත්මක විශ්ලේෂණාත්මක හා සන්නිවේදන කුසලතා - | 03 | 100 |
| 3. මූල්‍ය ගණකාධිකරණය - | 03 | 100 |
| 4. විගණනය - | 03 | 100 |
| 5. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අවබෝධය - | 02 | 100 |
| 6. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කළමනාකරණය සඳහා අභියෝගතාව - | 02 | 100 |

ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ සේවා ව්‍යවස්ථාවේ 7.2.1.1.1 (අ) යටතේ අයදුම්කරන අයදුම්කරුවන් මූල්‍ය ගණකාධිකරණය හෝ විගණනය හෝ යන විෂයයන් දෙකින් යටත් පිරිසෙයින් එක් විෂයයක් සහ සාමාන්‍ය බුද්ධිය ප්‍රශ්න පත්‍රය ඇතුළුව ප්‍රශ්න පත්‍ර 03 කට පෙනී සිටිය යුතු අතර, 7.2.1.1.1 (ආ) යටතේ අයදුම් කරන අයදුම්කරුවන් සාමාන්‍ය බුද්ධිය ප්‍රශ්න පත්‍රය ඇතුළුව ප්‍රශ්න පත්‍ර 03 කට පෙනී සිටිය යුතු ය. ඔබ විභාගය සඳහා අයදුම් කරන්නේ 7.2.1.1.1(අ) අනුව ද නැතහොත් 7.2.1.1.1 (ආ) අනුව ද යන්න අයදුම්පතේ අදාළ ස්ථානයේ පැහැදිලිව සඳහන් කළ යුතු ය. එය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

ලිඛිත පරීක්ෂණයේ විෂය නිර්දේශය ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පරිශිෂ්ටය 01හි දැක්වෙන පරිදි විභාග නිවේදනයෙහි අවසානයට දක්වා ඇත.

(ii) ලිඛිත පරීක්ෂණයේ දී එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා නියමිත ලකුණු සංඛ්‍යාවෙන් සියයට 40ක අවම ලකුණු ප්‍රමාණයක් ද මුළු විභාගය සඳහා අවම වශයෙන් සියයට 50ක සාමාන්‍යයක් ද ලබා ගන්නා අපේක්ෂකයන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබීමට යෝග්‍ය වේ.

(iii) ඒ අනුව ලිඛිත පරීක්ෂණයේ ප්‍රතිඵල මත දැනුම් දෙනු ලබන දිනයක දී සමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන්නේ අයදුම්කරුවන්ගේ අධ්‍යාපන සුදුසුකම් පරීක්ෂා කිරීමට සහ සේවා වාර්තා පරීක්ෂා කර බැලීම සඳහා වන අතර, එම සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාව අවස්ථෝචිත පරිදි, ලිඛිත විභාගයේදී ඔවුන් විසින් ලබාගත් ලකුණුවල අනුපිළිවෙළ හා අදාළ පුරප්පාඩු සංඛ්‍යාව අනුව විගණන සේවා කොමිෂන් සභාව තීරණය කරන අතර සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරනු ලබන්නේ ද විගණන සේවා කොමිෂන් සභාව විසිනි.

**13. පත් කිරීම පිණිස තෝරා ගැනීමේ ක්‍රමය -**

(i). ලිඛිත පරීක්ෂණයෙන් ප්‍රශ්න පත්‍ර 03ට ලබාගත් ලකුණු අනුව ඉහළම ලකුණු ලබාගෙන ඇති අපේක්ෂකයන් තෝරාගනු ලැබේ. අපේක්ෂකයන් කිහිපදෙනකුට එකම ලකුණු ලැබී ඇත්නම් තෝරා ගැනීම පිළිබඳ අවසාන තීරණය විගණන සේවා කොමිෂන් සභාව සතු වේ.

(ii). විගණන නිලධාරි තනතුරේ පුරප්පාඩුවලින් 10%ක උපරිමයකට යටත්ව තක්සේරුකරණය, තොරතුරු තාක්ෂණය, පරිගණක විද්‍යාව, පරිගණක ඉංජිනේරු විද්‍යාව, පරිගණක තාක්ෂණය යන අදාළ විෂයයන් සහිත උපාධියක් ලබා ඇති අයදුම්කරුවන්ගෙන් තෝරාගනු ලැබේ. මෙම 10% පුරප්පාඩු සංඛ්‍යාවට අදාළව ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවකට අවශ්‍ය සුදුසුකම් සපුරාලිය නොහැකි වුවහොත් එම පුරප්පාඩු සංඛ්‍යාව ද සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන අනෙකුත් අයදුම්කරුවන්ගෙන් පුරවනු ලැබේ.

(iii). අයදුම්පත් කැඳවන අවස්ථාවේ දී අයදුම්කරුවන් තමන් ඉදිරිපත් වන විෂය ධාරාව අනුපිළිවෙළින් සටහන් කළ යුතු අතර, එම අනුපිළිවෙළ කිසිදු අවස්ථාවක වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

**14.** ඉහත 12 (ii) ඡේදයට අනුව සුදුසුකම්ලත් අපේක්ෂකයන්ගේ නම් ඇතුළත් ප්‍රතිඵල ලේඛනය විගණන සේවා කොමිෂන් සභාව වෙත ලබා දීමෙන් අනතුරුව විභාග කොමසාරිස් ජනරාල් විසින් අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව ප්‍රතිඵල දන්වා යැවීම තැපැල මගින් හෝ www.results.exams.gov.lk විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය ඔස්සේ සිදු කරනු ඇත.

**15.** ඉහත රෙගුලාසිවලින් ආවරණය නොවන කරුණු සම්බන්ධයෙන් මතු වන ගැටලු පිළිබඳ විගණන සේවා කොමිෂන් සභාවේ තීරණය අවසන් තීරණය වනු ඇත.

**16.** මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි අනුවාද අතර කිසියම් අනනුකූලතාවක් පවතී නම් සිංහල නිවේදනයේ ඇතුළත් කරුණු බලපවත්නේ ය.

**ඩී.කේ. විජේසිංහ,**
ලේකම්,
විගණන සේවා කොමිෂන් සභාව.

2026 සැප්තැම්බර් මස 11 වැනි දින,
විගණන සේවා කොමිෂන් සභාව,
අංක 415, කොටා පාර,
රාජගිරිය.

## පරිශිෂ්ටය 01

### ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ III පන්තියේ II ශ්‍රේණියට බඳවා ගැනීම (විවෘත) සඳහා පවත්වනු ලබන ලිඛිත තරග විභාගයෙහි විෂය නිර්දේශය

1. මෙම විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍ර හයකින් (06) සමන්විත වේ.

(අ) සාමාන්‍ය බුද්ධිය
(ආ) නිර්මාණාත්මක, විශ්ලේෂණාත්මක හා සන්නිවේදන කුසලතා
(ඇ) මූල්‍ය ගණකාධිකරණය
(ඈ) විගණනය
(ඉ) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අවබෝධය
(ඊ) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කළමනාකරණය සඳහා අභියෝග්‍යතාවය

**(අ) සාමාන්‍ය බුද්ධිය**

සංඛ්‍යාත්මක, භාෂාමය හා රූපාකාර ව්‍යුහයන් සහ අන්තර් සම්බන්ධතාවන්ට අදාළව ඉදිරිපත් කෙරෙන ගැටලු සම්බන්ධයෙන් විශ්ලේෂක කුසලතාව, තාර්කික අවබෝධය, අර්ථකථන හැකියාව, වෙනත් තත්ත්වයන්ට අදාළ කර ගැනීමේ හැකියාව හා නිගමනයන්ට එළඹීම සම්බන්ධව අපේක්ෂකයා සතු බුද්ධි මට්ටම මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.
**(කාලය පැය 1 ½ යි - ලකුණු 100 යි. මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ ප්‍රශ්න, කෙටි ප්‍රශ්න, ව්‍යුහගත රචනා ප්‍රශ්න හා රචනා ප්‍රශ්නවලින් සමන්විත වේ.)**

**(ආ) නිර්මාණාත්මක, විශ්ලේෂණාත්මක හා සන්නිවේදන කුසලතා**
දෙන ලද මාතෘකාවන් / තේමාවන් සමූහයක් අතුරින් අපේක්ෂකයා විසින් තෝරා ගනු ලබන මාතෘකාවන් / තේමාවන් ඔස්සේ අදහස් හා තොරතුරු විශ්ලේෂණය කිරීම, ගොනු කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අපේක්ෂකයා දක්වන තර්කන හා පරිකල්පන ශක්තිය මැන බැලීම මෙන්ම සංකීර්ණ ඡේදයක්, ලියවිල්ලක් හෝ සංදේශයක් වටහා ගැනීමට සහ එහි ඇති ප්‍රධාන අදහස් තමාගේම වචනයෙන් සාරාංශ වශයෙන් පැහැදිලිව හා නිවැරදිව ප්‍රකාශ කිරීම හෝ අපේක්ෂකයා සතු හැකියාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.
**(කාලය පැය 03 යි - ලකුණු 100 යි)**

**(ඇ) මූල්‍ය ගණකාධිකරණය**

(i) මූල්‍ය වාර්තාකරණය සඳහා අකෘතිමය රාමුව

මූල්‍ය වාර්තාකරණයේ අරමුණු, මූල්‍ය ප්‍රකාශනවල එක් එක් අංශවල අරමුණු, මූල්‍ය ප්‍රකාශනවල

මෘදුකාංග හඳුනා ගැනීම සහ මැනීම, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සලකා බලන උපකල්පන සහ ඒවායේ වැදගත්කම, මූල්‍ය ප්‍රකාශනවල ප්‍රධාන ගුණාංග සහ ගුණාංග වැඩිදියුණු කිරීම, ප්‍රාග්ධන නඩත්තු කිරීමේ සංකල්පය

(ii) නියාමන රාමුව

2007 අංක 07 දරන සමාගම් පනත අනුව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම, 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිත යටතේ ව්‍යාපාර සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාව.

(iii) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත

ගිණුම්කරණ ප්‍රමිතවල අවශ්‍යතාව, මූල්‍ය උපකරණ පිළිබඳ සරල අවබෝධය, කුඩා හා මධ්‍ය පරිමාණයේ ව්‍යාපාර ආයතන සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත පිළිබඳ මූලික තේරුම් ගැනීම.

(iv) වගකීම් සීමිත සමාගම්වල මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම.

(v) මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙල කිරීම

ප්‍රසිද්ධ කිරීමේ අරමුණු සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම.

(vi) මූල්‍ය ප්‍රකාශන විග්‍රහය

ගිණුම්කරණ අනුපාත ගණනය කිරීම, අනුපාත භාවිතයෙන් අස්ථිත්‍යයේ මූල්‍ය තත්ත්වය කාර්ය සාධනය සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව ඇතුළත් කරමින් කළමනාකරණයට සාරාංශ ගත වාර්තාවක් පිළියෙල කිරීම.

(vii) ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන

ගැලපිළි සමග ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම.
**(කාලය පැය 03 යි - ලකුණු 100 යි.)**

**(ඈ) විගණනය**

i. විගණනය

- ව්‍යාපාර පරිසරය

  විවිධ ව්‍යාපාර සංවිධාන වර්ග සහ ඒවායේ අරමුණු, ව්‍යාපාර සංවිධාන සඳහා බලපෑම් කරන බාහිර පරිසරය.

- යහපාලනය, අවදානම සහ අනුකූලතාව

  ව්‍යාපාර සංවිධානයක අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා බලපානු ලබන අවදානම්, අභ්‍යන්තර හා බාහිර ව්‍යාපාරික පාරිසරික අවදානම, අවදානම් කළමනාකරණය කිරීමේ රාමුවක මූලික මූලිකාංග, අවදානම් අඩුකර ගැනීමේ උපාය මාර්ගයන්, ආයතනික යහපාලනය, නියෝජිත්ව ප්‍රශ්න සහ විගණනයේ අවශ්‍යතාව.

- ව්‍යාපාර ක්‍රියා පටිපාටි සහ අභ්‍යන්තර පාලනයන්

  සංවිධානයක මූලික ව්‍යාපාරික ක්‍රියාපටිපාටි, අභ්‍යන්තර පාලනයන්, පාලනයන්ගේ අරමුණු, අභ්‍යන්තර පාලනයේ මූලිකාංග සහ, තොරතුරු තාක්ෂණික පොදු පාලනයන් හා මෘදුකාංග පාලනයන්, අභ්‍යන්තර පාලනයේ සීමාවන්.

- සහතිකවීමේ කාර්යභාරය සහ අදාළ සේවාවන්

  සහතිකකරණය, සීමිත සහතිකවීමේ කාර්යභාරය සහ සාධාරණ සහතිකවීමේ කාර්යභාරය, සහතිකවීමේ කාර්යභාරයේ මූලිකාංගයන්, කාර්යභාරය භාරගැනීම/ විගණනය පිළිගැනීම.

- විගණන ක්‍රියාවලිය

  විගණන අවදානම, මූල්‍ය ප්‍රකාශන සහතික කිරීම, මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීම පාලනය කිරීමේ පොදු මූලධර්ම, අස්ථිත්වය හා එහි පරිසරය හඳුනාගැනීම, අවදානම තක්සේරු කිරීම, පාලන පරීක්ෂාවන් හා ස්වාධීන ක්‍රියාපටිපාටි, වංචා පිළිබඳ අවදානම, ප්‍රමාණාත්මකභාවය, ප්‍රලේඛනගත කිරීම.

- විගණන සාක්ෂි

  විගණන සාක්ෂි, විගණන සාක්ෂි ලබාගැනීමේ විගණන ක්‍රියාපටිපාටි, විශ්ලේෂණාත්මක ක්‍රියාපටිපාටි, පරීක්ෂණ සඳහා අයිතමයන් තෝරා ගැනීම.

- විගණන වාර්තාව

  ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනවල බලපෑම ඇගයීම, විකරණය නොකළ විගණන වාර්තාව, විකරණය කළ විගණන වාර්තාව, කරුණු අවධාරණය කිරීම.

- මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා බලපානු ලබන ආචාරධර්ම අවශ්‍යතා
  සේවාදායකයා සහ සේවය භාර ගැනීම පිළිගැනීම, මූලික ආචාරධර්ම මූලයන්ට අනුකූලවීමේදී වෘත්තීය විගණකවරයෙකුට මුහුණදීමට සිදුවන අවදානම.

- විගණනයේ ගුණත්වය

  තත්ත්ව පාලන පද්ධතියක මූලිකාංග, මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා අවශ්‍ය වන තත්ත්ව පාලන අවශ්‍යතාවන්"

  **(කාලය පැය 03 යි - ලකුණු 100 යි. මෙම ප්‍රශ්න පත්‍රය රචනා ප්‍රශ්නවලින් සමන්විත වේ.)**

**(ඉ) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අවබෝධය**
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කළමනාකරණයේ පරිකල්පන හැකියාවන්, තොරතුරු තාක්ෂණ ගැටලු නිරාකරණය කිරීමේ හැකියාව, තොරතුරු තාක්ෂණ ව්‍යාපෘති කළමනාකරණ හැකියාව සහ දෙන ලද මාතෘකාවන් /තේමාවන් සඳහා පද්ධති විශ්ලේෂණය , සැලසුම්කරණය හා මෘදුකාංග පද්ධති හා වර්ධනය පිළිබඳ අපේක්ෂකයාගේ ශක්තිය මෙහිදී පරික්ෂණයට භාජනය කරනු ලැබේ.
ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.

**(කාලය පැය 2 ලකුණු 100)**

**(ඊ) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කළමනාකරණය සඳහා අභියෝග්‍යතාව**
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ප්‍රවණතා සහිතව මෘදුකාංග සංවර්ධනය, ස්ථාපනය හා නඩත්තු කටයුතු සම්බන්ධයෙන් වන දැනුම යොදා ගනිමින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කළමනාකරණය සඳහා අයදුම්කරුගේ අභියෝග්‍යතාව මැනීම සඳහා මෙම ප්‍රශ්න පත්‍රය සකස් කර ඇත. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.

**(කාලය පැය 2 ලකුණු 100)**

09 - 92

---

**මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව

## II ශ්‍රේණියේ රේගු පරීක්ෂක තනතුරට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2026

**ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ II ශ්‍රේණියේ රේගු පරීක්ෂක තනතුරට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය** සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ සඳහා වන අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ **www.doenets.lk** වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති "Online Applications (Recruitments/E.B. Exams)" ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම 2026 සැප්තැම්බර් මස 14 වැනි දින පෙ.ව. 09.00ට විවෘත වන අතර 2026 ඔක්තෝබර් මස 12 වැනි දින ප.ව. 09.00ට අවසන් වේ.

දැනට රාජ්‍ය / පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේ දී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.

අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරාගත යුතු ය.

මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් 2026 දෙසැම්බර් මාසයේ දී දිවයින පුරා පිහිටි පහත දැක්වෙන ප්‍රධාන නගරවල දී පමණක් පවත්වනු ලැබේ. විභාගය පවත්වන දිනය ඉදිරි කාලයේ දී විභාග කොමසාරිස් ජනරාල් විසින් දැනුම් දෙනු ඇත. විභාගය කල් දැමීමේ හෝ අවලංගු කිරීමේ බලය විභාග කොමසාරිස් ජනරාල් සතු වේ.

**විභාග මධ්‍යස්ථාන පිහිටුවනු ලබන නගර හා නගර අංක**

| *පළාත* | *නගරය* | *නගර අංක* |
|---|---|---|
| බස්නාහිර | කොළඹ | 01 |
| | ගම්පහ | 02 |
| | කළුතර | 03 |
| මධ්‍යම | මහනුවර | 04 |
| | මාතලේ | 05 |
| | නුවරඑළිය | 06 |
| දකුණු | ගාල්ල | 07 |
| | මාතර | 08 |
| | හම්බන්තොට | 09 |
| උතුරු | යාපනය | 10 |
| | මන්නාරම | 11 |
| | වවුනියාව | 12 |
| | මුලතිව් | 13 |
| | කිලිනොච්චිය | 14 |
| නැගෙනහිර | මඩකලපුව | 15 |
| | අම්පාර | 16 |
| | ත්‍රිකුණාමලය | 17 |
| වයඹ | කුරුණෑගල | 18 |
| | පුත්තලම | 19 |
| උතුරුමැද | අනුරාධපුරය | 20 |
| | පොළොන්නරුව | 21 |
| ඌව | බදුල්ල | 22 |
| | මොනරාගල | 23 |
| සබරගමුව | රත්නපුර | 24 |
| | කෑගල්ල | 25 |

කිසියම් නගරයක විභාග මධ්‍යස්ථානයක් පිහිටුවීමට තරම් ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම් කොට නොමැති නම් අයදුම්කරුගේ දෙවන තේරීම අනුව සඳහන් කර ඇති නගරයේ හෝ ආසන්න වෙනත් නගරයක විභාග මධ්‍යස්ථානයක් වෙත එම අයදුම්කරුවන්/අයදුම්කාරියන් යොමු කරනු ලැබේ. යෝජිත නගර සියල්ලෙහිම හෝ වැඩි ගණනක හෝ විභාග මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන්/අයදුම්කාරියන් සංඛ්‍යාවක් අයදුම්කොට නොමැති නම් විභාගය කොළඹ දී පමණක් පැවැත්වීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් කටයුතු කරනු ඇත. විභාගය ඉල්ලුම් කරනු ලබන නගර අයදුම්කරුවන්ගේ අවශ්‍යතාවට පසුව වෙනස් කරනු නොලැබේ.

මෙහි පහත සඳහන් සුදුසුකම් සතුව ඇති ස්ත්‍රී, පුරුෂ දෙපක්ෂයෙන්ම මෙම තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

**02. යෝග්‍යතාව :-**

I. සෑම අයදුම්කරුවකුම ඔහු / ඇය :-

(*අ*) ශ්‍රී ලංකා පුරවැසියකු බවත්,

(*ආ*) විශිෂ්ට චරිතයකින් යුතු අයකු බවත්,

(*ඇ*) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 24 ට නොවැඩි බවත්, පිළිගතහැකි සාක්ෂිවලින් ඔප්පු කළ යුතු ය. (ඒ අනුව වයස සම්බන්ධ සුදුසුකම සපුරාලනුයේ අයදුම්කරුගේ උපන් දිනය 2008.10.12 දින හෝ ඊට පෙර හා 2002.10.12 **දින හෝ ඊට පසුව යෙදී ඇත්නම් පමණි.)**

***සටහන 02 :*** **යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තකුට මෙම විභාගය සඳහා පෙනී සිටීමට අවසර නොමැත.**

II. **ශාරීරික යෝග්‍යතාව:-** පිරිමි අයදුම්කරුවකුගේ උස අඩි 5 අඟල් 5 ට අඩු නොවිය යුතු අතර, පපුව ප්‍රසාරණය කළ විට අඟල් 33 ට නොඅඩු විය යුතු ය.

ගැහැණු අයදුම්කාරියන්ගේ උස අඩි 5 අඟල් 3ට නොඅඩු විය යුතු ය.

III. **අධ්‍යාපන සුදුසුකම්:-** සෑම අයදුම්කරුවකුටම / අයදුම්කාරියකුටම පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් තිබිය යුතු ය.

**(*අ*) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී ප්‍රධාන විෂයයන් තුනකින් එකවර සමත්වීම:**

*සහ*

**(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ප්‍රධාන විෂයයන් වශයෙන් සිංහල/ දෙමළ භාෂාව, ගණිතය යන විෂයයන්ට සම්මාන සාමර්ථ්‍යයන් සහිතව සම්මාන සාමර්ථ්‍යයන් පහක් ද ඉංග්‍රීසි භාෂාවට අවම වශයෙන් සාමාන්‍ය සාමර්ථ්‍යයක් සහිතව දෙවතාවකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 06කින් සමත් විය යුතු ය.**

03. **සේවා කොන්දේසි :**

(I) මෙම තනතුරට අයත් ඒකාබද්ධ මාසික වැටුප් පරිමාණය පහත දැක්වේ.
රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 හි අනුව වැටුප් ක්‍රමය - RS - 1 දරන වැටුප් **කාණ්ඩයේ**,රු. 49,550-7 X 540-27 X 670 - රු. 71,420 වේ.)

(II) මෙම තනතුර ස්ථිර ය, විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත්විය යුතු ය.

(III) තෝරාගත් අයදුම්කරුවන්/ අයදුම්කාරියන් පත්වීමේ දින සිට තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලැබේ.

(IV) පත්වීම් ලබන්නන් විසින් තමන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව සුදුසු ද නැද්ද යන්න පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු ය.

(V) පත්වීම් ලබන්නන්ට දිවා රෑ දෙකේ දී ම සේවය කිරීමට සිදුවිය හැක. එමෙන් ම ඔවුන් දිවයිනේ ඕනෑම පළාතක සේවය කිරීමට ද බැඳී සිටිය යුතු ය.

(VI) මෙම *ගැසට්* පත්‍රයේ 1 වැනි කොටස (IIඅ) වැනි ඡේදයේ ආරම්භයේ පළකොට ඇති රාජ්‍ය සේවයේ තනතුරුවලට කෙරෙන පත්කිරීම්වලට අදාළ පොදු කොන්දේසිවලට ද අවධානය යොමු කෙරේ.

04. **විභාග පටිපාටිය: බඳවා ගැනීමේ විභාගය ප්‍රශ්න පත්‍ර 03 කින් සමන්විත වේ. ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ :**

| | | |
|---|---|---|
| **(01)** | අභියෝගාතාව (පැය 01 යි) | ලකුණු 100 යි |
| (02) | ගණිතය (පැය 01 යි) | ලකුණු 100 යි |
| (03) | ඉංග්‍රීසි භාෂාව (පැය 01 ½ යි ) | ලකුණු 100 යි |
| | *එකතුව* | *ලකුණු 300 යි* |

**අභියෝගාතාව ප්‍රශ්න පත්‍රය:** මෙම ප්‍රශ්න පත්‍රය අයදුම්කරුවන්ගේ / අයදුම්කාරියන්ගේ භාෂා ප්‍රවීණත්වය හා තර්කන ශක්තිය මැනීම සඳහා වන බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50 කින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.

**ගණිතය ප්‍රශ්න පත්‍රය :** අයදුම්කරුවන්ගේ / අයදුම්කාරියන්ගේ ගණිත හැකියාව මැනීම සඳහා සකස් වූවකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු යි. ව්‍යුහගත මාදිලියේ ප්‍රශ්නවලින් සමන්විත වේ.

**ඉංග්‍රීසි භාෂා ප්‍රශ්න පත්‍රය:** අයදුම්කරුවන්ගේ / අයදුම්කාරියන්ගේ, ඉංග්‍රීසි භාෂාව කියවීම, ලිවීම, අවබෝධය හා සන්නිවේදන හැකියාව පරීක්ෂා කිරීම සඳහා සකස් වූවකි.

*සටහන 03 :* **මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පවත්වනු ලැබේ. විභාගයට පෙනී සිටීමට මෙම නිවේදනයේ 02**(III) අනුව සුදුසුකම් ලබන විභාගයට තමන් පෙනී සිටි භාෂා මාධ්‍යයෙන්ම (එනම් සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යයෙන්) අයදුම්කරුවන් / අයදුම්කාරියන් පෙනී සිටිය යුතු ය. කෙසේවුව ද සුදුසුකම් ලැබීමේ විභාගයට දෙමළ මාධ්‍යයෙන් හෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පෙනී සිට සමත් වූ අයදුම්කරුවකුට / අයදුම්කාරියකුට *නැතහොත්* දෙමළ මාධ්‍යයෙන් හෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යාපනය ලද අයදුම්කරුවකුට / අයදුම්කාරියකට තමා කැමතිනම් මෙම විභාගයේ දී සිංහල භාෂා මාධ්‍යයෙන් පිළිතුරු සැපයීමට හැකිවේ. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

(I) නොපැහැදිලි අත් අකුරු සහ වැරදි අක්ෂර වින්‍යාසයට ද ලකුණු අඩු කරනු ලැබේ.

(II) විභාගයට පෙනී සිටීමට ප්‍රවේශ පත්‍ර ලැබීම, විභාගය සඳහා අවශ්‍ය **සුදුසුකම් සම්පූර්ණ කර තිබීමක් ලෙස නොසැලකිය යුතුය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අයදුම්කරුවන් යටත්වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.**

(III) **ඇගයීමේ ක්‍රමය:** විභාගය සමත්වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට ලබා ගත යුතු අවම ලකුණු ප්‍රමාණය 60%කි. එසේ ලබාගත් අයදුම්කරුවන් තෝරා ඔවුන්ගේ එම ලකුණුවල එකතුවට අනුව, පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් වන සංඛ්‍යාවක් වූ අයදුම්කරුවන්ගේ නම් ඇතුළත් විභාග අංක පිළිවෙලට / අකාරාදි පිළිවෙලට සකස් කළ ලේඛනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් රේගු අධ්‍යක්ෂ ජනරාල් ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව වෙත ලබාදෙනු ඇත. එම ලේඛනයේ සඳහන් අයදුම්කරුවන් / අයදුම්කාරියන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ම මූලික සුදුසුකම් පරීක්ෂා කරනු ලබන අතර ක්‍රීඩා කුසලතා සඳහා ලකුණු 10 ක් ලබා දෙනු ලැබේ. බඳවා ගැනීම් සිදුකරනු ලබන අවස්ථාවේ දී විභාගයේ දී ලබාගත් ලකුණු හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලබාගත් ලකුණු පමණක් සැලකිල්ලට ගනු ලබන අතර ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ක්‍රීඩා කුසලතා සඳහා විස්තරාත්මක ලකුණු පරිපාටිය අනුමත කිරීම පත් කිරීම් බලධරයා විසින් සිදුකරනු ඇත.

05. **තෝරා ගැනීමේ පදනම -** ලිඛිත විභාගයෙන් සමත් වූ හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් ලත් අයදුම්කරුවන් / අයදුම්කාරියන් අදාළ බඳවා ගැනීම සඳහා මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් අනුමත කර ඇති පුරප්පාඩු සංඛ්‍යාවට යටත්ව පත්වීම් පිරිනැමීම සඳහා තෝරා ගනු ලබන අතර, පුරප්පාඩුවලින් 10% කට නොවැඩි ප්‍රමාණයක් අයදුම්කාරියන් සඳහා වෙන් කෙරේ.

**(I) ප්‍රතිඵල නිකුත් කිරීම -** ලිඛිත පරීක්ෂණයෙන් සමත්ව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට සුදුසුකම් ලැබූ අයදුම්කරුවන්ගේ/ අයදුම්කාරියන්ගේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ ලකුණු ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ලබා දුන් පසු එම ලකුණු හා ලිඛිත විභාගයේ මුළු ලකුණු එකතු කිරීමෙන් අවසාන ප්‍රමුඛතා ලේඛනය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් සකස් කර රේගු අධ්‍යක්ෂ ජනරාල් , ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව වෙත ලබා දෙනු ඇත. ප්‍රමුඛතා ලේඛනය ඉදිරිපත් කිරීමත් සමඟ රේගු අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා රේගුව විසින් ප්‍රතිඵල නිකුත් කිරීමට සුදුසු දිනය දන්වා එවූ පසු ලිඛිත විභාගයෙන් එක් එක් විෂයයට ලබා ගත් ලකුණු / මුළු ලකුණු සඳහන් කළ ප්‍රතිඵල සටහනක් විභාගයට ඉදිරිපත් වූ සියලුම අයදුම්කරුවන් වෙත යැවීමට හෝ www.results.exams.gov.lk වෙබ් අඩවිය හරහා ප්‍රතිඵල නිකුත් කිරීමට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පියවර ගනු ඇත.

*සටහන 04 :* රේගු දෙපාර්තමේන්තුවේ රාජකාරි ස්වභාවය අනුව කාන්තා නිලධාරිනියන්ට ද සේවා මුර ක්‍රමය අනුව රාත්‍රී සේවා මුරයන්හි සේවය කිරීමට සිදුවනු ඇත.

**06.** **සෑම අයදුම්කරුවකුම/අයදුම්කාරියක්ම තනතුරට අදාළ සියලුම සුදුසුකම් විභාගය සඳහා අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.**

**07.** **ඉල්ලුම් කිරීමේ පිළිවෙළ :**

**(I)** මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු/ අයදුම්කාරිය විසින් මාර්ගගතව යොමු කරන ලද අයදුම්පත වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාරගන්නා ලද බව/ භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් (E-mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති පොදු උපදෙස් පත්‍රිකාව (Common Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේ දී මෙම උපදෙස් නිවැරදිව පිළිපදින්න. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රාජ්‍ය සේවයේ/රාජ්‍ය සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවයෙහි යෙදී සිටින අයදුම්කරුවන්/අයදුම්කාරියන් ආයතන ප්‍රධානියාගේ එකඟතාව ලබා ගැනීමෙන් අනතුරුව මෙම විභාගය සඳහා අයදුම් කළ යුතු අතර ලිඛිත විභාගයෙන් සමත්ව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවන අවස්ථාවේ දී ඔහු/ඇය දැනට දරන සේවයෙන් / තනතුරෙන් නිදහස් කළ හැකි බවට ආයතන ප්‍රධානියා විසින් සහතික කරන ලද ලිපියක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු ය.

**(II)** විභාග ගාස්තුව රු. 600/- කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතු ය.

(i.) ඕනෑම බැංකුවක ණය කාඩ්පතක් මගින් (Any bank credit card)

(ii.) මාර්ගගත ගෙවීම් පහසුකම් සක්‍රිය කර ඇති හර කාඩ්පතක් මගින් (Debit card with online payment facility)

(iii.) ලංකා බැංකු මාර්ගගත බැංකු ක්‍රමය/ Flex යෙදවුම මගින් (Online banking method / Flex App of Bank of Ceylon)

(iv.) ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Slip Payment Bank of Ceylon)

***සටහන 5 :*** ඉහත ක්‍රම මඟින් ගෙවීම් සිදුකරනු ලබන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළකර ඇත.

**(III)** ගෙවීම ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මඟින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මඟින් විභාග ගාස්තු ගෙවීමේ දී සිදු වන ප්‍රමාද දෝෂ සම්බන්ධයෙන් විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ. ඉහත ක්‍රම මඟින් ගෙවීම් සිදුකරනු ලබන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළකර ඇත.

**(IV)** විභාගය සඳහා ගෙවන මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීම හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීම සිදුකරනු නොලැබේ.

**(V)** විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතු ය. රජයේ සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ/ රජයේ සංස්ථාවක සේවයේ නියුතු අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා ද, එසේ නොවන අයදුම්කරුවකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයා, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියකු, රජයේ/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන්වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවා ගත යුතු ය.

***සටහන 06:*** ප්‍රවේශ පත්‍රය නොමැතිව විභාග ශාලාවට ඇතුළුවීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය ආරම්භවන දිනයේ විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ තම අත්සන සහතික

කරවා ගත් ප්‍රවේශ පත්‍රය පමණි. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට හෝ පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

08. **විභාග ප්‍රවේශ පත්‍ර -** *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව වෙබ් නිවේදනයක් මගින් / අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මගින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් වෙබ් නිවේදනයේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපත හා විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි ඡායා පිටපත ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතුය. විභාග ශාලාවේ දී / සම්මුඛ පරීක්ෂණයේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

***සටහන 07 :*** විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරුවකු/අයදුම්කාරියක විභාගයට පෙනී සිටීම සඳහා සියලු සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකේ.

**09. අනන්‍යතාව:** විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන ලේඛන පමණක් වලංගු වේ.

(I) ජාතික හැඳුනුම්පත,
(II) වලංගු විදේශ ගමන් බලපත්‍රය,
(III) වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව සනාථ කර ගත හැකිවන පරිදි මුහුණ ආවරණය කිරීමෙන් තොරව හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව සනාථ කරගත හැකිවන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. ඊට එකඟ නොවන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන්වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

**10. සුදුසුකම් පිළිබඳ ලියවිලි:**

(I) නියම කොට ඇති පරිදි, අවශ්‍ය සියලුම විස්තර අයදුම්පතෙහි සඳහන් කළ යුතු ය. මෙසේ අවශ්‍ය වන කරුණුවලින් සම්පූර්ණ නොවන අයදුම්පතක් වෙතොත් එය ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(II) සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට සුදුසුකම් ලබන අයදුම්කරුවන්/අයදුම්කාරියන් ලියවිලිවලින් සාක්ෂි ඉදිරිපත් කොට ස්වකීය යෝග්‍යතාව ඔප්පු කළ යුතු ය.

(III) සම්මුඛ පරීක්ෂණයේ දී පහත දැක්වෙන ලියවිලිවල මුල් පිටපත් අවශ්‍ය වේ.

(*අ*) යහපත් චරිතය පිළිබඳ වගකිව යුතු පුද්ගලයකු විසින් අත්සන් කරන ලද සහතිකයක්.

***සටහන 08:*** එම සහතිකය සාමදාන විනිශ්චයකාරවරයකු, නීතිඥවරයකු, පදිංචි කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්වරයා හෝ රජයේ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු, සාමාන්‍යයෙන් ප්‍රසිද්ධියක් දරන කෙලින්ම දන්වා තොරතුරු ලබාගත හැකි තැනැත්තකු යන මොවුන්ගෙන් කවරකුගෙන් වුව ද ලබාගත හැකිවේ. සහතිකය දෙන තැනැත්තාගේ පදවි නාමය, නම සහ ලිපිනය ද එහි පැහැදිලි ලෙස සඳහන්ව තිබිය යුතු ය. රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් උසුලන අයදුම්කරුවන්/අයදුම්කාරියන් විසින් යහපත් චරිතය පිළිබඳ සහතික ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.

(*ආ*) අයදුම්කරුගේ / අයදුම්කාරියගේ උප්පැන්නය ලියාපදිංචි කිරීමේ සටහනෙහි සහතික කළ පිටපතක් හෝ (උප්පැන්න ලියාපදිංචි නොකළ අයදුම්කරුවන්/අයදුම්කාරියන් සම්බන්ධයෙන් වූ විට) රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරන ලද වයස පිළිබඳ විශේෂ සහතිකයක්.

**සටහන 09:**

(i) පාඨශාලාවල භාවිතය සඳහා හෝ අධ්‍යාපනික කටයුතු උදෙසා නිකුත් කරන ලද විශේෂ

උප්පැන්න සහතික හෝ උප්පැන්න ලියාපදිංචි කිරීමේ සටහනෙන් උපුටා ගන්නා ලද සහතික පත්‍ර, උද්ධෘත භාරගනු නොලැබේ.

(ii) උප්පැන්න සහතිකය වෙනුවට දිවුරුම් පෙත්සම් හෝ බෞතිස්ම සහතික භාරගනු නොලැබේ. උප්පැන්න සහතිකයෙහි දැක්වෙන නම/නම් හා අයදුම්කරු / අයදුම්කාරිය සාමාන්‍යයෙන් භාවිත කරන එසේම ඔහු/ඇය විභාගයේදී පෙනී සිටින නම/නම් හා අතර වෙනසක් වේ නම් උචිත පරිදි උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (110 වැනි පරිච්ඡේදය) අංක 27 හෝ 28 දරන නියමයන් අනුව ස්වකීය උප්පැන්නයේ දැක්වෙන නම/නම් වෙනස් කරවා ගැනීමට වහාම කටයුතු කළ යුතු ය.

(iii) ශ්‍රී ලංකාවේ පුරවැසියකු වශයෙන් ලියාපදිංචි වීමේ සහතිකයක් හෝ පරම්පරාවෙන් හිමිවූ පුරවැසි බවක් ඇති බැව් රජය මගින් පිළිගත් බව දැක්වෙන ලිපියක් (උචිත පරිදි);

(iv) අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ මුල් සහතිකයක් හෝ එසේ සහතිකයක් නිකුත් කොට නැත්නම් ඊට අදාළ වූ වෙනත් රාජකාරි ලියවිලි;

(v) කලාප/දිස්ත්‍රික්/ජාතික මට්ටමේ ක්‍රීඩා තරගවල දී දැක්වූ කුසලතා සම්බන්ධ ලේඛන;

(vi) අයදුම්පත ඉදිරිපත් කරන ලද අවස්ථාවේ දී අවශ්‍ය සියලුම ලියකියවිලි සූදානම් කොට තබා ගන්නා ලෙස අයදුම්කරුවන්ට අවවාද කරනු ලැබේ. ඉල්ලා සිටි විටෙක අවශ්‍ය ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන හෝ ඒවා ඉදිරිපත් කිරීමට ප්‍රමාද කරන අයදුම්කරුවකු/අයදුම්කාරියක වෙතොත් ඔහු/ඇය මෙම තනතුරට පත් කිරීමට නුසුදුස්සකු කරනු ලැබේ.

**11. සාවද්‍ය තොරතුරු සැපයීම -** මෙම විභාගයේ රෙගුලාසි අනුව කිසියම් අයදුම්කරුවකුට ඊට පෙනී සිටීමට සුදුසුකම් නැති බව පෙනී ගියහොත් විභාගයට පෙරාතුව හෝ එය පවත්වද්දී හෝ ඉන්පසුව හෝ කවර අවස්ථාවකදී වුව ද ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකිය. අයදුම්කරුවකු/අයදුම්කාරියක විසින් දැන දැනම සාවද්‍ය තොරතුරක් සපයා ඇති බවක් හෝ කිසියම් වැදගත් කරුණක් දැන දැනම වසන් කළ බවක් හෝ පෙනී ගියහොත් හෝ ඔහු/ඇය මෙම විභාගයට පෙනී සිටීමට නුසුදුස්සකුව සිටි බව ඔහුගේ/ඇයගේ සේවා කාලය තුළ කිසියම් අවස්ථාවකදී ඔප්පු වුවහොත් හෝ එයම ඔහු/ඇය වහාම සේවයෙන් පහ කිරීමට හේතු වනු ඇත. මෙම නිවේදනයේ සඳහන් අවශ්‍යතා නියමිත අයුරින් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ/අයදුම්කාරියන්ගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

12. මෙම රෙගුලාසිවලින් විස්තර නොකරන ලද අදාළ වූ වෙනයම් කරුණක් වේ නම් එය රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අභිමතය පරිදි තීරණය කරනු ඇත.

13. මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය නිවේදන අතර කිසියම් අනනුකූලතාවක් පැන නැගුනහොත් එවැනි විටෙකදී සිංහල මාධ්‍ය නිවේදනය බල පැවැත්වේ.

රේගු අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව.

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව,
රේගු මන්දිරය,
අංක. 40,
කෙළින් වීදිය,
කොළඹ 11.

09 - 99/1

---

### මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව

### II ශ්‍රේණියේ රේගු පරීක්ෂක තනතුරට බඳවා ගැනීම සඳහා පැවැත්වෙන සීමිත තරග විභාගය - 2026

II ශ්‍රේණියේ රේගු පරීක්ෂක තනතුරු පුරප්පාඩුවලින් 50% ක් පිරවීම සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති, II ශ්‍රේණියේ රේගු නියාමකවරුන්ගෙන් මාර්ගගතව අයදුම්පත් කැඳවනු ලැබේ.

01. සුදුසුකම්

1.1 වෘත්තීය සුදුසුකම් :

(i.) රේගු නියාමක තනතුරේ II ශ්‍රේණියේ නිලධරයකු වීම.

(ii.) පූර්වාසන්න වසර 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් තිබීම සහ එම කාලය තුළ වැටුප් වර්ධක සියල්ල උපයාගෙන තිබීම.

(iii.) අනුමත කාර්යසාධන ඇගයීමේ පටිපාටිය අනුව, උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර පහක් (05ක්) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.

(iv.) රේගු නියාමක තනතුරේ II ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණවලින් සමත් වී තිබීම.

*1.2 පළපුරුද්ද :*

II ශ්‍රේණියේ රේගු නියාමකවරයකු ලෙස අවම වශයෙන් එම ශ්‍රේණියේ වසර 03ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

*සටහන-*
2026.12.31 දින දක්වා පහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධාරින් සීමිත ධාරාව යටතේ බඳවා ගනු ලැබේ.

(i) රේගු නියාමක තනතුරේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර අටක (08) සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු ය.

(ii) පත්වීම ස්ථිර කර තිබිය යුතු ය.

(iii) රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2020 අනුව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතු ය.

(iv) වැටුප් වර්ධක අටක් (08) උපයාගෙන තිබීම හා අනුමත කාර්යසාධන ඇගයීම් පටිපාටිය අනුව වසර අටක (08) සතුටුදායක මට්ටමේ හෝ ඉන් ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබිය යුතු ය.

(v) අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබිය යුතු ය.

(vi) අදාළ රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගෙන තිබිය යුතු ය.

*1.3 වෙනත් :*

(i) රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 අනුව නියමිත කාලසීමාව තුළ විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම.

(ii) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය ඉහත 01 හි දක්වා ඇති සුදුසුකම් විභාගය සඳහා අයදුම්පත් භාර ගන්නා 2026.10.12 දිනට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

02. අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ “Our Services” යටතේ ඇති “Online Applications – (Recruitment /E.B. Exams)” ඔස්සේ පළ කර ඇති අතර, අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2026 සැප්තැම්බර් මස 14 වැනි දින පෙ.ව. 09.00 ට විවෘත වන අතර 2026 ඔක්තෝබර් මස 12 වැනි දින ප.ව. 09.00 ට අවසන් වේ.**

නිලධාරින් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේදී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.

අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරාගත යුතු ය.

මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේ දී මෙම උපදෙස් නිවැරදිව පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. විභාග ගාස්තුව රු. 600/-කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතු ය.

(i) ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card),

(ii) අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Card with the Facility of Internet Transactions)

(iii) ලංකා බැංකු මාර්ගගත බැංකු ක්‍රමය/Flex යෙදවුම මගින් (Online Banking Method / Flex App of Bank of Ceylon)

(iv) ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Any Branch of the Bank of Ceylon)

*සටහන:-*

(අ) ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදුකරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

(ආ) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේදී සිදු වන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(ඇ) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ සිදු කරනු නොලැබේ.

04. මෙම විභාගය ලිඛිත විභාගය හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය වශයෙන් කොටස් දෙකකින් සමන්විත වේ. ලිඛිත විභාගයේ එක් එක් විෂයයට පිරිනමනු ලබන ලකුණු ප්‍රමාණය, ලැබෙන කාලය පහත දැක්වේ.

**1. වැනි කොටස - ලිඛිත විභාගය**

| | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| සිද්ධි අධ්‍යයනය (පැය 02 යි) | 100 | 50 |

**2. වැනි කොටස - සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය (ලකුණු ලබා දෙනු නොලැබේ.)**

තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය මූලික සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කිරීම සඳහා ලිඛිත විභාගය සමත් අදාළ සුදුසුකම් සම්පූර්ණ කරන ලද අපේක්ෂකයන්ගේ ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව තනතුරේ පුරප්පාඩු සංඛ්‍යාවට සමාන අපේක්ෂකයන් සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවා සුදුසුකම් සනාථ කර ගැනීමෙන් පසු බඳවා ගනු ලැබේ.

විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා මාධ්‍ය තුනෙන් ම පවත්වනු ලැබේ. අයදුම්කරුවකු/ අයදුම්කාරියක විසින් මුළු විභාගයට ම පෙනී සිටිය යුත්තේ එකම භාෂා මාධ්‍යයකිනි. අයදුම්පත් ඉදිරිපත් කිරීමෙන් පසු භාෂා මාධ්‍යයේ වෙනසක් සිදු කිරීමට ඉඩ දෙනු නොලැබේ. අයදුම්කරුවන්/ අයදුම්කාරියන් තමන් එම සේවයට ඇතුළත්වීමට සුදුසුකම් ලැබූ භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කළ හැක.

**05. මෙම විභාගයේ සිද්ධි අධ්‍යයනය විෂයයට අදාළ විෂය නිර්දේශ පත්‍රය පහත දැක්වේ.**

1. ආනයන හා අපනයන කටයුතු සඳහා වරාය, අපනයන සැකසුම් කලාප හා ගුවන්තොටුපලයන්හි පවත්වාගෙන යනු ලබන වෙනත් රේගු පරිශ්‍ර ගේට්ටුවලින් ඇතුළුවන හා පිටවන වාහන, පුද්ගලයන්, මගීන් හා ගමන් බඩු පිළිබඳව පරීක්ෂාව,

2. රේගු කාර්යාල, වරාය, ගුවන්තොටුපල, අපනයන සැකසුම් කලාප හා අනෙකුත් රේගු පරිශ්‍රයන්හි හා රේගු ගුදම් හා බැඳි ගුදම්වල තැන්පත් කිරීම සඳහා ගෙනඑන හා රේගු නිෂ්කාශනයෙන් පසු මුදාහරින බඩු තැන්පත් කිරීම, නිදහස් කිරීම, ඒවාට අදාළ ලිපි ලේඛන ලේඛනගත කිරීම එම ලේඛන සුරක්ෂිත කිරීම,

3. යතුරු රාජකාරි කටයුතු,

4. ක්‍රියාන්විත, වැටලීම් සහ අත්අඩංගුවට ගැනීම්,

5. රේගුවේ රඳවා ගන්නා අත්අඩංගුවට ගන්නා, රාජසන්තක කරන භාණ්ඩ, බහාලුම් සහ ඒවාට අදාළ ලිපි ලේඛන,

6. තීරු ගාස්තු හා අනිකුත් රේගු ගාස්තු නොගෙවන ලද භාණ්ඩ රේගු දෙපාර්තමේන්තුව වෙනුවෙන් සිය සුපරීක්ෂාකාරිත්වය යටතේ රැගෙන ගොස් භාර දීම,

යන ඉහත දැක්වෙන රාජකාරි කටයුතු ගැන විශේෂ අවධානය ඇතිව, රේගු පරීක්ෂක රාජකාරි කටයුතු හා සම්බන්ධ ක්‍රියා පරිපාටීන් පදනම් කොට ගෙන සැකසෙන සිද්ධි අධ්‍යනයන් (Case studies) අඩංගු ලිඛිත පරීක්ෂණයක් මගින් දැනුම පරීක්ෂා කෙරේ.

06. 6.1 සිද්ධි අධ්‍යයනය විෂයයට අවම වශයෙන් ලකුණු 50ක් ලබා ගන්නා අයදුම්කරුවන්/ අයදුම්කාරියන් සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට සුදුසුකම් ලබන්නේය.

ලිඛිත විභාගයෙන් සමත් වූ හා සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් ලත් අයදුම්කරුවන් / අයදුම්කාරියන් අදාළ බඳවා ගැනීම සඳහා අනුමත කර ඇති පුරප්පාඩු සංඛ්‍යාවට යටත්ව පත්වීම් පිරිනැමීම සඳහා තෝරා ගනු ලබන අතර, බඳවා ගැනීමට අනුමත පුරප්පාඩු සංඛ්‍යාවෙන් 10% කට නොවැඩි ප්‍රමාණයක් කාන්තා නිලධාරිනියන් සඳහා වෙන් කෙරේ.

*6.2 ප්‍රතිඵල නිකුත් කිරීම :*

ඉහත 6.1 ඡේදයට අනුව සුදුසුකම් ලබන අයදුම්කරුවන්ගේ/ අයදුම්කාරියන්ගේ නම් ඇතුළත්

ප්‍රතිඵල ලේඛනය රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලබා දෙනු ඇත. රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලද පසු විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන්/ අයදුම්කාරියන් වෙත තැපැල් මගින් හෝ www.results.exams.gov.lk නිල වෙබ් අඩවිය හරහා හෝ ප්‍රතිඵල දැනුම් දීම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් සිදු කෙරේ.

6.3 *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව වෙබ් නිවේදනයක් මගින්/ අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මගින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් වෙබ් නිවේදනයේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි ඡායා පිටපත ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතුය. විභාග ශාලාවේ දී/ සම්මුඛ පරීක්ෂණයේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

6.4 අයදුම්කරුවකු/ අයදුම්කාරියක තමාට නියම කර ඇති විභාග ශාලාවේදී නියමිත විභාග අංකය යටතේ විභාගයට පෙනී සිටිය යුතු ය. විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවකු/ අයදුම්කාරියක්ම විභාගයේ පළමු දින තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපති වෙත භාරදිය යුතු ය. ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අයදුම්කරුවකුට/ අයදුම්කාරියකට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

07. විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන ලේඛන පමණක් වලංගු වේ.

I. ජාතික හැඳුනුම්පත,
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය,
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව සනාථ කර ගත හැකි වන පරිදි මුහුණ ආවරණය කිරීමෙන් තොරව හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව සනාථ කර ගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. ඊට එකඟ නොවන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

08. 8.1 අයදුම්කරුවකුට/ අයදුම්කාරියකට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

8.2 මෙම විභාගය පවත්වනුයේ කොළඹ දී පමණි. විභාගය පවත්වන දිනය හා ස්ථානය පසුව දන්වනු ලැබේ.

09. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අයදුම්කරුවන්/ අයදුම්කාරියන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදු වනු ඇත. විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වේ.

10. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය ගැසට් නිවේදනය බලපැවැත් වේ. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධව රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ඇත.

රේගු අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව.

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව,
රේගු මන්දිරය,
අංක 40,
කෙළින් වීදිය,
කොළඹ 11.

09 - 99/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.